


# අනපේක්ෂිත හෝ ක්ෂණික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ දී සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන අභියෝග

(2023 අප්‍රේල්)

LAW & SOCIETY TRUST

# අනපේක්ෂිත හෝ ක්ෂණික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ දී සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන අභියෝග

(2023 අප්‍රේල්)

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

අනපේක්ෂිත හෝ ක්ෂණික ප්‍රවණ්ඩත්වයට
ප්‍රතිචාර දැක්වීමේ දී සිවිල් සමාජ
සංවිධාන මුහුණ දෙන අභියෝග
(2023 අප්‍රේල්)

© නීතිය හා සමාජ භාරය

පළමු මුද්‍රණය : 2023 ජූලි

ISBN 978-624-5545-21-6

පිටු සැකසුම
රසික ගුණවර්ධන

කවර සැකසුම
රසික ගුණවර්ධන

මුද්‍රණය
ඩිරෙක්ට් ප්‍රින්ටර්ස්

ප්‍රකාශනය

නීතිය හා සමාජ භාරය,
03, කිංසි ටෙරස්, කොළඹ 08
දුරකතන : 94 11 2684845 | 94 11 2691228 | 94 11 2684853
ෆැක්ස් : 94 11 2686843
ඊමේල් : info@lstlanka.org
වෙබ් : https://www.lstlanka.org

# පටුන


ස්තුතිය 5

කෙටි යෙදුම් 6

විධායක සාරාංශය 7

හැඳින්වීම සහ දළ විස්තරය 8

ක්‍රමවේදය 10
දත්තමූලය 10
පර්යේෂණ පාරාමිති 11
ප්‍රශ්නාවලිය 12
අහඹු නියැදිකරණය 12
දත්ත වගුගත කිරීම 14
ගුණාත්මක දත්ත 15

ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය 15

ගුණාත්මක දත්ත විශ්ලේෂණය 28
මඩකලපුවේ රාජ්‍ය නොවන සංවිධාන 28
රා.නො.සං. දිස්ත්‍රික් සම්බන්ධීකාරකයින් 33

විශ්ලේෂණය 35

නිර්දේශ 39

ප්‍රතිපත්ති රාමුව 43

සමාප්තිය 46

ග්‍රන්ථ නාමාවලිය 47

1 ඇමුණුම: සමීක්ෂණ ප්‍රශ්නාවලිය 50

# ස්තුතිය

බොහෝ දෙනෙකුගේ පරිත්‍යාගශීලී දායකත්වය නොලැබිණි නම් මේ ප්‍රකාශනය පල කිරීම කළ නොහැක්කක් වනු ඇත. සමීක්ෂණ ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීම සඳහා තම කාර්යබහුල දිනචර්යාවෙන් කාලය වෙන් කළ සියළුම සිවිල් සමාජ සංවිධාන වෙත තුති පල කිරීමට පර්යේෂණ කණ්ඩායම මෙය අවස්ථාව කරගනු ලැබේ. ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම සඳහා මිනිත්තු 20ක් 30 ක් පමණ වැය කළ සංවිධාන 150කට අධික සංඛ්‍යාවකින් ලැබුණු තොරතුරු මේ පර්යේෂණය සම්පූර්ණ කිරීම සඳහා ඉතාමත් වැදගත් විය. පර්යේෂණයේ ගුණාත්මක අංගය සඳහා තොරතුරු රැස් කරන්නට අප මඩකලපුවේදී හමු වූ සිවිල් සමාජ සංවිධානවලට ද පර්යේෂණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට තම කාලයෙන් පැය කිහිපය බැගින් මිඩංගු කළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන්ට ද අපි ස්තුති කරන්නෙමු. ප්‍රමාණාත්මක දත්ත කියවා අවබෝධ කරගැනීමටත් සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණයකට ලක් කිරීමටත් සහය ලබාදෙන ලද්දේ ආචාර්ය නිලංග අබේසිංහ විසිනි. එමෙන්ම, සිවිල් සමාජ සංවිධාන මෙම පර්යේෂණ කටයුත්ත සඳහා සම්බන්ධ කරගැනීමට කඩිසරව වෙහෙසුනු පර්යේෂණ සීමාවාසිකයින්ට ද අපේ ස්තුතිය හිමි වේ. මේ පර්යේෂණ කටයුත්ත සම්පූර්ණ කර කෙටි කලකින් ඛේදජනක ලෙස අපට අහිමි වූ දක්ෂතම පර්යේෂණ සීමාවාසිකයකු වූ චතුරි මල්ලිකාරච්චි මෙනවියගේ පවුලේ සාමාජිකයින් වෙත අපගේ හෘදයාංගම ශෝකය පල කිරීමට ද මෙය අවස්ථාව කරගන්නෙමු.

# කෙටි යෙදුම්

ADB - ආසියානු සංවර්ධන බැංකුව

CSO - සිවිල් සමාජ සංවිධාන

NGO - රාජ්‍ය නොවන සංවිධාන

INGO - ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන

DS - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

LST – නීතිය හා සමාජ භාරය

OECD - ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානය

DO – සංවර්ධන නිලධාරි

PTA – ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත

ATA – ප්‍රති-ත්‍රස්ත පනත

# විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන සම්බන්ධයෙන් බොහෝ පර්යේෂණ සහ ලියවිලි සම්පාදනය වී ඇතත් අනපේක්ෂිත හෝ ක්ෂණික ප්‍රචණ්ඩත්වය හමුවේ සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන අභියෝග සම්බන්ධයෙන් විශේෂයෙන් සිදු කෙරුනු පර්යේෂණ ඇත්නම් ඒ ඉතාමත් ස්වල්පයක් වේ. එහි අර්ථය නම්, මේ විශේෂිත මාතෘකාව සම්බන්ධයෙන් පෙර එක් කළ දත්ත හෝ ලියවිලි අධ්‍යනය කිරීම සඳහා පර්යේෂකයින්ට ඉඩක් නොතිබුණු බවයි. කෙසේනමුත් එය, මෙම පර්යේෂණ කටයුත්ත සංකල්පීකරණය කර මෙහෙයවීම සඳහා පර්යේෂණ කණ්ඩායම වෙත 'හිස් කඩදසියක්' සපයා දෙන ලදී.

වඩාත් නිවැරදිව දත්ත එකතු කරගැනීමේ අරමුණ ඇතිව, දිස්ත්‍රික්ක හෝ පළාත් කිහිපයක් නියැදි වශයෙන් ගැනීම වෙනුවට සිවිල් සමාජ සංවිධාන සම්බන්ධයෙන් දීපව්‍යාප්ත මට්ටමින් සමීක්ෂණය කිරීමට පර්යේෂණ කණ්ඩායම තීරණය කරන ලදී. ඒ අන්දමින් දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කළ බැවින් වඩාත්ම ඉහළ සිවිල් සමාජ සම්බන්ධවීමක් ඇත්තේ මඩකලපුවේ බවත් සිවිල් සමාජ සම්බන්ධවීම අඩුවෙන්ම ඇත්තේ පොලොන්නරුවේ බවත් හඳුනාගැනීමට අපට ඉඩ සැලසුනි. කෙසේනමුත්, සංක්ෂිප්තභාවය සහ වඩාත් පැහැදිලිව දෘශ්‍ය නිරූපණයක් ඉදිරිපත් කිරීම සඳහා මෙම වාර්තාවේ අවධාරණය කර ඇත්තේ දිස්ත්‍රික්ක පහක් සම්බන්ධයෙන් වේ. මඩකලපුව හැරුණුවිට අනෙකුත් දිස්ත්‍රික්ක හතර තෝරාගනු ලැබුවේ ඒවා සමස්ථ ව්‍යාපෘතිය තුළ අවධානය යොමු වූ ප්‍රදේශ යන පදනමිනි. තෝරාගත් මෙම දිස්ත්‍රික්ක බහුතර සහ සුළුතර ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය කරන, එමෙන්ම දිවයිනේ උතුර, දකුණ, නැගෙනහිර සහ බස්නාහිර ආවරණය කෙරෙන ප්‍රදේශ වේ.

අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන විවිධ අභියෝග, එමෙන්ම බාහිර ගැටලු, උදාහරණ වශයෙන්, සිවිල් සමාජ සංවිධාන වැඩ කරන ප්‍රාදේශීය රජයේ ආයතන හා අමාත්‍යාංශ හා ප්‍රජාවන් සම්බන්ධයෙන් සහ, සම්පත් හිඟය වැනි අභ්‍යන්තර ගැටළු සම්බන්ධයෙන් මේ පර්යේෂණය තුළ ගවේෂණය කෙරේ. සමීක්ෂණයක් හරහා එකතු කරන ලද එම දත්ත ප්‍රස්තාර හරහා විශ්ලේෂණය සඳහා ඉදිරිපත් කර තිබේ. එසේම ගුණාත්මක දත්ත වඩාත් සවිස්තරාත්මකව ගවේෂණය සඳහා මෙම වාර්තාවේ ගුණාත්මක පර්යේෂණ අංගයක් ද ඇතුළත් ය. ඒ හරහා ද සිවිල් සමාජ සංවිධාන රාජ්‍යය සලකනු ලබන දෘෂ්ටිකෝණය අවබෝධ කරගැනීම අරමුණු කරගෙන ඇති අතර ඒ සියල්ල අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ක්‍රියාකාරකම් කේන්ද්‍රකරගනිමින් සිදුකර තිබේ.

'සිවිල් සමාජ සංවිධාන' සහ 'අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය' නිර්වචනය කිරීමේදී පර්යේෂණ කණ්ඩායම මුහුණ දුන් අභියෝග සහ ඒවා විසඳගත් අන්දම පිළිබඳ විස්තරාත්මක පැහැදිලිකිරීමක්, එමෙන්ම පර්යේෂණයේ ගුණාත්මක දත්තවලින් සොයාගත් කරුණු හා විශ්ලේෂණය, පාදම් සමීක්ෂණය සම්බන්ධයෙන් වඩාත් ගැඹුරු අවබෝධයක් ලබාදෙන ගුණාත්මක දත්තවලින් සොයාගත් කරුණු හා විශ්ලේෂණය මෙම වාර්තාවට ඇතුළත් ය.

# හැඳින්වීම සහ දළ විස්තරය

සිවිල් සමාජ සංවිධාන යනු ප්‍රධාන වශයෙන්ම සිවිල් වැසියල්, එනම් රාජ්‍යයේ කොටසක් නොවන මහජනයා විසින් සමාජයේ ඇති යම් කෘත්‍යාත්මක අවශ්‍යතාවයක් සපුරාගැනීම සඳහා එක්ව සාදගන්නා විධිමත් හෝ අවිධිමත් සංවිධාන වේ. කෙසේනමුත්, යම් යම් කණ්ඩායම් හෝ මෙම සංවිධාන සිදුකරන ඇතැම් කාර්යයන් ඇතුළත් කරගන්නා නැතහොත් බැහැර කරන්නා වූ විවිධ නිර්වචන මේ සම්බන්ධයෙන් පවතියි.

උදාහරණ වශයෙන්, පහත නිර්වචනය තුළ වෘත්තීය සමිති ඇතුළත් කර නොමැත:

> *පුණ්‍යායතන, උද්දේශන කණ්ඩායම්, ප්‍රජා සංවිධාන, ආගම් පාදක කණ්ඩායම්, සහ වෘත්තීය සංගම් යනාදී විවිධ ස්වරූපවලින් සිවිල් සමාජ සංවිධාන පවතියි. උද්දේශනය, මහජනයා දැනුවත් කිරීම, පර්යේෂණ, සේවා සැපයීම, සහ සාමූහික ක්‍රියාමාර්ග සඳහා පුරවැසියන් ඒකරාශී කර මෙහෙයවීම වැනි ක්‍රියාකාරකම් පරාසයක නිරතවීම හරහා වඩාත් සාධාරණ සහ යුක්තිසහගත සමාජයක් නිර්මාණය කිරීම සඳහා සමාජ වෙනසක් ප්‍රවර්ධනය කිරීමට මෙම සංවිධාන කටයුතු කරනු ලැබේ. (ඒ.ඩී.බී. 2022)*

අනෙක් අතට, පහත නිර්වචනය තුළ වෘත්තීය සමිති ඇතුළත් කර ඇත:

> *වෘත්තීය සමිති, සේවක සංගම් සහ අනෙකුත් සමාජ සංවිධාන, එනම් සිවිල් සමාජ සංවිධාන, දේශපාලන න්‍යායපත්‍රය නියම කරගැනීමෙහි ලා සක්‍රිය භූමිකාවක් නිරූපණය කිරීමට පුරවැසියාට ඉඩ සලසාලයි. යුරෝපීය සංගමයේ සාමාජිකයකු වීමට අපේක්ෂා කරන රටකට ශක්තිමත් සිවිල් සමාජයක් පැවතීම යුරෝපීය සංගම් සාමාජිකත්වය ගැනීමේ කොන්දේසි සපුරාගැනීම සඳහා දායක වේ (යුරෝපීය කොමිසම)*

මෙම පර්යේෂණය තුළ සිවිල් සමාජ සංවිධාන නිර්වචනය කිරීමේදී සලකා බැලූ අනෙකුත් පැතිකඩ නම්, විදේශ රාජ්‍යවල සංවර්ධන ක්ෂේත්‍රය භාර ජාත්‍යන්තර සංවිධාන මීට ඇතුළත් කළයුතුද යන්නයි. පොදු යහපත තකා ඔවුන් ලබාදෙන දායකත්වය මෙන්ම ඔවුන්ගේ මෙහෙවර ඉටුකිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන ආධාර මුදල් සහ ස්වේච්ඡා සේවක සහය මත යැපේ. ශ්‍රී ලංකාවේ බොහෝ සිවිල් සමාජ සංවිධාන විශාල ජාත්‍යන්තර ආධාර ආයතනවලින් සහ රජයන්ගෙන් අරමුදල් ලබයි. ඉහත දෙවැනියට සඳහන් කළ අන්දමින් ආධාර ලබන ඇතැම් ආයතන සැබැවින්ම 'රාජ්‍ය-නොවන' සංවිධාන වේ ද යන්න වාදයට ගත හැකි කරුණක් වේ (ගුණතිලක, 2006). අනෙක් අතට, රජයන් (ඒවායේ ක්‍රියා සහ ප්‍රතිපත්ති) සහ නිල ආධාර ලබදෙන්නන් අතර ඇතිවන මතවාදීමය සංවාද යම් සිවිල් සමාජ සංවිධානයක ඵලදායීත්වය කෙරෙහි බලපෑමක් ඇති කරයි (ඕඊසීඩී, 2009). අප යූඑස් ඒඩ් වැනි විදේශ ධූත මෙහෙවර හෝ විදේශ රාජ්‍ය සංවිධාන මීට ඇතුළත් නොකළේ එබැවිනි. කෙසේනමුත්, මෙම සමීක්ෂණයට සහභාගි වූ ඇතැම් සංවිධාන විදේශ රාජ්‍යවල ධූතමෙහෙවරයන්ගෙන් අරමුදල් ලබන බව සැලකිල්ලට ගත යුතුය.

සිවිල් සමාජ සංවිධාන ක්‍රියාත්මකවීම හා බැඳුනු මේ සංකීර්ණත්වය සමගින්, අප මුහුණ දුන් පළමු අභියෝගය වූයේ සිවිල් සමාජ සංවිධාන නිර්වචනය කිරීමයි. අපට සිතාබලන්නට වූ තවත් එක් නිර්ණායකයක් වූයේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මීට ඇතුළත් කළයුතු ද යන්නයි. අවසානයේ දී, එක්සත් ජාතීන්ගේ සංවිධානය සිවිල් සමාජ සංවිධාන සඳහා දී ඇති නිර්වචනය භාවිතා කරන්නට අපි තීරණය කළෙමු:

> *ලාභ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක නොවන, ඕනෑම ස්වේච්ඡා පුරවැසි කණ්ඩායමක් සිවිල් සමාජ සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර, මේවා ප්‍රාදේශීය, ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමින් සංවිධානය වී තිබිය හැක. කාර්යයන් දිශානත කරගත්, එමෙන්ම පොදු ලැදියාවක් සහිත පුද්ගලයින් විසින් ඉදිරියට ගෙන යනු ලබන මෙම සිවිල් සමාජ සංවිධාන විවිධාකාර සේවාවන් සැපයීම හා මානුෂීය කාර්යයන ඉටුකිරීම, පුරවැසියන් සැලකිල්ල යොමුකරන කරුණු රජයන් වෙත ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති පිළිබඳ විමසිලිමත්වීම සහ ප්‍රජා මට්ටමින් දේශපාලන සහභාගීත්වය දිරිගැන්වීමෙහි නිරත වේ (එක්සත් ජාතීන්ගේ සංවිධානය, දින යොදා නොමැත).*

කෙසේනමුත්, අප සම්බන්ධ කරගත් බොහෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන තමන් සිවිල් සමාජ සංවිධාන නොවන බැවි සඳහන් කරමින් පර්යේෂණයට සහභාගිවීම ප්‍රතික්ෂේප කළහ. එවන් ආයතන කිහිපයක් පර්යේෂණයට

සහභාගි වූහ. අප එකතුකළ දත්ත විකෘතිවීමක් මේ හරහා සිදු නොවුනු නමුත්, සිවිල් සමාජ සංවිධාන සම්බන්ධයෙන් පොදුවේ පිළිගත් නිර්වචනයක් නොමැතිබව අවධානයට ගතහැකි කරුණකි. මේ හරහා අපට ඇතිවූ එකම අවාසිය වූයේ අප අපේක්ෂා කළ තරම් ප්‍රතිචාර සංඛ්‍යාවක් ලබාගැනීමට නොහැකිවීමයි. තවද, සිවිල් සමාජ සංවිධාන සම්බන්ධයෙන් ඇති නිර්වචන කිහිපයකම වෘත්තීය සමිති ද ඇතුළත් වී තිබුණත් අප තෝරාගත් නිර්වචනය වූ එක්සත් ජාතීන්ගේ නිර්වචනයෙහි වෘත්තීය සමිති ඇතුළත් වී තිබුණේ නැත. දත්තවලට වෘත්තීය සමිති ඇතුළත්කර ගෙන නැතත් ඇඟළුම් කර්මාන්තය වැනි ක්ෂේත්‍රවල වෘත්තීය සමිති සහ කම්කරු අයිතිවාසිකම් හා බැඳුනු ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන සමගින් අපි සම්බන්ධ වීමු.

සිවිල් සමාජ සංවිධානවල නිර්වචනය සම්බන්ධයෙන් පර්යේෂණ කණ්ඩායම විසින් තීරණයක් ගත් පසුව වැදගත් වූයේ ශ්‍රී ලංකාව තුළ මෙම සංවිධානවල ඉතිහාසය සහ එම සංවිධාන සිදුකරන වැඩකටයුතුවල විෂයයපථය අවබෝධ කරගැනීමයි. ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධානවල ඉතිහාසය යටත් විජිත සමය තරම් ඈතට දිවෙයි. මේ මුල්කාලීන සිවිල් සමාජ සංවිධාන වූයේ 1812 දී ඇතිකළ සිලෝන් බයිබල් සොසයිටි සහ 1853 ඇති කළ ක්‍රිස්ටියන් ලිටරිචර් සොසයිටි ඔෆ් සිලෝන් වැනි ක්‍රිස්තියානි ධූතමෙහෙවර ය. මෙම සිවිල් සමාජ සංවිධාන බිහිවීම, පසුව බෞද්ධ, හින්දු සහ මුස්ලිම් සිවිල් සමාජ සංවිධාන බිහිවීමට පදනම් සැලසීය (ඒඩීබී, 2013) (ජයසිංහ, 2007). ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය පැවති කාලයේ මෙන්ම සුනාමි උවදුරින් පසු අවස්ථාවේ දී සිවිල් සමාජ සංවිධාන වැදගත් භූමිකාවක් නිරූපණය කරන ලදී.

සිවිල් සමාජ සංවිධාන සිදුකරන කාර්යයන්හි විෂයය පථය සලකා බලන කල, මානුෂීය ආධාර ලබාදීමේ සිට ප්‍රතිපත්තිවල වෙනසක් සඳහා උද්දේශනය කිරීම දක්වා පුළුල් පරාසයක බලවරමක් මෙම සංවිධානවලට ඇති බව පෙනී යයි. කාන්තා අයිතිවාසිකම්, පරිසර ආරක්ෂාව, සාමය ගොඩනැංවීම, අධ්‍යාපනය, සහ දරිද්‍රතාවය අඩුකිරීම වැනි ගැටළු සම්බන්ධයෙන් මෙම සංවිධාන කටයුතු කරනු ලැබේ. එමෙන්ම, ප්‍රජාව සහ රජය යා කරන පාලමක් ලෙස ද කටයුතු කරන මෙම සිවිල් සමාජ සංවිධාන, රජය විසින් තම ප්‍රතිපත්ති සහ ක්‍රියා සඳහා වගවන බව සහතික කරගනියි.

කෙසේනමුත්, මෙම පර්යේෂණයේ විෂයයපථය අනපේක්ෂිත හෝ හදිසියේ ඇතිවන ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන අභියෝගවලට සීමා වූ අතර, කාන්තාවන් සහ ගැහැණු ළමුන් වැනි ආන්තීකරණය වූ ප්‍රජාවන් කෙරෙහි එහිදී විශේෂයෙන් උනන්දුවක් දක්වන ලදී. අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම අතිශයින් අභියෝගාත්මක විය. මෙම වාර්තාවේ ක්‍රමවේදය දැක්වෙන කොටසෙහි එම අභියෝග විස්තර කර ඇතත්, 'අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය' යන යෙදුම විවිධාකාරවලින් අර්ථනිරූපණය කළ හැකි බව අප හොඳින්ම දැනුවත් බව මෙහි ද සඳහන් කරන්නෙමු. එසේම 'ක්ෂණික ප්‍රචණ්ඩත්වය' යන යෙදුමට ස්වභාවික ආපදා ද ඇතුළත් වියහැකි බැවින් අප මෙම පර්යේෂණය තුළ ස්වභාවික ආපදා සැලකිල්ලට ගත්තෙමු. එහෙත් අප සලකා බැලුවේ ස්වභාවික ආපදාවලින් හානියට පත්වන මනුෂ්‍යයින්ට සහන සලසන සිවිල් සමාජ සංවිධාන පමණක් වූ අතර එවන් ආපදාවලින් ශාක හා සතුන් වෙත එල්ලවන බලපෑම් ද අවසානයේ කෙදිනක හෝ මනුෂ්‍ය වර්ගයාට බලපාන පාරිසරික සාධක විය හැකි නමුත් ඒවා මෙම පර්යේෂණයට ඇතුළත් කර නොමැත. මනුෂ්‍යයා විසින් ඇති කරන පාරිසරික ආපදා වන මීතොටමුල්ල කුණු කන්ද නායයෑම වැනි ස්වභාවික ආපදා මෙහි ඇතුළත් කර තිබේ. ඒ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ක්‍රමවේදය කොටසෙහි ඇතුළත් ය.

නිර්වචන සම්බන්ධයෙන් දැක්වූ දැඩි සැලකිල්ල සහ මාස කිහිපයක පර්යේෂණ කටයුත්තක් හරහා අපට සාක්ෂාත් කරගත හැකිවූ දෑ සලකා බලා, මෙම වාර්තාවෙන් අප අරමුණු කරන්නේ ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන සම්බන්ධයෙන් දළ විශ්ලේෂණයක් ලබාදීමටයි. මෙරට සිවිල් සමාජ සංවිධානවල ඉතිහාසය සහ ඒවායෙහි සංවිධාන ව්‍යුහය සහ අරමුදල් ලැබෙන මූලාශ්‍ර ද, ඒවායින් සමාජය මත ඇතිකෙරෙන බලපෑම ද මෙහි විමසුමට ලක් කෙරේ. එමෙන්ම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් මත රජයන් පනවන සීමා සහ සම්පත් කරා සීමිත ප්‍රවේශයක් පැවතීම වැනි, ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන අභියෝග කවරේදැයි මෙම වාර්තාව සාකච්ඡා කරයි.

## ක්‍රමවේදය

සිවිල් සමාජ සංවිධාන බොහෝ ගණනක් පවතින අතර ඒවා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පැතිර පවත්නා බැවින් දත්ත නිවැරදිව එකතු කරගැනීම සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කිරීම අවශ්‍ය විය. මෙහිදී සෑහෙන අභියෝග ප්‍රමාණයකට අපට මුහුණ දෙන්නට වූඅ අතර ක්‍රියාවලිය වඩාත් සුමට කරගැනීම සඳහා එය යළි සලකා බැලීමට සිදුවිය. එහෙත් ක්‍රියාවලිය මනා සේ සකසාගත් පසුව අපට මෙම අධ්‍යනයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් තෘප්තිමත් විය හැකි විය. මෙය ජාතික මට්ටමින් සිදුකළ සමීක්ෂණයක් බැවින් අපට ප්‍රතිචාර 150කට වැඩි ප්‍රමාණයක් ලබාගැනීමට හැකි වූ අතර සිවිල් සමාජ සංවිධාන පිළිබඳව සහ සිවිල් සමාජ සංවිධාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව එය සාධාරණ චිත්‍රයක් පිළිබිඹු කරන බව අපි විශ්වාස කරමු.

ප්‍රමාණාත්මක දත්ත සම්පූර්ණ කිරීමෙන් පසුව, ප්‍රමාණාත්මක දත්ත සඳහා අනුපූරකයක් වශයෙන් සහ බැලූ බැල්මට අසාමාන්‍ය බවක් පෙනුණු දත්ත තහවුරු කරගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණය සිදු කරන ලදී.

## දත්තමූලය

මෙම ව්‍යාපෘතියෙ පළමු අදියර වූයේ ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන සඳහා දත්තමූලයක් සකසා ගැනීමයි. රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ විස්තීර්ණ ලැයිස්තුවක් තිබුණ ද සියළුම සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන එහි ලියාපදිංචි වී නොමැත. ශ්‍රී ලංකාවේ ඇතැම් සිවිල් සමාජ සංවිධාන ලියාපදිංචි කර ඇත්තේ සමාගම් වශයෙනි. බොහෝවිට මෙසේ කරන්නේ රාජ්‍ය විමසුමට ලක්වීමෙන් ගැලවීමට ය. තවත් සංවිධාන බිම් මට්ටමේ විධිමත් නොවන සංවිධාන වශයෙන් පවතින අතර තවත් ඒවා ආගමික ආයතන වේ. තවද, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලැයිස්තුව යාවත්කාලීන කර නොමැත. අප විසින් පසුබිම් පරීක්ෂාවක් සිදුකිරීමේදී දැනට අක්‍රිය තත්වයේ පවතින රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක්ම එම ලැයිස්තුවේ තිබී හඳුනාගන්නා ලදී. එබැවින්, අපගේ ලැයිස්තුව වඩාත් පුළුල් කිරීම සඳහා සහ බිම් මට්ටමේ සංවිධාන මෙන්ම ආගමික සිවිල් සමාජ සංවිධාන ඇතුළත් කරගැනීම සඳහා අප මෑතකදී සම්පාදනය කළ දත්තපදනමේ වූ සියළුම සංවිධානවලට ලියා, ඔවුන් වැඩ කරන සියළුම සංවිධානවල නම් සහ දුරකථන අංක/ලිපින යනාදිය අපට ලබාදෙන මෙන් ඉල්ලීමට තීරණය කළෙමු. එම බිම් මට්ටමේ සංවිධාන සහ ආගමික සංවිධාන දත්ත පදනමට ඇතුළත් කර සමස්ත කණ්ඩායමට ම අපගේ ප්‍රශ්නාවලිය ඊමේල් හරහා යැවීම අපගේ අදහස විය.

කෙසේනමුත්, අප මුලින් යැවූ ඊමේල්/ ලිපි සඳහා එතරම් ප්‍රතිචාරයක් ලැබුණේ නැත. එක් සංවිධානයක් අපට ප්‍රතිචාර එවා තිබුණු අතර තවත් සංවිධාන කිහිපයක් යම් යම් දේ පැහැදිලි කරගැනීමට අප සමගින් සම්බන්ධ වුවත් සංවිධාන අතරින් වැඩි කොටසක් ප්‍රතිචාර දැක්වූයේ නැත. අප වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා මේ සංවිධාන බැඳී නොමැති බව අප දන්නා අතර සංවිධාන 200ක් පමණ සමග දත්තපදනම එලෙසින්ම පවතියි.

කෙසේනමුත්, සිවිල් සමාජ සංවිධාන හඳුනාගැනීමේදී පර්යේෂණ කණ්ඩායම එක් එක් සංවිධානයේ පසුබිම පරීක්ෂා කර බැලූ බව සඳහන් කිරීම වැදගත් ය. අදාළ සංවිධාන තවමත් ක්‍රියාකාරී ද, ඒවා පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයක ද, සහ වඩාත් ම වැදගත් වශයෙන්, ඒවා අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටළු පිළිබඳ- අඩුම තරමින් එම යෙදුමේ පුළුල් නිර්වචනයට අදාළව- ක්‍රියාත්මක වන ආයතන ද යන්න තහවුරු කරගැනීම සඳහා එසේ සිදුකරන ලදී.

සඳහන් කළයුතු තවත් වැදගත් කරුණක් නම්, එල්ජීබීටී ප්‍රජාව සමගින් විශේෂයෙන් වැඩ කරන බොහෝ සංවිධාන තම වෙබ් අඩවි හෝ සමාජ මාධ්‍යවල තමන් හා සම්බන්ධ වියහැකි තොරතුරු ඇතුළත් කර තිබුණේ නැත. මෙම සමීක්ෂණය සිදු කෙරුනේ දුරකථන ඇමතුම් හරහා බැවින් (එකතු කරන දත්තවල එකාකාරී බව සහතික කර ගැනීමට, එක් එක් ප්‍රශ්නය විස්තර කිරීමට සහ, සමීක්ෂණය සිංහල හෝ දෙමළ බසින් සිදුකළත් එකම යෙදුම් භාවිතය සඳහා ඔවුන් වෙත පරිවර්තන ලබාදීමට කටයුතු කරන ලදී) මෙම සංවිධාන සමගින් සමාජ මාධ්‍ය හරහා පණිවුඩ හුවමාරු කරගැනීම අපට යොදගත හැකි විකල්පයක් නොවුණි. එනිසා, එල්ජීබීටී ප්‍රජාව සම්බන්ධයෙන් දත්ත නිරවද්‍යතාවයෙන් අඩුවීමට ඉඩ ඇති අතර, එල්ජීබීටී ගැටළු සම්බන්ධයෙන් පමණක්ම වැඩකරන සංවිධාන තිබුණේ ද ස්වල්පයක් පමණි.

## පර්යේෂණ පාරාමිති

ප්‍රශ්නාවලිය සකස් කිරීමේදී අපගේ අදහස වූයේ සිවිල් සමාජ සංවිධාන වැඩියෙන් සංකේන්ද්‍රණය වී ඇති ප්‍රදේශ සහ සංවිධාන අඩුවෙන් ඇති ප්‍රදේශ පිළිබඳ අවබෝධයක් ලබාගැනීමය. සිවිල් සමාජ සංවිධාන ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරන්නේ කුමන අංශවල කටයුතු සඳහාද, තවත් වැඩකළයුතු අංශ මොනවාද? එමෙන්ම, මෙම පර්යේෂණයේ මූලික වශයෙන්ම අවධානය යොමු කළේ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන විට සිවිල් සමාජ සංවිධාන මුහුණදෙන අභියෝග විය.

මුලින්ම අපි පර්යේෂණය සඳහා කාල පරිච්ඡේදයක් හඳුනාගත්තෙමු. එය 2009-2022 විය. සිවිල් සමාජ සංවිධාන වර්තමානයේ නිරතවන ක්‍රියාකාරකම් සඳහා වඩාත් අදාළ වන පශ්චාත් යුධ පසුබිමේ ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධාන මෙම අධ්‍යයනයට තෝරාගැනීමට අපි තීරණය කළෙමු. ඉන්පසුව අපි එම 13 වසරක කාල පරිච්ඡේදය තුළ සිදු වූ ප්‍රධාන ප්‍රචණ්ඩ සිදුවීම් කවරේදැයි හඳුනාගැනීමට අපි ගැඹුරින් සාහිත්‍ය සමීක්ෂණයක් සිදු කළෙමු. ඒ 13 වසර තුළ ඇති වූ ප්‍රධාන ප්‍රචණ්ඩ සිදුවීම් සියල්ල හඳුනාගත් පසු ඒවා අපේක්ෂිත සහ අනපේක්ෂිත යනුවෙන් වර්ගීකරණය කළෙමු.

කලින් සඳහන් කළ පරිදි, අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම සෑහෙන අභියෝගයක් විය. මේ පර්යේෂණය තුළ අප විසින් අපගෙන් ම විමසූ ප්‍රශ්න අතරට මේවා ඇතුළත් විය- ප්‍රචණ්ඩත්වය කවර විටක හෝ අනපේක්ෂිත වේද? අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය යැයි සැලකිය හැක්කේ කුමන වර්ගවල ප්‍රචණ්ඩත්වය ද? කාන්තාවන්, ගැහැණු ළමුන්, ආබාධ සහිත තැනැත්තන් වැනි ආන්තීකරණය වූ කණ්ඩායම්වලට විශේෂයෙන් බලපාන අනපේක්ෂිත ප්‍රචණ්ඩත්ව මොනවාද?

උදාහරණ වශයෙන්, ශ්‍රී ලංකාවේ සිදුකළ පාස්කු බෝම්බ ප්‍රහාරය මහජනයාට 'අනපේක්ෂිත' සිදුවීමක් වශයෙන් සලකත හැකි වුවත් රාජ්‍ය නිලධාරීන් එම සාහසික සැලසුම පිළිබඳව ප්‍රහාරයට දින කිහිපයකට පෙර සිට දැන සිටියහ. එබැවින්, මේ පසුබිමේ අපි අනපේක්ෂිත යැයි සලකන්නේ මහජනයාට අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය ද නැතහොත් මහජනයාට සහ රාජ්‍යට යන දෙපාර්ශවයටම අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය ද? දෙපාර්ශවයටම අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සලකා බලන්නේ නම්, කලින් සිටම දැන නොසිටි ප්‍රචණ්ඩත්වය නිශ්චිතව හඳුනා ගැනීම කළ නොහැක්කක් තරම් ය. පාස්කු ප්‍රහාරයෙන් පසුව මුස්ලිම් ප්‍රජාවට එල්ල කළ ප්‍රහාර ගතහොත්, වාර්ෂිකව පාහේ මුස්ලිම් විරෝධී ප්‍රහාර ඇති වූ මෑත කාලීන ඉතිහාසය අනුව එවැනි ප්‍රහාර ඇතිවේදෝයි බොහෝ මුස්ලිම් ජනයා බියෙන් සිටි බැවින් ඒවා අපේක්ෂිත ප්‍රචණ්ඩත්වය යැයි සැලකීමට සිදු වේ. එක් එක් මුස්ලිම් පුද්ගලයාට එල්ල වූ ප්‍රහාර ගතහොත් ඒවා අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය යැයි සැලකීමට ඉඩක් තිබේ. ප්‍රචණ්ඩත්වය ඇති වෙතැයි බියෙන් බොහෝ මුස්ලිම් ජනයා ඒ පිළිබඳ දැඩි විමසිල්ලෙන් සිටියත් තමන්ට කුමන ආකාරයේ ප්‍රහාරයක් එල්ල වේදැයි ඔවුන් දැන සිටියේ නැත. උදාහරණ ලෙස, තමන්ට සිංහල කතුන් සිය ගණනක් වඳ කළේ යැයි චෝදනා එල්ල වෙතැයි වෛද්‍ය ෂාෆි දැන සිටියේ නැති අතර හිජාබය හෝ නිකාබය ඇඳ සිටි කතුන් තමන්ට ප්‍රහාර එල්ල වෙතැයි දැන සිටියේ නැත.

ගෝඨාගෝගම විරෝධතාකරුවන්ට හමුදාවෙන් හෝ සිවිල් වැසියන්ගෙන් එල්ල වූ ප්‍රහාර ගත්කල, එවැනි ප්‍රහාර එල්ල වීමට සෑහෙන ඉඩක් ඇති බව විරෝධතාකරුවන් හොඳින් ම දැනසිටියහ. බොහෝදෙනා පැමිණ සිටියේ කඳුළුගෑස් ප්‍රහාරවලට සූදානම්ව වූ අතර කඳුළු ගෑස් ප්‍රහාරයකදී සහ කෝලාහල තත්වයක් ඇති වුවහොත් තමන් ආරක්ෂාවන්නේ කෙසේද යන්න පිළිබඳව සමාජ මාධ්‍ය හරහා පුද්ගලයින් දැනුවත් කරන ලදී. එබැවින්, ප්‍රහාරයක් සිදුවේ යැයි අපේක්ෂාවෙන් සිටීම තුළ එම ප්‍රචණ්ඩත්වය පෙර සිට අපේක්ෂා කළ, හෝ පුරෝකථනය කළ ප්‍රචණ්ඩත්වය ලෙස සලකන්නේ නම් එය මෙම පර්යේෂණයට නොගැලපෙනු ඇත.

සලකා බැලිය යුතු තවත් පැතිකඩක් වූයේ පරිසරය සම්බන්ධ අනපේක්ෂිත හෝ හදිසි ප්‍රචණ්ඩත්වයයි. මීතොටමුල්ල කුණු කන්ද නාය යෑම මේ සඳහා එක් උදාහරණයක් විය. අනෙක් අතට, එය කුණු කන්ද අවට වාසය කළ ජනතාවට එරෙහිව සිදුවූ රාජ්‍ය ප්‍රචණ්ඩත්වයක් වශයෙන් ද සැලකිය හැකිය. එසේම, මෙවන් ආපදාවක් කිසිවිටකත් අපේක්ෂා නොකල බැවින් හෝ කුණු කන්ද කවදා කුමන අවස්ථාවක කඩා වැටේදෝයි කලින් දැන නොසිටි බැවින් මෙය අනපේක්ෂිත හෝ හදිසියේ ඇති වූ ප්‍රචණ්ඩත්වයක් වශයෙන් සැලකිය හැකිය. ඒ සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් සහ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමගින් සම්මුඛ සාකච්ඡා පවත්වා වැඩිදුර විමර්ශන කිරීමට සිදුවනු ඇත. කෙසේ නමුත් පර්යේෂණය සඳහා අපට තිබූ සීමිත කාලයත් සමගින් පශ්චාත් යුධ සමයේ සිදු වූ මෙවැනි සිදුවීම් එකින් එක විමර්ශනය කර ඒවා පර්යේෂණයේ විෂයපථයට ඇතුළත් වන්නේදැයි තහවුරු කරගැනීම අපට කළ හැක්කක් නොවීය.

රජයෙන් ක්‍රියාත්මක කර මහජනයාට බලපෑ, ස්වභාවධර්මය හෝ පරිසරය සම්බන්ධ ප්‍රචණ්ඩත්වය සඳහා තවත් උදාහරණයක් වන්නේ 2021 මැයි මාසයේ දී පැනවූ පොහොර තහනමයි. එය ගොවීන්ට බලපෑවා පමණක් නොව, ආහාර අර්බුදයක් නිර්මාණය කිරීම හරහා එය සමස්ථ ජනගහනයට ම බලපෑවේය (රෂීඩ් සහ කුරුවිට, 2022) (ගුප්තා, 2022) (පාර්කින් සහ රත්නවීර, 2022) (ජයසිංහ සහ ඝෝෂාල්, 2022). ඇතැමුන් පවසන අන්දමට මෙම පොහොර තහනම වෙනස් ආකාරයකින් පැනවූයේ නම්, එය සාර්ථක වීමට ඉඩ තිබුණු බැවින් සහ අර්බුදයට මග පෑදුවේ රජයෙන් එය වැරදි ලෙස ක්‍රියාත්මක කිරීම තුළ බැවින් මෙය අනපේක්ෂිත හෝ හදිසි ප්‍රචණ්ඩත්වයක් ද යන්න විවාදයට තුඩු දෙන්නකි (යං, 2022) (මෙන්ඩිස්, 2021).

ව්‍යාපෘතියේ ඉතා වැදගත් පැතිකඩක් වන මේ සම්බන්ධයෙන් විවාද කරන අතර ම, අනපේක්ෂිත යැයි සැලකිය හැකි සිදුවීම් කිහිපයක් හඳුනාගැනීමට අපට හැකි විය. තංගල්ලේ හෝටලයක දී කුරාම් ශෙයික් යන බ්‍රිතාන්‍ය ජාතික රතුකුරුස සේවකයාගේ ඝාතනය සහ ඔහුගේ සහකාරිය සමූහ දූෂණයට ලක්වීම ඊට එක් උදාහරණයකි. එබැවින්, කලින් තර්ජනය කිරීම් නොමැතිව සිදු වූ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය යටතට එවැනි ඝාතන හා දූෂණ ඇතුළත් කර තිබේ. සඳහන් කළ යුතු තවත් අංශයක් නම්, සමාජ මාධ්‍ය හරහා ඇති වූ ඩොක්සිං සහ අනෙකුත් අනපේක්ෂිත ස්වරූපවල ප්‍රචණ්ඩත්වයයි. එය ද පුද්ගලයකු මත බරපතළ බලපෑමක් එල්ල කළ හැකි අන්දමේ ප්‍රචණ්ඩත්වයකි. මෙවා වඩාත් පටු උදාහරණ වූ බැවින් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය කුමක්දැයි නිර්වචනය කිරීම සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් වෙත ඉඩ හරින්නට අපි අවසානයේ තීරණය කළෙමු. කෙසේනමුත් ඔවුන් විසින් 'අනපේක්ෂිත' ප්‍රචණ්ඩත්වය සැලකිය යුත්තේ කෙසේදැයි යම් අදහසක් ප්‍රතිචාර දක්වන්න වෙත ලබාදීම සඳහා අපි උදාහරණ කිහිපයක් ප්‍රශ්නාවලියට ඇතුළත් කළෙමු. විවිධ සිවිල් සමාජ සංවිධාන 'අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය' යනුවෙන් සලකන්නේ කුමක්දැයි අවබෝධ කරගැනීමට සහ අප තුළ ඇති පක්ෂපාතීකම් හෝ අපේ දැනුම සීමිත වූ බැවින් අප සලකා නොබැලූ තවත් අනපේක්ෂිත ප්‍රචණ්ඩ සිදුවීම් තිබුණේ නම් ඒ පිළිබඳව සිවිල් සමාජ සංවිධාන හරහා දැනගැනීමට එය උපකාරී වනු ඇතැයි යන්න අපගේ අදහස විය.

## ප්‍රශ්නාවලිය

මීළඟ පියවර වූයේ සමීක්ෂණය සකස් කිරීමයි. සමීක්ෂණය පුරවා එවීමට සහභාගිවන්නන් බැඳී නොසිටින බැවින් සහ ඒ වෙනුවෙන් වෙන් කරන කාලයට ගෙවීමක් නොකෙරෙන බැවින්, සහ ඔවුන් විසින් මුල් තැන දිය යුතු ඔවුන්ගේම ව්‍යාපෘති තිබෙන බැවින්, කාලය සීමිතකම හේතුවෙන් සහභාගිවන්නන් විසින් සමීක්ෂණය පිරවීම ප්‍රතික්ෂේප කිරීම වලක්වාගැනීම සඳහා ප්‍රශ්නාවලියට ඇතුළත් කරන ප්‍රශ්න සංඛ්‍යාව සීමා කිරීම අපේ අදහස විය. වැඩි ප්‍රතිචාර ප්‍රමාණයක් ලැබෙන බව සහතික කරගන්නට අපට වුවමනා වූ බැවින් ප්‍රශ්න සීමිත සංඛ්‍යාවක් පමණක් ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය විය.

මේ අන්දමින් ප්‍රශ්න සංඛ්‍යාව සීමා කරන්නට සිදුවීම අපට තවත් අභියෝගයක් විය. පර්යේෂණයට වඩාත්ම වැදගත් අංශ කවරේදැයි හඳුනාගෙන අවසානයේ දී ප්‍රශ්න 19කින් සමන්විත සමීක්ෂණයක් සකස් කරන්නට අපට හැකිවිය.

ප්‍රශ්නාවලිය මෙලෙස සකස් කරගැනීමෙන් පසුව අපි රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් සම්බන්ධ කරගනිමින් ගූගල් ෆෝර්ම්ස් ඇසුරින් නියමු සමීක්ෂණයක් සිදු කළෙමු. එහිදී අපට අඩුපාඩු කිසිත් වාර්තා නොවූ අතර දත්ත එකතු කිරීමේ ක්‍රියාවලියෙහි හෝ එකතුකළ දත්තවල අපට බරපතළ ගැටළු කිසිත් නිරීක්ෂණය නොවීය.

## අහඹු නියැදිකරණය

සංවිධාන 200කින් සමන්විත වූ දත්තමූලයෙහි රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලැයිස්තුවේ ඇතුළත් වූ සංවිධාන මෙන්ම ප්‍රධාන වශයෙන් ම ගූගල් සෙවුම ආධාරයෙන් සොයාගත් රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත් වූ බැවින් මෙම පර්යේෂණය අහඹු නියැදිකරණ පර්යේෂණයක් වශයෙන් අපි සලකන්නෙමු.

කලින් අවස්ථාවක දී ඊමේල් හරහා ඔවුන් සම්බන්ධ කරගන්නට උත්සාහ දරුවත් එය සාර්ථක නොවූ බැවින් ඊමේල් හෝ සාමාන්‍ය තැපෑල හරහා අපගේ ජාලය වෙත සහ දත්තමූලයේ ඇති සංවිධාන 200 වෙත ළඟාවෙන්නට උත්සාහ දැරීමෙන් වැළකීමට සමීක්ෂණය බෙදාහැරීමේ අවස්ථාවේ දී අපි තීරණය කළෙමු. එක් එක් සංවිධානයට

දුරකථනයෙන් අමතා, ප්‍රශ්නාවලියට ඔවුන් දෙන පිළිතුරු සටහන් කරගැනීම, ප්‍රතිචාර දැක්වීමේ අනුපාතය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම සඳහා ඉතා වැදගත් විය.

ඒ සඳහා අපි කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ විද්‍යායතනය වෙත යොමු වී, සිවිල් සමාජ සංවිධාන අමතා දත්ත එකතු කිරීමේ කටයුත්ත සඳහා ගෙවීමක් ලබන සීමාවාසිකයින් බඳවා ගත්තෙමු.

සීමාවාසිකයින් 20 දෙනෙකු බඳවාගත් අතර, සමීක්ෂණය පිළිබඳ ඔවුන් හුරු කිරීම සඳහා වැඩමුළු දෙකක් පැවැත්වූයෙමු. මෙම වැඩමුළුවලදී අපි මෙම පර්යේෂණය කුමක් සම්බන්ධයෙන් ද, අප අපේක්ෂා කරන්නේ කුමන වර්ගයක තොරතුරු ද යනාදිය පැහැදිලි කළෙමු. සමීක්ෂණයේ එක් එක් ප්‍රශ්නය ගෙන විස්තර කිරීම සහ ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබාදීම ද සිදුකරන ලදී. එක් එක් සීමාවාසිකයාට ඇමතීම සඳහා, දත්තමූලයෙන් ලබාගත් සිවිල් සමාජ සංවිධාන 10ක ලැයිස්තුවක් බැගින් ලබාදෙන ලදී. එසේම, පෙරගෙවුම් කළ සිම්පතක් ද ඇමතුම් ලබාගැනීම සඳහා ඔවුන් වෙත ලබාදෙන ලදී.

## සීමාවාසිකයින් මුහුණ දුන් ගැටළු

- සීමාවාසිකයින් විසින් ඇමතුම් ලබාදෙන ලද්දේ 2022 දෙසැම්බර් මාසයේදී ය. බොහෝ සිවිල් සමාජ සංවිධාන වසරේ මේ කාලයේදී ව්‍යාපෘති අවසන් කිරීමෙහි නිරත වන බැවින් බොහෝ කාර්යබහුලවීම ප්‍රශ්නයක් විය. එමෙන්ම නිවාඩු සමය සඳහා බොහෝ ආයතන වසා දැමේ. සීමාවාසිකයින් ඇමතූ ඇතැම් ආයතන සම්බන්ධයෙන් තත්වය මෙසේ විය.
- ඇතැම් ආයතනවල අන්තර්ජාල වෙබ් පිටු තිබුණත් ආයතනය අක්‍රිය තත්වයේ පැවතීම සහ සමීක්ෂණය ඊමේල් හරහා එවන මෙන් ඉල්ලා සිටි ඇතැම් ආයතනවලට නැවත නැවතත් ඇමතුම් ලබාදුන්නත් ඔවුන් සමීක්ෂණය පුරවා එවූයේ නැත.
- ප්‍රාදේශීය ප්‍රජාවන් සමගින් ළඟින්ම වැඩ කළත්, ඔවුන් සිවිල් සමාජ සංවිධාන නොවන බව සඳහන් කරමින් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක්ම  ප්‍රතිචාර දැක්වීමෙන් වැලකී සිටින ලදී.
- ඇතැම් සංවිධාන සම්බන්ධ කරගැනීම සඳහා ඔවුන්ගේ වෙබ් අඩවි සහ සමාජ මාධ්‍යවල සඳහන් කර තිබූ තොරතුරු නිවැරදි නොවීය.

මේ ගැටළු මැඩලීම සඳහා, ඔවුන් යම් ප්‍රශ්නයකට මුහුණ දුන් සැනින් ඒ පිළිබඳව දැනුම්දෙන මෙන් පර්යේෂණ කණ්ඩායම සීමාවාසිකයින්ගෙන් ඉල්ලා සිටින ලදී. විශේෂයෙන්ම සිවිල් සමාජ සංවිධානයකින් ප්‍රතිචාරයක් නොලැබෙන්නේ නම් ඒ පිළිබඳව පර්යේෂණ කණ්ඩායම වෙත දැනුම් දුන් අතර, ළඟා විය නොහැකි වූ හෝ ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කළ සිවිල් සමාජ සංවිධාන වෙනුවට වෙනත් සිවිල් සමාජ සංවිධාන සොයාගැනීම සඳහා අපි ගූගල් සෙවුම ආධාර කරගත්තෙමු. එහිදී අප අනුගමනය කළ ක්‍රියාවලියට එම සංවිධාන අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන්නේ දැයි  දැනගැනීම සඳහා සංවිධාන සම්බන්ධයෙන් කඩිනමින් පසුබිම් පරීක්ෂාවක් සිදු කිරීම ඇතුළත් විය. ඉහළ ප්‍රතිචාර අනුපාතයක් සහතික කිරීම සඳහා එසේ කරන ලදී. එසේ ගූගල් සෙවුම් සිදුකිරීමෙන් අනතුරුව, නිසි නිර්ණායක නොසපුරන බව හඳුනාගැනීම හේතුවෙන් පර්යේෂණයට ඇතුළත් කර නොගත් සංවිධාන ගණනාවක් විය. කඩොලාන සම්බන්ධයෙන් හෝ තිරසාර බලශක්තිය සම්බන්ධයෙන් පමණක් වැඩ කරන සංවිධාන මේ සඳහා එක් උදහරණයකි. එසේම, මිනිසුන් සමගින් වැඩ කරන ඇතැම් සංවිධාන ද ඇතුළත් කර නොගෙන සිටීමට සිදුවිය. දුගී තැනැත්තන්ට ආහාරවේල් සපයන සංවිධාන පැහැදිලිවම අනපේක්ෂිත හෝ හදිසියේ ඇතිවන ප්‍රචණ්ඩත්ව කාණ්ඩයට ඇතුළත් නොවුනු බැවින් එවැනි සංවිධාන මීට ඇතුළත් කරගත්තේ නැත.

ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන බැවින් මෙසේ තවත් සිවිල් සමාජ සංවිධාන සොයාගැනීම දුෂ්කර නොවීය. කාලය ගතවූ කටයුත්ත වූයේ ඒවා සම්බන්ධයෙන් පසුබිම් විස්තර සෙවීමයි.

අවසානයේදී අළුතින් සංවිධාන 45ක පමණ නම් සීමාවාසිකයින් වෙත ලබාදුන් අතර, එවිට අප සම්බන්ධ වූ මුළු සංවිධාන සංඛ්‍යාව 245ක් විය.  එම 245න් සංවිධාන 158ක් අප වෙත ප්‍රතිචාර දැක්වූහ. සාවද්‍ය සහ දෙවරක් සඳහන් වූ සංවිධාන ඉවත් කිරීමෙන් පසුව අපගේ අධ්‍යයනය සඳහා සංවිධාන 153ක් තිබිණි.

## දත්ත වගුගත කිරීම

මෙම වාර්තාවේ විශ්ලේෂණ කොටසෙහි ඉදිරිපත්කර ඇති දත්තවලට අප එකතුකළ සම්පූර්ණ දත්ත ඇතුළත් ය. අදාළ සිවිල් සමාජ සංවිධාන වැඩ කරන්නේ කුමන අනපේක්ෂිත ප්‍රචණ්ඩත්ව අංශවල ද යන්න මෙන්ම ඔවුන්ට රජයෙන් ආධාර ලැබෙන්නේ ද, සහ වසරකට ව්‍යාපෘති කීයක් ක්‍රියාත්මක කරන්නේද යනාදී සාධක ඇසුරින් නිශ්චිත දිස්ත්‍රික සලකා බැලීම හරහා අපි මෙම පර්යේෂණයට තවත් මානයක් ලබාදී ඇත්තෙමු.

සැලකියයුතු තරම් ඉහළ මට්ටමකින් සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීත්වයක් තිබූ මඩලකපුර දිස්ත්‍රික්කය විශ්ලේෂණය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක අතරට ඇතුළු විය. යාපනය, මන්නාරම, ගාල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්ක පර්යේෂණයට විශේෂයෙන් වැදගත්කමක් තිබුණු අතර, රටේ උතුරේ, බස්නාහිර, නැගෙනහිර සහ දකුණේ සිවිල් සමාජ සංවිධාන සිදුකරන ක්‍රියාකාරකම් පිළිබඳ සාධාරණ හරස්කඩක් ද ඉන් සැපයිනි.

## ගුණාත්මක දත්ත


ප්‍රමාණාත්මක දත්ත සම්පූර්ණ කිරීමෙන් පසුව ඊට අනුපූරකයක් වශයෙන් අපි ගුණාත්මක දත්ත සමීක්ෂණය කළෙමු. එහිදී ප්‍රධාන වශයෙන්ම අදහස් කළේ පැහැදිලි කිරීම් හෝ යම් යම් ප්‍රශ්නවලට අදාළව අමතර දත්ත සොයාග ැනීමටයි. උදාහරණ වශයෙන්, සිවිල් සමාජ සංවිධාන මඩකලපුව සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දක්වන බව අපේ අවධානයට ආ අතර, මඩලකපුවේ සිවිල් සමාජ සංවිධානවල සේවය කරන පුද්ගලයින් කණ්ඩායමක් සම්මුඛ සාකච්ඡාවට ලක් කර ඔවුන් ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න සහ මඩකලපුව සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් ඇතිවී තිබෙන්නේ ඇයිදැයි දැනගැනීමට අපි යොමුවීමු. එසේම, රාජ්‍යය සිවිල් සමාජ සංවිධාන දෙස බලන්නේ කෙසේදැයි දැනගැනීම සඳහා අපි මඩකලපුවේ දිස්ත්‍රික් ලේකම් සමගින් කථා කළෙමු.

එම සම්මුඛ සාකච්ඡාවලදී අප සොයාගත් අන්දමට රාජ්‍යය සහ මඩකලපුවේ සිවිල් සමාජ සංවිධාන අතරේ සමීප සහ සහවී යැයි කීමට හැකි අන්දමේ සම්බන්ධයක් ඇත. සිවිල් සමාජ සංවිධාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිටින රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ නියෝජිත සමගින් ඉතාමත් සමීපයෙන් වැඩ කරති. මේ සම්බන්ධයෙන් පසුවිපරම සඳහා අපි රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට සහ අනෙකුත් දිස්ත්‍රික්කවල සිට එම කාර්යාල නියෝජිතයින්ට කථා කළෙමු. සිවිල් සමාජ සංවිධාන පිළිබඳ උනන්දුව අඩු පොලොන්නරුව ද ඊට ඇතුළත් විය.

සිවිල් සමාජ සංවිධාන මඩකලපුව සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දක්වන්නේ ඇයිදැයි යන්න සහ දිවයිනේ අන් ස්ථානවල දැකගත නොහැකි වූ තරම් සාපේක්ෂ වශයෙන් හොඳ මට්ටමකින් සිවිල් සමාජ සංවිධාන සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල එක්ව වැඩකරන්නේ කෙසේද සහ ඒ ඇයිදැයි සොයාගැනීමට ද අපට වුවමනා විය. මඩකලපුවේ සිවිල් සමාජ සංවිධානවල ඉතිහාසය අවබෝධ කරගැනීම සඳහා අපි සාහිත්‍ය සමීක්ෂණයක් සිදුකර, සූරියා කාන්තා සංවර්ධන පදනමේ සරලා එම්මෑනුවෙල් සම්මුඛ සාකච්ඡාවට ලක් කළෙමු. එක් දිස්ත්‍රික්කයක සිවිල් සමාජ සංවිධාන ප්‍රමාණය වැඩි වීමටත් අනෙක් දිස්ත්‍රික්කවල එසේ නොවීමටත් දායක වූ විවිධ සාධක පිළිබඳ අවබෝධ කරගැනීම සඳහා මෙය වැදගත් විය.

# ගුණාත්මක දත්ත විශ්ලේෂණය

## 1. වත්මන් සහ අතීත ව්‍යාපෘති පිහිටි ස්ථාන (මූලස්ථානය පිහිටි ප්‍රදේශයට අමතරව)





සමීක්ෂණයට ලැබුණු ප්‍රතිචාර අනුව, වැඩිම සංවිධාන සංඛ්‍යාවක් ක්‍රියාත්මක වී ඇත්තේ මඩකලපුව දිස්ත්‍රික්කයේ වූ අතර, එය ප්‍රතිචාර දැක්වූවන් 153 දෙනාගෙන් 60 දෙනෙක් විය. සංවිධාන 25ක් පමණක් ක්‍රියාත්මක වූ පොලොන්නරුව දිස්ත්‍රික්කය සංවිධාන අඩුම සංඛ්‍යාවක් ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්කය විය.

ප්‍රතිචාර දැක්වූ සංවිධාන විස්සක් තමන් දිස්ත්‍රික්ක 25හිම ක්‍රියාත්මක වන බව සඳහන් කර තිබුණි. එනිසා දත්ත රූපසටහන්වලට නැගීමේදී මෙම සංවිධාන 20 එක් එක් දිස්ත්‍රික්ක කාණ්ඩයට එක් කර තිබේ. කෙසේනමුත්, දිස්ත්‍රික්ක සියල්ලේම ක්‍රියාත්මක වන මෙම සංවිධාන 20න් බහුතරයක් දැනුවත් භාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘති සිදුකරන අතර ඉන් කිහිපයක් සම්පූර්ණයෙන්ම දැනුවත් කිරීමේ ව්‍යාපෘතිවල පමණක් නිරත වේ. මෙම සංවිධාන 20ටම පොදු මීළඟ කාර්යය වන්නේ සහන සේවා ලබාදීම වන අතර, ඉන් අනතුරුව ඇත්තේ පර්යේෂණ වාර්තා ය.

මඩකලපුවේ ක්‍රියාත්මක වූ බොහෝ ව්‍යාපෘති කාන්තාවන්, ගැහැණු ළමුන් සහ දරිද්‍රතාවය සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති විය. පොලොන්නරුවේ සිදුකළ බොහෝ ව්‍යාපෘති කාන්තාවන් හා ගැහැණු ළමුන්, දරිද්‍රතාවය, ආර්ථික සංවර්ධනය සහ පරිසරය (ස්වභාවික සහ මනුෂ්‍යයා විසින් ඇති කරන ආපදා) සම්බන්ධයෙන් විය.

## 2. ක්‍රියාත්මක වන ප්‍රධාන අංශ





2 ප්‍රස්තාරයේ (ක්‍රියාත්මක වන අංශ) දත්ත කියවීමේදී සිත් හි තබාගත යුතු කරුණු කිහිපයකි. මේ එක් එක් අංශය හුදෙකලාව පවතින ඒවා නොවේ. ඒවා අනෙකුත් අංශ සමගින් අන්තර්ඡේදනය වන නමුත් මෙම ප්‍රස්තාරයෙන් පෙන්වා ඇත්තේ සිවිල් සමාජ සංවිධාන 153ම අධ්‍යයනය කිරීමේදී එක් එක් අංශය වෙත සමස්ථයක් වශයෙන් ලබාදී ඇති අවධානය යි. උදාහරණ වශයෙන්, එක් සිවිල් සමාජ සංවිධානයක් දරිද්‍රතාවයේ සිටින කාන්තාවන් සහ ගැහැණු ළමුන් සමගින් වැඩ කරනවා විය හැක; එසේනම්, ඔවුන් සමීක්ෂණ ප්‍රශ්නාවලියේ කාන්තාවන් සහ ගැහැණු ළමුන් යන කොටුව සහ දරිද්‍රතාවය යන කොටුව සඳහා හරි ලකුණු යොදනු ඇත. තවත් සිවිල් සමාජ සංවිධානයක් ආබාධ සහිත කාන්තාවන් හා ගැහැණු ළමුන් සමගින් වැඩ කරන්නේ නම් ඔවුන් එම විකල්ප දෙක සඳහා වන කොටු ඉදිරියෙන් හරි ලකුණක් යොදනු ඇත. අන්තර්ඡේදන තිබුණත් වඩාත් වැඩි අවධානයක් යොමු වී ඇත්තේ කුමන අංශ සඳහා ද යන්න හඳුනාගැනීමට අප පර්යේෂණය තුළ කටයුතු කර තිබේ.

තවත් කරුණක් නම්, මෙම පර්යේෂණය තුළ ඒවා වෙන්කොට දක්වා ඇති අන්දම අනුව, 'ආර්ථික සංවර්ධනය' සහ 'දරිද්‍රතාවය' අතර ඇති වෙනස සිත් හි තබාගැනීමයි. ආර්ථික සංවර්ධනය යනුවෙන් සඳහන් වන්නේ ප්‍රජාවට සහය ලබාදීමයි- ඇතැම් අවස්ථාවල ඔවුන් දරිද්‍රතා රේඛාවට පහළින් සිටින්නන් නොවීමට ඉඩ තිබේ. දරිද්‍රතාවය යනුවෙන් සඳහන් කරන්නේ දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් සම්බන්ධ ගැටළු වේ.

එමෙන්ම, 'වෙනත්' යන විකල්පය තෝරූ සිවිල් සමාජ සංවිධාන තමන් අතුරුදන් වූ තැනැත්තන්, මාධ්‍යවේදීන් හා මාධ්‍ය සේවකයින්, සහ වෛද්‍ය/සෞඛ්‍ය ගැටළු හා සම්බන්ධ හදිසියේ ඇතිවන හෝ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන බව සඳහන් කර තිබුණි.


2.1 වැඩකරන ප්‍රධාන අංශ දිස්ත්‍රික්ක අනුව වෙන්කොට දැක්වීම (දිස්ත්‍රික්ක: මඩකලපුව, මන්නාරම, යාපනය, ගාල්ල, කුරුණෑගල)





2වැනි ප්‍රස්තාරයෙන් දැක්වෙන අන්දමට වැඩියෙන්ම ක්‍රියාත්මක වන අංශ පිළිවෙලින් ළමයින් හා තරුණයින්, කාන්තාවන් හා ගැහැණු ළමුන්, ආර්ථික සංවර්ධනය සහ දරිද්‍රතාවය යන අංශ වේ. වැඩියෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ මඩකලපුවේ බවත් අඩුවෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ පොලොන්නරුවේ බවත් 1 ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරයි. ඉහත ප්‍රස්තාරය (2.1) පෙන්නුම් කරන්නේ අවධානය යොමු කරන දිස්ත්‍රික්ක වන මඩකලපුව, මන්නාරම, යාපනය, ගාල්ල, කුරුණෑගල යන දිස්ත්‍රික්කවල මෙම සංවිධාන ක්‍රියාත්මක වන්නේ කුමන අංශවලද යන්න වෙන්වෙන් වශයෙනි.

මේ විවිධ දිස්ත්‍රික්ක අතරේ වුවද ක්‍රියාත්මක වන අංශ සම්බන්ධයෙන් එක්තරා ආකාරයක රටාවක් හඳුනාගත හැකි බව මෙම ප්‍රතිඵලවලින් පෙනී යයි. සෑම දිස්ත්‍රික්කයක ම ළමයින් සහ තරුණයින් කෙරෙහි ප්‍රමුඛත්වය දී තිබේ. ඒ හා සමාන අවධානයක් ලැබී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දී කාන්තාවන් හා ගැහැණු ළමුන්ට පමණි. කෙසේනමුත් දිස්ත්‍රික්ක සියල්ලේම මීළඟ ප්‍රමුඛතාවය හිමිව ඇත්තේ කාන්තාවන් හා ගැහැණු ළමුන් අංශයටයි. දිස්ත්‍රික්ක සියල්ලේම අඩුවෙන් ම අවධානය යොමුව ඇත්තේ දරිද්‍රතාවය අංශයට වේ. ශ්‍රී ලංකාව 2022 ආර්ථික අර්බුදයට මුහුණ දෙන අවස්ථාවේ සිවිල් සමාජ සංවිධානවලට ගවේෂණය කළ හැකි අංශයක් ලෙස එය හඳුනාගත හැක.

## 3. සංවිධාන විසින් සිදුකරන කාර්යයන් වර්ග




මේ දත්ත අනුව, සංවිධානවලින් වැඩි ගණනක් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිවල නිරත වෙති. අධ්‍යාපන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති මීළඟ ස්ථානය ගනියි. සියයට 4ක සුළු පිරිසක් 'වෙනත්' වර්ගවල කාර්යයන්හි නිරත වේ. වෙනත් යන විකල්පය තේරූ සංවිධාන ඒවා සඳහා උදාහරණ වශයෙන් උපදේශනය, සමාජ බලමුළු ගැන්වීම, නීති ආධාර සහ අනෙකුත් ආධාරක සේවා දක්වා තිබුණි.





3.1 ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරන්නේ සිවිල් සමාජ සංවිධාන මෙම දිස්ත්‍රික්කවල සිදුකරන කාර්යයන් දිස්ත්‍රික්ක අනුව වෙන්වෙන් වශයෙනි. මෙහිදී ද සමස්ථ දිවයිනේ දක්නට තිබූ දත්ත රටාවම තෝරාගත් දිස්ත්‍රික්කවල දක්නට තිබේ. එකම වෙනස නම්, මඩකලපුව, මන්නාරම, යාපනය සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රජා සංවර්ධනය සඳහා දෙවැනි ප්‍රමුඛතාවය දී ඇති අතර ගාල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය සඳහා සුළු වශයෙන් වැඩි උනන්දුවක් දක්වා තිබීමයි. කෙසේනමුත් ව්‍යාපෘතියේ මුළු අගයන් සමග සසඳන කල මේ වෙනස්කම් සැලකියයුතු තරම් විශාල ඒවා නොවේ.

## 4. මේ ව්‍යාපෘති සඳහා ඔබට අරමුදල් ලැබී තිබේද, නැතහොත් මේවා අරමුදල් නොලැබෙන/ ස්වේච්ඡා ව්‍යාපෘති ද?




ලැබී තිබෙන ප්‍රතිචාර අනුව ව්‍යාපෘතිවලින් 54%ක් ස්වේච්ඡාවෙන් සිදුකරන ඇතැම් ඒවා සහ අරමුදල් ලබා සිදුකරන ඇතැම් ව්‍යාපෘතිවලින් සමන්විත වේ. ස්වේච්ඡාවෙන් පමණක්ම ව්‍යාපෘති කරන සිවිල් සමාජ සංවිධාන ඇත්තේ 14% ක් තරම් සුළු ප්‍රමාණයකි. මෙම ප්‍රශ්නයට 'වෙනත්' යන විකල්පයක් ලබාදී ඒ කවරේදැයි සඳහන් කිරීමේ අවස්ථාව සහභාගිවූවන්ට ලබාදී තිබුණි. එහි පහත කරුණු ඔවුන් විසින් දක්වා තිබුණි: උපදේශනයෙන් ලබන ලාභ බිම් මට්ටමේ ව්‍යාපෘති සඳහා යෙදවීම, වීථි නාට්‍ය ඉදිරිපත් කර මහජනයාගෙන් ලබාගන්නා මුදල් ව්‍යාපෘතිවලට භාවිතා කිරීම. විශාල ව්‍යාපාරවල සමාජ වගකීම් අංශය වූ ඇතැම් සිවිල් සමාජ සංවිධාන තමන් පූර්ණ වශයෙන්ම මවු සමාගමින් අරමුදල් ලබන බව සඳහන් කර තිබුණි.

## 5. පසුගිය දෙවසර තුළ ඔබේ සංවිධානය සම්බන්ධ වූ හෝ සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව කීයද?





ව්‍යාපෘති මෙහෙයවීමට සිවිල් සමාජ සංවිධානවලට ඇති ධාරිතාවය මෙම ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරයි. සංවිධාන අතරින් සෑහෙන බහුතරයක් දෙවසරක් තුළ සම්පූර්ණ කරන්නේ ව්‍යාපෘති 1ත් 5ත් අතර සංඛ්‍යාවකි. සංවිධාන 19ක් දෙවසරක් තුළ ව්‍යාපෘති 21ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්පූර්ණ කර තිබේ. ව්‍යාපෘති 21ක් හෝ ඊට වැඩි ගණනක් යන කාණ්ඩය සලකුණු කළ ඇතැම් සිවිල් සමාජ සංවිධාන, ඒවා, සහනාධාර ලබාදීම වැනි කෙටි ව්‍යාපෘති වූ බව සඳහන් කර තිබුණි. අදාල නොවේ යනුවෙන් ප්‍රතිචාර දැක්වූ සංවිධාන සඳහන් කර තිබුණේ ගතවූ දෙවසර (2020 සහ 2021) තුළ කෝවිඩ්-19 වසංගතය වැනි හේතු කිහිපයක් මත තමන්ට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවයි.




සමීක්ෂණයට ලබාදුන් ප්‍රතිචාර අනුව, සංවිධාන බහුතරයක් එනම් 87ක් මුහුණ දුන් වඩාත්ම පොදු අභියෝගය වන්නේ සම්පත් සීමිතකමයි. කෝවිඩ්-19 වසංගතය, දේශපාලන අස්ථාවරත්වය, හමුද මැදිහත්වීම් යනාදිය ව්‍යාපෘති සඳහා වූ වෙනත් අභියෝග වශයෙන් දක්වා තිබුණි. සංසන්දනාත්මකව ගතහොත් රාජ්‍යයේ අහිතකර මැදිහත්වීම් අභියෝගයක් ලෙස සලකා තිබුණේ සංවිධාන කිහිපයක් විසින් පමණි.

## 7. ඔබ උදවු ඉල්ලා සිටියොත් රාජ්‍යය (අමාත්‍යාංශ මට්ටමින්) සාමාන්‍යයෙන් උදවු ලබාදෙන්නේද?




ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 33% කට ආසන්න ප්‍රමාණයක් තම ව්‍යාපෘති සඳහා සෑම විටම රාජ්‍ය හෝ අමාත්‍යාංශ මට්ටමේ සහාය ඇති බව පෙන්වා දුන් අතර ආසන්න වශයෙන් 38% ක් ප්‍රමාණවත් සහයෝගයක් නොමැති බව පෙන්වා දී ඇත. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට විසිනවයක් මධ්‍යස්ථ විය. කෙසේ වෙතත්, මෙහිදී සඳහන් කළ යුතු කරුණක් වන්නේ, ඇතැම් ප්‍රතිචාර දැක්වූවන් 'අමාත්‍යාංශ' මට්ටම පළාත් සභා ලෙස අර්ථකථනය කළ බව පසුව අපට පෙනී ගිය බවයි.


## 8. ඔබ උදවු ඉල්ලා සිටියොත් රාජ්‍යය (පළාත් පාලන මට්ටමින්) සාමාන්‍යයෙන් උදවු ලබාදෙන්නේද?



ප්‍රාදේශීය රජයේ ආයතන තමන්ගේ වැඩකටයුතු සඳහා සහය දක්වන බව බොහෝ සිවිල් සමාජ සංවිධාන සඳහන් කළහ. සංවිධාන තිස් හයක් මේ සම්බන්ධයෙන් මධ්‍යස්ථ වූ අතර, සංවිධාන 46ක් ප්‍රාදේශීය රජයේ ආයතනවලින් සහයක් නොලැබෙන බව සඳහන් කළහ.


පහතින් දැක්වෙන්නේ ප්‍රාදේශීය රජයේ ආයතනවලින් ලැබෙන සහය සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් දැක්වෙන දත්ත වේ. අවධානය යොමුකළ දිස්ත්‍රික්ක: මඩකලපුව, මන්නාරම, යාපනය, ගාල්ල, කුරුණෑගල.

## 8.1 Local authority support based on district





මෙම ප්‍රස්තාරයට අනුව, මඩකලපුවේ ප්‍රාදේශීය රජයේ ආයතන සිවිල් සමාජ සංවිධානවලට හොඳින් සහය ලබාදෙයි. ප්‍රාදේශීය රජයේ ආයතනවලින් ලැබෙන සහය ප්‍රමාණවත් යැයි සහ ප්‍රමාණවත් නොවේ යැයි සඳහන් කළ සංවිධාන ගණන සංඛ්‍යාත්මක වශයෙන් බොහෝදුරකට එක හා සමාන ය. ඒ ප්‍රතිචාර දක්වන්නන් වැඩ කරන්නේ කුමන අංශවලදැයි බැලීම හරහා, ප්‍රාදේශීය රජයේ ආයතන එක්තරා විෂයයක අදාළ ව්‍යාපෘතිවලය වැඩි සහයක් දක්වන්නේ ද නැතිනම් ප්‍රාදේශීය රජයේ ආයතන ලබාදෙන සහය අභිමතානුකූලව ලබාදෙන්නක් ද යන්න හඳුනාගැනීමට හැකි වනු ඇත.

## 9. මහජනතාව හෝ ඔබ වැඩ කරන ප්‍රජාව ඔබ කෙරෙහි විවෘත වන්නේ යැයි ඔබට කිවහැකිද?




සහභාගිවූවන්ගෙන් සියයට හැත්තෑ තුනක් (සිවිල් සමාජ සංවිධාන 110ක්) ප්‍රජාවන් සෑමවිටම තම ව්‍යාපෘති සඳහා විවෘත බවත් ප්‍රමාණවත් සහයෝගයක් පෙන්නුම් කරන බවත් සඳහන් කර තිබුණි. කෙසේනමුත් සියයට 7ක් පමණ (සිවිල් සමාජ සංවිධාන 10ක්) එම ව්‍යාපෘති සඳහා ප්‍රජාව විවෘත නොමැති බව දක්වා තිබුණි.

## 9.1 දිස්ත්‍රික්ක අනුව සිවිල් සමාජ සංවිධාන කෙරෙහි ප්‍රජාවේ විවෘතභාවය




ව්‍යාපෘති සිදුකිරීමේදී යාපනය සහ මහනුවර දිස්ත්‍රික්කවල සිවිල් සමාජ සංවිධාන අභියෝග කිහිපයකට මුහුණ දී ඇති බවක් පෙනේ. මෙහිදී ද, ප්‍රජාව විවෘත නොමැත්තේ කුමන අංශවල වැඩකටටයුතු සඳහා දැයි සහ වැඩිදුර විමසා බැලිය යුතු වෙනත් ගැටළු තිබේදැයි සොයාබැලීම සුදුසු ය.

## 10. ඔබ කාන්තාවන් සහ ගැහැණු ළමුන් සම්බන්ධයෙන් ව්‍යාපෘති සිදුකරන්නේ නම්, ඔවුන් වෙනුවෙන් විශේෂයෙන් සැකසූ ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇති අභියෝග මොනවාද?




සමීක්ෂණයට ලබාදුන් ප්‍රතිචාරවලින් හෙළිදරව් වූයේ සංවිධාන 28ක් පමණ ප්‍රජාවෙන් එල්ල විය හැකි ප්‍රතිරෝධය කාන්තාවන් හා ගැහැණු ළමුන් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී විශාලතම අභියෝගය වශයෙන් සලකන බවයි. සංවිධාන හතලිස් අටක් කාන්තාවන් සහ ගැහැණු ළමුන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී තමන් අභියෝග නොදකින බව සඳහන් කර තිබුණි. තවද, පවුලේ වගකීම්වලට මුල්තැන දීමට සිදුවන හෙයින් කාන්තාවන්ට වැඩසටහන්වලට සහභාගිවීමට නොහැකිවීම වැනි වෙනත් අභියෝග සම්බන්ධයෙන් සංවිධාන 3ක් විසින් සඳහන් කර තිබුණි.

## 11. ඔබේ සංවිධානය කවද හෝ... (ව්‍යාපෘති සම්පූර්ණ කිරීම)




අභියෝගවලට මුහුණ දුන්නත් සැලසුම් කළ ආකාරයට ම තම ව්‍යාපෘති සම්පූර්ණ කරන්නට තමන්ට සෑමවිටක ම හැකි වූ බව බොහෝ සංවිධාන සඳහන් කළහ. ගුණාත්මක පර්යේෂණයේදී අදහස් දැක්වූ සංවිධාන වසංගතය සහ ඉන්ධන හිඟය හේතුවෙන් නියමිත කාල සීමාව තුළ තම ව්‍යාපෘති සම්පූර්ණ කරගැනීමට ඔවුන්ගේ හැකියාව අඩු වූ බව හෝ තමන්ට එම ව්‍යාපෘති වෙනස් කිරීමට සිදුවූ බව අප වෙත සඳහන් කළ පසුබිමක් තුළ වැඩි දෙනෙක් මෙවැනි ප්‍රතිචාරයක් දැක්වීමේ යථාර්ථය පිළිබඳ අපි විපරම්කාරී වන්නෙමු. කෙසේනමුත්, තමන්ට ව්‍යාපෘති සම්පූර්ණයෙන් ම අතහරින්නට වූ බව සඳහන් කළේ ඉතාමත් සුළු සංවිධාන සංඛ්‍යාවක් පමණි. එනිසා, සමස්ථයක් ලෙස ගත් කල ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන ව්‍යාපෘති අතහැරීම සිදුකරන්නේ කලාතුරකිනි.


## 12. ඔබ අනපේක්ෂිත හෝ හදිසියේ ඇතිවන ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටළු පිළිබඳව කටයුතු කරන්නේ ද? (උදා: පාස්කු බෝම්බ ප්‍රහාරය, ස්වභාවික ආපදා, කෝලාහල, අපයෝජන, ඝාතන යනාදිය)



සංවිධාන අතරින් 59%ක් (එනම් 88ක්) ප්‍රතිචාර දක්වමින් සඳහන් කර තිබුණේ ඔවුන්ගේ කාර්යයන්ට අනපේක්ෂිත හෝ හදිසි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම ඇතුළත් බව වන අතර 41%ක් (එනම් 62ක්) තමන් එවැනි තත්ව සඳහා ප්‍රතිචාර නොදක්වන බව සඳහන් කර තිබුණි. මෙය උනන්දුව ඇතිකරන ප්‍රතිචාරයක් වන්නේ, මෙම පර්යේෂණ කටයුත්ත ආරම්භයේදී අපගේ පර්යේෂණ කණ්ඩායම එක් එක් සිවිල් සමාජ සංවිධානය දළ ඇගයීමකට ලක් කර අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩ නොකරන බව පැහැදිලිවම පෙනෙන සංවිධාන පර්යේෂණයෙන් ඉවත් කිරීම හෝ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩ කරන බැවින් එම සංවිධාන පර්යේෂණයට ඇතුළත් කරගන්නා සංවිධාන සංචිතයට ඇතුළත් කරගැනීම සිදුකර තිබුණු බැවිනි. තමන් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කරන්නේද නැතිද යන්න තක්සේරු කරගැනීම සඳහා උදාහරණ කිහිපයක් ලබාදී තිබුණත් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකට සුළු ප්‍රමාණයක් අඩු සංඛ්‍යාවක් තමන් සිදුකරන කටයුතුවල කොටසක් හෝ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ යැයි සලකන්නේ නැත.


සිවිල් සමාජ සංවිධාන තමන් කරන වැඩකටයුතු දකින්නේ කෙසේද යන්න අවබෝධ කරගැනීමටත් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අපගේ නිර්වචන ඇගැයුම් කිරීමටත් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ප්‍රශ්නය ප්‍රතිචාර දක්වන්නන් වෙත සෘජුවම යොමු කිරීම අවශ්‍ය විය.

## 12.1 අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩ කරන බව සඳහන් කළ සංවිධාන දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන්





මේ පර්යේෂණයේ දී විශේෂයෙන් අවධානය යොමුකරන දිස්ත්‍රික්ක පහ දෙස බලන කල ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 59% ක් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටළු පිළිබඳව වැඩ කරන්නේදැයි විමසූ ප්‍රශ්නයට ‘ඔව්’ යනුවෙන් පිළිතුරු දී තිබුණි. අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සිදුකරන ව්‍යාපෘති වැඩියෙන්ම ක්‍රියාත්මක වූයේ මඩකලපු දිස්ත්‍රික්කයේ බව අපට පෙනී ගියේය. ඉන් අනතුරුව ගාල්ල දිස්ත්‍රික්කය ද ඊට පසුව මන්නාරම දිස්ත්‍රික්කය ද වේ. දිස්ත්‍රික්ක පහෙන් අඩුවෙන්ම මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්නේ යාපනය සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල වේ.

## 12.2 තමන්ගේ ප්‍රධාන කාර්යයන් අතරට අනපේක්ෂිත හෝ හදිසියේ ඇතිවන ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටළු ඇතුළත් වන බව සඳහන් කළ සංවිධාන ක්‍රියාත්මක වන අංශ





මෙහිදී ද අපි අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් තමන් වැඩ කරන බව සඳහන් කළ 59% ගෙන එම සංවිධාන 'සිදු කරන ප්‍රධාන කාර්යයන්' වශයෙන් ලබාදී ඇති දත්ත සමගින් සැසඳුවෙමු. එහිදී හෙළිදරවු වූයේ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩ කරන සංවිධාන බහුලවම ක්‍රියාත්මක වන්නේ ළමයින් සහ තරුණයින් සම්බන්ධ ගැටළු පිළිබඳව බවයි. කාන්තාවන් සහ ගැහැණු ළමයින්, ආර්ථික සංවර්ධනය සහ දරිද්‍රතාවය අනුපිළිවෙලින් මීළඟ තැන් ගනියි.

## 12.3 තමන්ගේ ප්‍රධාන කාර්යයන් අතරට අනපේක්ෂිත හෝ හදිසියේ ඇතිවන ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටළු ඇතුළත් වන බව සඳහන් කළ සංවිධාන සිදුකරන කාර්යයන් වර්ග





තමන් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටළු පිළිබඳව ක්‍රියාත්මක වන බව පැවසූ 59% (එනම් සංඛ්‍යාවෙන් 90.3) න් වැඩි කොටසක් සිදුකළේ දැනුවත් කිරීමේ ව්‍යාපෘති වේ. ඊට ශ්‍රී ලංකාවේ පනවා තිබූ තාවකාලික බුර්කා තහනම අවස්ථාවේ හිජාබය හා නිකාබය හෝ බුර්කාව අතර වෙනස පිළිබඳව දැනුවත් කිරීම වැනි ව්‍යාපෘති ඇතුළත් විය. අධ්‍යාපන ව්‍යාපෘති, ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හා සහන ව්‍යාපෘති යනාදි වර්ගවල කාර්යයන් අනෙකුත් වර්ග අතරට ඇතුළත් විය. ඒ සියල්ලම එක හා සමාන සාමාන්‍ය අගයන් ගෙන තිබුණි.

13. අදාළ ව්‍යාපෘතිය/ වැඩසටහන සැලසුම් කිරීමේදී කාන්තාවන් සහ ගැහැණු ළමුන් ප්‍රධාන ඉලක්කයක් නොවූවත් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වූ වැඩසටහන්/ව්‍යාපෘති තුළ එම කණ්ඩායම් වෙත සහයදීම ඇතුළත් වූයේද?





අනපේක්ෂිත හෝ හදිසි ප්‍රචණ්ඩතා අවස්ථාවලදී තමන් සෑමවිටම කාන්තාවන් සහ ගැහැණු ළමුන් වෙත සහය ලබාදෙන බව ප්‍රතිචාර දක්වන්නන්ගෙන් සියයට හතලිස් තුනක් සඳහන් කර තිබුණි. ඇතැම් අවස්ථාවලදී එසේ වන බව 38%ක් සඳහන් කර තිබුණි. 19%ක් තමන් එවැනි වැඩසටහන්/ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අතරතුර කාන්තාවන් හා ගැහැණු ළමුන්ට සහයදැක්වීම/ ආධාර කිරීම සඳහා සම්බන්ධ වී නොමැති බව සඳහන් කර තිබුණි.

13.1 12 ප්‍රස්තාරයේ දත්ත (අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩ කරන්නේ ද නැති ද යනවග) 13 ප්‍රස්තාරය සමගින් සංසන්දනය කිරීම




අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් තමන් කටයුතු කරන බව සඳහන් කළ සංවිධාන අතරින් සිවිල් සමාජ සංවිධාන 48ක් සඳහන් කළේ තමන්ගේ කාර්යයන් තුළ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී, කාන්තාවන් සහ ගැහැණු ළමුන් තම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්ක කණ්ඩායම නොවූවත් ඔවුන් වෙත සහය සහ උපකාර ලබාදීම සෑමවිටම ඇතුළත් වන බව සඳහන් කර තිබුණි.

14. ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී ප්‍රමුඛතාවය දෙන්නේ පහත කරුණුවලින් කවර ඒවාට ද?




ලැබුණු ප්‍රතිචාර අනුව සංවිධාන 107ක බහුතරයක් තමන් ව්‍යාපෘති සැලසුම් කිරීමේදී කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන බව සඳහන් කර තිබේ. මීළඟට වඩාත්ම ප්‍රමුඛතාවයක් ලබාදෙන්නේ ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතාවලට වේ.

# ගුණාත්මක දත්ත විශ්ලේෂණය

## මඩකලපුවේ රාජ්‍ය නොවන සංවිධාන

සමීක්ෂණයේ ඇතැම් ප්‍රශ්න සම්බන්ධයෙන් පසුවිපරම් කර වැඩිදුර විස්තර සොයාගැනීමට හෝ පැහැදිලි කිරීම් ලබාගැනීමට අවශ්‍ය විය. මඩකලපුවේ සංවිධාන ගණනාවක් සම්මුඛ සාකච්ඡා සිදුකර සමීක්ෂණයේ කොටස් වඩාත් සවිස්තරාත්මකව ගවේෂණය කිරීමට අපට හැකිවිය. එහිදී වැඩිදුර විස්තර විමසූ කරුණු අතරට පහත ඒවා ඇතුළත් විය:

- පොදු හැඳින්වීම් සහ සිවිල් සමාජ සංවිධානවල විෂයපථය
- එම සිවිල් සමාජ සංවිධාන ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවල ස්වභාවය
- කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ එල්ජීබීටී ප්‍රජාව කෙරෙහි ඔවුන් යොමුකරන අවධානය
- අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩ කරන කල සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන අභියෝග
- සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය මැදිහත්වීම්/සහය

අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ බොහෝ සිවිල් සමාජ සංවිධාන තමන් කාන්තාවන් සහ ගැහැණු ළමුන් සමබන්ධයෙන් විවිධ ආකාරවලින් කටයුතු කරන බව අප සමගින් පැවසූහ. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන්, ලිංගික හිරිහැරවලින්, දරිද්‍රතාවයෙන් පීඩාවට ලක්වූ කාන්තාවන්ට උදවු කිරීම, මූල්‍යමය වශයෙන් ස්වාධීනත්වය හෝ නිසි අධ්‍යාපනයක් ලැබීම අහිමි කිරීමට ලක්වූ අයට උදවු කිරීම, සමාජ වැඩ සහ දේශපාලන ව්‍යාපාරවල සක්‍රියව නිරතවන කාන්තාවන්ට උදවු කිරීම යනාදිය එවැනි වැඩකටයුතුවලට ඇතුළත් විය. තමන් විශේෂයෙන් මුස්ලිම් කාන්තාවන් කෙරෙහි අවධානය යොමුකරන බව එක් සිවිල් සමාජ සංවිධානයක් සඳහන් කරන ලදී. පාස්කු ප්‍රහාරයෙන් පසුව රඳවා තැබීමට ලක්වූවන්ගේ බිරින්දෑවරුන් සහ මවුවරුන් සමගින් සහ මුස්ලිම් විවාහ හා දික්කසාද පනතින් පීඩාවට ලක්වූ කාන්තාවන් සමගින් ඔවුහු වැඩ කරති. ඊට අමතරව ඇතැම් සිවිල් සමාජ සංවිධාන සමාජ සහජීවනට සහ සමගිය සම්බන්ධයෙන්  ඇතැම් සංවිධාන වැඩ කරති. ඔවුන් කරන්නේ අන්තර් ආගමික සංවාද සහ විවිධ අවස්ථා යනාදිය සඳහා පහසුකම් සැලසීමයි. සෑම සිවිල් සමාජ සංවිධානයක්ම පාහේ එල්ජීබීටී ප්‍රජාව සමගින් සම්බන්ධතාවයක් පවත්වාගනිති. ඔවුන්ගේ සාකච්ඡා සඳහා ඔවුහු එල්ජීබීටී ප්‍රජාවට ආරාධනා කරති. මඩකලපුව පිහිටා ඇත්තේ වාර්ෂිකව මෝසම් ගංවතුරින් බලපෑමට ලක්වන කලපුවක වෙරළබඩ ආසන්නයේ බැවින් ඇතැම් සිවිල් සමාජ සංවිධාන විශේෂයෙන් අවධානය යොමුකරන්නේ ආපදා සහන සැලසීම කෙරෙහි වේ. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය අවස්ථාවේ ඔවුන් සියළුදෙනාම සහන සැලසීමේ ක්‍රියාවලිවල (එක්කෝ සංවිධාන වශයෙන්, නැතහොත් සාමාජිකයින් පුද්ගල මට්ටමින්) නිරත වූ බව සම්මුඛසාකච්ඡාවලට සම්බන්ධ වූ සියළුදෙනා සඳහන් කළහ.

විශේෂ කරුණක් නම්, විවිධ සිවිල් සමාජ සංවිධාන නියෝජනය කරමින් සම්මුඛ සාකච්ඡාවලට සහභාගි වූ පුද්ගලයින් තමන්ගේ සංවිධානයේ මට්ටමින් කටයුතු කිරීමට අමතරව, මේ සිවිල් සමාජ සංවිධාන අතර ගොඩනගාගෙන ඇති ජාල සහ විශේෂඥ සමූහය හරහා ස්වේච්ඡාවෙන් ද තම සේවය ලබාදෙන බව පැවසීමයි. එම ස්වේච්ඡා සේවය සංවිධානයේ ආචාරධර්ම සහ ක්‍රියාකාරකම්වලට බාධාවක් නොවේ නම් ඒ සඳහා තමන් වැඩ කරන සිවිල් සමාජ සංවිධාන සහය දෙන බවද ඔවුහු සඳහන් කළහ.

තමන් උපදේශන සේවා සැපයීම වැනි ස්වේච්ඡා සේවාවන් සෑහෙන දුරකට ලබාදෙන බව එක් සංවිධානයක් සඳහන් කරන ලදී. 'කාන්තාවන් කාති අධිකරණයට යෑමේදී දුෂ්කරතාවලට ලක්වෙනවා නම් අපි ඒ කාන්තාව කැටුව යන්නට ඉදිරිපත් වෙනවා, අවශ්‍ය වේලාවට උපදේශනය ලබාදෙනවා.' තවත් සංවිධානයක නියෝජිතයකු තමන් ස්වේච්ඡා සේවය සිදුකරන අන්දම මෙසේ පැහැදිලි කළේය, 'ආපදාවක් සිදුවෙලා තියෙනවා නම්, අපේ එක සංවිධානයකින් ලෑස්ති කරන එක තැනකට අපි හැමෝම රැස්වෙනවා. අපි වහාම ගතයුතු ප්‍රතිචාර මොනවාදැයි සාකච්ඡා කරනවා. ඊට පස්සේ අපි අතරේ වැඩ බෙදාගෙන වැඩ කරන්න ගන්නවා. ආපදාවකට ප්‍රතිචාර දක්වද්දී අපි කවුරුහරි අපට ආධාර මුදල් ගෙනත් දෙනකල් බලා ඉන්නේ නැහැ. උදාහරණයක් විදිහට ලොකු වර්ෂාවකින් පස්සේ අසල්වාසී ගම්මානයකට ගංවතුර ගැලුවොත් අපිම ඉදිරිපත් වෙලා ගමේ ධනවත් අයගෙන් මුදල් එකතුකරගෙන බඩුභාණ්ඩ මිලට අරන් බෙදලා දෙනවා. කළයුතු දේ ගැන අපේ සංවිධානවලින් උපදෙස් දෙනකන් අපි බලාගෙන ඉන්නේ නැහැ.'

මෑතකාලීන සිදුවීම් සඳහන් කරමින්, එක් සංවිධානයක් 2022 දී ඇඳිරිනීති සමයේ සහ ඉන්ධන හිඟය පැවති කාලයේදී තමන් ප්‍රජාවට උදවු කළ ආකාරය සඳහන් කරන ලදී. 'ආර්ථික අර්බුදයට ප්‍රතිචාර විදිහට අපි හැම ගෙදරින්ම සහල් මිට ගානෙ එකතු කරලා කැඳ හදලා ඒ කැඳ ගමේ අයට බෙදුවා. අසල්වාසි ගම්වලටත් කැඳ දෙන්න අපිට පුලුවන් වුනා. දෙන්න සහල් තිබුණේ නැති අය තමන්ගේ මිදුල්වල වවලා තිබුණු එළවළු අපට දුන්නා.'

ආර්ථික අර්බුදය පුපුරාගිය අවස්ථාවේ ඔවුන් කාන්තාවන්ට උදවු කළ ආකාරය ගැන සඳහන් කරමින් එක් නියෝජිතයෙක් මෙසේ සඳහන් කරන ලදී: 'ආර්ථික අර්බුදය කාලේ පිරිමින්ට වගේම කාන්තාවන්ටත් ඉන්ධන ලැබෙන බව අපි සහතික කරගත්තා. ඉන්ධනහල්වලදී කාන්තාවන්ට හිරිහැර කළ සහ ඉන්ධන ලබා නොදුන් සිදුවීම් රාශියක් තිබුණා. අපි වහාම මානව හිමිකම් කොමිසමේ සම්බන්ධීකාරකවරුන්, ඉන්ධන හල් හිමියන්, පොලීසිය, ප්‍රාදේශීය ලේකම්, සහ අනෙකුත් රජයේ නිලධාරීන් ඇතුළු පිරිස් එක්ක රැස්වීමක් පවත්වලා කාන්තාවන්ට වෙනම පෝලිමක් දෙන්න කියා ඉල්ලා හිටියා. සෑම ඉන්ධන හලකටම කාන්තා පොලිස් නිලධාරිනියක් යොදවන්න කියා අපි ඉල්ලුවා. ඉන්ධන හලක වැඩියෙන් හිටියේ පිරිමින් නම්, අපි පිරිමින් දෙදෙනෙකුට ඉදිරියෙන් එක් කාන්තාවක් සිටින සේ පෝලිම් මෙහෙයවූවා. එසේම, ගර්භණී මවුවරුන් සහ දරුවන් සමගින් එන කාන්තාවන්ට ප්‍රමුඛතාවය ලබාදෙන්න කියලා අපි පොලිසියෙන් සහ ඉන්ධනහල් හිමියන්ගෙන් ඉල්ලා සිටියා.'

පාස්කු ප්‍රහාරයෙන් පසු තමන් ඒ තත්වය සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය තවත් සංවිධානයක් සඳහන් කරන ලදී: 'නගරයේ මැරයින්ගේ ප්‍රහාරයට ලක්වන්නට ඉඩ තිබෙන මුස්ලිම් කඩසාප්පු ආරක්ෂා කෙරෙන බව අපි සහතික කරගත්තා. බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ මුස්ලිම් සහ අනෙකුත් ප්‍රජාවන් අතරේ ආතතියක් තිබ්බා. වීථිවල ගුටිබැට හුවමාරු සහ රණ්ඩු සිදුවුනා. අපි මේ තත්වය ගැන සාකච්ඡා කළා. අපේ රැස්වීම්වලට අපි ක්‍රිස්තියානි පූජකතුමන් සහභාගි කරගත්තා. සමහර රැස්වීම් පැවැත්වුවේත් පල්ලිවලමයි. පූජකවරුන් ඒවායේ ඉදිරියෙන් ම සිටියා. ඔවුන් වින්දිත ප්‍රජාව වූ නිසා එය ඉතාමත් බලවත් වුනා. බොහෝ මුස්ලිම් පිරිමින් අපට උදවු කරන්නට සූදානමින් හිටියත් ඔවුන්ගේ ආරක්ෂාව ගැන ඔවුන් බිය වුනා. මේ කාලයේදී ලේ පරිත්‍යාග කරන්න බොහෝ මුස්ලිම් පිරිමි සූදානමින් සිටියත් මොන ප්‍රතිවිපාක ලැබෙයි ද කියා ඔවුන් බිය වූ නිසා එළියට එන්නට පැකිළුනා. එනිසා ඔවුන්ට ආරක්ෂාව දෙන්න කියා අපි පොලිසියෙන් සහ පූජකවරුන්ගෙන් ඉල්ලා සිටියා. රෝහලට ඇවිත් ලේ පරිත්‍යාග කරන්න පොලිසියෙන් ඔවුන්ට ආරක්ෂාව දුන්නා.'

තමතමන් අතරේ සංවිධානය වී පොදු අරමුණක් සඳහා වැඩ කරන්නට මේ සිවිල් සමාජ සංවිධානවල සාමාජිකයින්ට නිදහස තිබෙන බවත් ඔවුන් අතරේ සම්බන්ධීකරණය සඳහා ඔවුන් ක්‍රමවේදයක් සාදගෙන තිබෙන බවත් මේ අදහස්වලින් අපට පෙනී යයි. විවිධ කටයුතු සඳහා මේ සාමාජිකයින්ට තනි පොදු සංවිධාන ද පවතින අතර, එක් එක් සාමාජිකයා සහ සිවිල් සමාජ සංවිධානයට ඇති හැකියාවන් කවරේද යන්න ගැන ද ඔවුන්ට මනා අවබෝධයක් තිබේ. හදිසි අවස්ථාවකදී එක් වී කඩිනමින් ඔවුන් අතරේ සම්බන්ධීකරණය කරගැනීමට මෙය ඔවුන්ට ඉවහල් වී තිබේ.

කාන්තා කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට අමතරව සිවිල් සමාජ සංවිධාන වැඩිහිටියන් සහ එල්ජීබීටී ප්‍රජාව සම්බන්ධ ගැටළු පිළිබඳව ද වැඩ කරති. සමාජයේ සෑම කණ්ඩායමක් ම, විශේෂයෙන් කොන්වූ ප්‍රජාවන් තම ව්‍යාපෘති සඳහා ඇතුළත් කරගැනීම වැදගත් බවත් ඉන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබාගත හැකි බවත් සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූවෝ පැවසූහ. එසේම, කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ එල්ජීබීටී ප්‍රජාව වැනි ආන්තිකරණයට ලක් වූ පිරිස් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම තුළින් තම සංවිධානයට වැඩි ව්‍යාපෘති සංඛ්‍යාවක් සොයාගැනීමට හැකි වන බව ද ඔවුහු සඳහන් කළහ.

එසේම, නිසි ඇගයීමක් නොකර ප්‍රජාවේ යම් යම් කොටස්වලට ප්‍රමුඛතාවය දෙන්නට යෑමෙන් ඇතැම් කොටස් මගහැරී යාමට ඇති ඉඩ සම්බන්ධයෙන් එක් සංවිධානයකින් සඳහන් කරන ලදී. මේ පිළිබඳව ඔවුහු මෙසේ පැහැදිලි කළහ: 'වසංගතය සහ ආර්ථික අර්බුදය කාලේ වැඩිහිටි ජනයා සෑහෙන පීඩාවක් අත්වින්දා. විශේෂයෙන්ම ඔවුන්ට ගෙවපු මාසික දීමනාව නැවැත්තුවා. ඒ අයට අප වෙත එන්න ක්‍රමයක් තිබුණේ නැහැ. ඒ අය වෙත ළඟා වී අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබාදෙන්න අපි උත්සාහ කළා. ඒ වාගේම වියළි ආහාරද්‍රව්‍ය බෙදා දෙනකොට වැඩිහිටි සහ ආබාධ සහිත අයට මුල්තැන දෙන්න කියා දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් අපට උපදෙස් දුන්නා. මේ සමගින් ළමයින් මෙම සහනවලින් මගහැරී ගියා.'

මුස්ලිම් කාන්තාවන් සම්බන්ධයෙන් සඳහන් කරමින් එක් සිවිල් සමාජ නියෝජිතයකු පැවසුවේ: 'නඩත්තු ඉල්ලා සිටි කාන්තාවන් මේ ආර්ථික අර්බුද කාලෙ බොහොම අමාරුකම්වලට මුහුණ දුන්නා. තමන්ගේ ජීවනෝපාය කරගන්න

බැරි වුන බව කියමින් පිරිමින් මේ කාලෙ නඩත්තු ගෙවීම මගහැරියා. ප්‍රාදේශීය ලේකම් හරහා සහ ගමේ බලවත් පුද්ගලයින් හරහා උදවු අරගෙන තමන්ගේ නඩත්තු දීමනා ලබාගන්න අපි ඇතැම් කාන්තාවන්ට උදවු කළා. ඇතැම් පිරිමි කාති අධිකරණ නියෝගය පිළිපදිමින් ගෙවියයුතු මුදල් ගෙවුවා.'අවදානමට ලක්වූ තැනැත්තන්ට සහය ලැබෙන බව සහතික කරගැනීමට ඇතැම් අවස්ථාවලදී සම්බන්ධතා සහ බලපෑම් පාවිච්චි කරන්නට සිදුවන බව පෙන්නුම් කරන මෙම සිදුවීම් සිත් උනන්දුකරවනසුළු ය.

ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් තවත් සංවිධානයකින් මෙසේ සඳහන් කරන ලදී: 'ආබාධ සහිත අය මේ කාලේ හරියට දුක් විඳිනවා. සෞඛ්‍ය අර්බුදය තාමත් පවතින නිසා බෙහෙත් සොයාගැනීමේ දී ඒ අය දුෂ්කරතාවලට මුහුණ දෙනවා. කෘතිම අත් පා තියෙන අය ඒවා නිරන්තරයෙන් නඩත්තු කරන්න ඕනි. ඒ අවශ්‍ය දේවල් හරියට රෝහලෙන් ලැබෙන්නේ නැහැ. එතකොට තුවාල, ආසාදන ඇතිවෙනවා. ඒ වගේම වෙනත් දුෂ්කරතා තියෙන අයත් ආබාධිතයින් වෙනවා. උදාහරණයක් විදිහට නිසි ඖෂධ නැති නිසා දියවැඩියා රෝගීන් අන්ධ වෙනවා. මෙහේ අපි එහෙම සිදුවීම් දැක්කා.' ආර්ථික අර්බුදය පවතින අතරතුර මෙය වැඩි වැඩියෙන් අවධානය යොමු කළයුතු කරුණක් බවට පත්වෙමින් පවතින බව සහභාගි වූ අනෙක් අය ද සඳහන් කළහ.

'එල්ජීබීටී පුද්ගලයින් දැන් හරිම ක්‍රියාකාරියි. ඔවුන් කණ්ඩායමක් විදිහට වැඩ කරනවා. සමාජය තවමත් ඔවුන් පිළිග න්න මැළි වුනත් අපේ සංවිධාන ඔවුන්ට බෙහෙවින්ම සහයෝගය දක්වනවා. මෙහේ ඔවුන්ගේ කණ්ඩායම තවමත් ලියාපදිංචි වී නැහැ, ඒත් ඔවුන් හරිම ක්‍රියාකාරියි. අපේ රැස්වීම්, සාකච්ඡා, සහ වැඩමුළුවලට අපි ඔවුන්ට ආරාධනා කරනවා. එල්ජීබීටී තරුණ පිරිස් අපේ වැඩමුළුවලට සහභාගි වෙනවා. එයාලාගේ රැස්වීම්වලටත් අපිට ආරාධනා කරනවා. අපි එකතුවෙලා වීථි නාට්‍ය හෙම කරනවා. තනි පුද්ගලයින් වශයෙනුත් අපි ඒ අයට උදවු කරනවා. සමරිසි යුවල්වල මවුපියන් ඔවුන්ව පිළිගත්තේ නැති අවස්ථා ගැන සිදුවීම් කිහිපයක් මඩකලපුවේ සිදුවුනා. අපි ඒ පවුල් එක්ක කථා කරලා මේ යුවල්වලට ආරක්ෂිත පරිසරයක ඉන්න පුළුවන් බව සහතික කරගත්තා.' යනුවෙන් ඔවුහු එල්ජීබීටී ප්‍රජාව සම්බන්ධයෙන් සඳහන් කළහ. අපට එල්ජීබීටී ප්‍රජාව වෙත ළඟාවීම දුෂ්කර වූයේ ද මේ බොහෝ කණ්ඩායම් අවිධිමත් හා ලියාපදිංචි නොවූ කණ්ඩායම් වීම හේතුවෙන් විය හැකිය. විධිමත් සංවිධානයක් වශයෙන් ලියාපදිංචිවීමේ එක් වාසියක් නම් ඔවුන්ට අරමුදල් සහ අනෙකුත් ආධාර කරා ප්‍රවේශවන්නට හැකි වීමයි. කෙසෙ-ීනමුත් එහි ඇති අන්තරාය පිළිබඳව ද අප දැනුවත් ය.

සිවිල් සමාජ ප්‍රජාවෙන් මෙන්ම රාජ්‍යයෙන් ද එල්ලවන බොහෝ අභියෝගවලට මුහුණ දෙති. ඉලක්ක කණ්ඩායම්වලි-න් ද ඔවුන් අභියෝග එල්ලවන අවස්ථා තිබේ. උදාහරණ වශයෙන්, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සම්බන්ධයෙ-න් ඔවුන්ගේ ව්‍යාපාරය සෑම මුස්ලිම් කාන්තාවක් විසින්ම සාදරයෙන් පිළිනොගත් බව එක් සිවිල් සමාජ සංවිධානයක් සඳහන් කරන ලදී. 'මේක ඒ අයගේ ප්‍රජාවට අවශ්‍ය දෙයක් නොවේ කියලා ඔවුන් ඒකට ප්‍රතිරෝධය දැක්වුවා. ඒනිසා අපේ වැඩමුලුවලට සහභාගි නොවී, අනෙක් අයටත් එන්න එපා කියලා කියන්න ඔවුන් පෙළඹුනා.' කෙසේනමුත් කාලයත් සමගින් මේ තත්වය වෙනස් වී තිබේ.

සිවිල් සමාජ ප්‍රජාවෙන් මෙන්ම රාජ්‍යයෙන් ද එල්ලවන බොහෝ අභියෝගවලට මුහුණ දෙති. ඉලක්ක කණ්ඩායම්වලි-න් ද ඔවුන් අභියෝග එල්ලවන අවස්ථා තිබේ. උදාහරණ වශයෙන්, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සම්බන්ධයෙ-න් ඔවුන්ගේ ව්‍යාපාරය සෑම මුස්ලිම් කාන්තාවක් විසින්ම සාදරයෙන් පිළිනොගත් බව එක් සිවිල් සමාජ සංවිධානයක් සඳහන් කරන ලදී. 'මේක ඒ අයගේ ප්‍රජාවට අවශ්‍ය දෙයක් නොවේ කියලා ඔවුන් ඒකට ප්‍රතිරෝධය දැක්වුවා. ඒනිසා අපේ වැඩමුලුවලට සහභාගි නොවී, අනෙක් අයටත් එන්න එපා කියලා කියන්න ඔවුන් පෙළඹුනා.' කෙසේනමුත් කාලයත් සමගින් මේ තත්වය වෙනස් වී තිබේ.

එක් සිවිල් සමාජ සංවිධානයක් රජයෙන් එල්ලවන ප්‍රතිරෝධය ගැන මෙසේ සඳහන් කරන ලදී: 'රජයේ නිලධාරීන් කලින් අපේ වැඩවලට සහය දැක්වුවේ නැහැ. අපේ පසුබිම ගැන ඒ අයට තිබුණේ සැකයක්. ඒත් දැන් ඒ අය අපි එක්ක හරිම මිත්‍රශීලීයි. අපිත් එක්ක විවෘතව ගැටළු සාකච්ඡා කරනවා. අපි ව්‍යාපෘති කරනකොට එයාලා සැලකිල්ල යොමුකරන කරුණු ගැන අපිට කියනවා. මාසිකව අපිට රැස්වීම් වලටත් ආරාධනා කරනවා.'

ප්‍රාදේශීය රජයේ ආයතන සමගින් ඇති සබඳතාවය පිළිබඳ සඳහන් කරමින් එක් සිවිල් සමාජ සංවිධානයක් 'දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් අවුරුද්ද ආරම්භයේ පවත්වන වාර්ෂික රැස්වීමට ලියාපදිංචි වුනු රාජ්‍ය නොවන සං-විධානවලට ආරාධනා කරනවා. අප කරන වැඩ සම්බන්ධයෙන් සංකල්ප සටහනක් මේ රැස්වීමට ඉදිරිපත් කරන්න කියා අපෙන් ඉල්ලනවා. දැන් ආරාධනා කරන්නේ අරමුදල් තියෙන, දැනට ව්‍යාපෘති කරන රාජ්‍ය නොවන සංවිධා-නවලට විතරයි (ඒ අයට සංකල්ප සටහන් ඉදිරිපත් කිරීමට හැකි නිසා). අවුරුද්ද සඳහා අරමුදල් නොලබන රාජ්‍ය නොවන සංවිධාන ස්වේච්ඡාවෙන් වැඩ කරන්න කැමති වුනත්, එයාලා ළඟ ආකර්ෂණීය සහ අවශ්‍ය කරන ව්‍යාපෘති

තිබුණත් ඒ අයට ආරාධනා කරන්නේ නැහැ. ඒ වගේම, ලියාපදිංචි නොවූ ජාලවලටත් ආරාධනා කරන්නේ නැහැ. මේක අවාසිසහගත, බැහැරකරනසුළු සහ වෙනස්කොට සලකනසුළු ක්‍රියාවක් කියා අපි හැමෝම හිතනවා' යැයි සඳහන් කරන ලදී.

'සංකල්ප සටහන් යවන රාජ්‍ය නොවන සංවිධානත් බොහෝවිට ඒ සංකල්ප සටහනෙන් ඔබ්බට යන ක්‍රියාකාරකම්වල නිරත වෙනවා. ඒ අය කරන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මූලික සංකල්පීය රාමුවක් ලබාදීම විතරයි. සමහර වේලාවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් මේ ගැන අපෙන් ප්‍රශ්න කරලා අපි සංකල්ප සටහනින් එහාට ගිහින් වැඩ කරන බව කියා අපව අධෛර්යමත් කරනවා. අපි අනපේක්ෂිත ගැටළු සම්බන්ධයෙනුත් වැඩ කරන නිසා එහෙම සංකල්ප සටහනක් යවන්න අමාරුයි. එහෙම වුනොත් සංකල්ප සටහනින් අපව සීමා වෙනවා. එනිසා සමහර සංවිධාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සංකල්ප සටහන් යවන්නේ නැතුව තනියෙන් වැඩ කරනවා. එනිසා සමහර රාජ්‍ය නොවන සංවිධාන සහ ජාල  මගහැරී යනවා.'

සිවිල් සමාජ සංවිධානවලින් ලැබෙන සංකල්ප සටහන් අනුව රජයේ නිලධාරීන් ඔවුන්ගේ කාර්යයන් සැලසුම් කරනු ලැබේ. රජය සිවිල් සමාජ  සංවිධාන ඉටුකරන කාර්යභාරය මත මුළුමනින් ම නොයැපුනත්, සිවිල් සමාජ සංවිධාන ක්‍රියාත්මක කරන ව්‍යාපෘති කවරේදැයි අවදියෙන් සිට උචිත පරිදි රජයේ ව්‍යාපෘති සැලසුම් කිරීමෙහි වාසියක් තිබේ. සිවිල් සමාජ සංවිධාන ඉලක්ක කළ ස්ථාන හැර අවශ්‍ය වෙනත් ස්ථාන හා අවශ්‍යතා සඳහා සම්පත් යෙදවීමට ඉන් ඉඩ ලැබේ. සිවිල් සමාජ සංවිධානවලින් සංකල්ප සටහන් ලැබෙන තෙක් සිට රජයේ නිලධාරීන් විසින් ව්‍යාපෘති සැලසුම් නොකරන බව අපට සිතිය හැකිය. ඒ වෙනුවට සිදුවනු ඇත්තේ මුදල් අසමාන ලෙස බෙදීයාම වැලැක්වීම සඳහා ඔවුන් සිවිල් සමාජ සංවිධානවල ව්‍යාපෘති අනුව ඔවුන්ගේ ක්‍රියාකාරකම් උචිත පරිදි හැඩගස්වාගැනීමක් ය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් පිළිබඳව එක් ප්‍රතිචාර දක්වන්නෙක් මෙසේ සඳහන් කරන ලදී: 'අපට ඕනි කරන්නේ අනුමැතිය විතරයි. එයාලා අපේ වැඩ කරලා දෙන්න ඕනි නැහැ. හැබැයි අපි එයාලාගේ වැඩ කරලා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා (කේන්ද්‍රීක කණ්ඩායම් සාකච්ඡාවේ අනෙක් අය එකඟ වූහ). දැන් එයාලාගේ රැස්වීම්වල අපේ සංවිධානවල නම් කියැවෙනවා, අපේ වැඩට පිළිගැනීමක් ලැබෙනවා. මිනිස්සු ගැටළු අරන් එයාලා ළඟට ගියාම ඒ අයව අපි වෙත යොමු කරනවා. සමහර සිදුවීම්වලදී ප්‍රශ්න අරන් එයාලා හමුවෙන්නේ එන පුද්ගලයින් ගැන වඩාත් ගැඹුරු අවබෝධයක් වුවමනා වුනාම එයාලා අපෙන් අහනවා. රාජ්‍ය නොවන සංවිධාන බොහෝ විට එක් එක් සිදුවීම වෙන වෙනම ගන්න නිසාත්, අපි ළඟ වෙනම සිද්ධි ගොනු පවත්වාගන්න නිසාත් තමයි අපෙන් අහන්නේ. සමහර වේලාවට රජයේ නිලධාරීන් නිශ්චිත කරුණු ගැන අපෙන් විමසනවා. ඒ වාගේම දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාධරයින් විදිහට අපි වැඩ කරන නිසා කාලෙන් කාලෙට මාරුවීම් ලබලා කාර්යාලෙට එන අයට අපි මත යැපෙනවා.  එකම තොරතුර දෙවරක් ඇතුළු නොකරන්න කියලා අපි ඒ අයගෙන් ඉල්ලාසිටියා.'

රජයේ නිලධාරීන් බිම් මට්ටමේ වැඩ කරන සිවිල් සමාජ සංවිධානවල විශේෂඥතාවය මත යැපෙන්නේ ඇයිදැයි වැදගත් කරුණක් මේ සහභාගිවන්නා විසින් ඉස්මතු කර තිබේ. එසේම, මෙවැනි ප්‍රාදේශිය රාජ්‍ය ආයතනවල නිලධාරීන් කලින් කලට ස්ථානමාරු ලැබීමත් සමගින් එය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුමට ක්‍රියාකාරීත්වයට බලපාන අන්දම සහ එම ප්‍රාදේශීය රජයේ නිලධාරීන් රාජ්‍ය නොවන සංවිධාන මත යැපීමට මගපෑදී ඇති අන්දමත් එහි සඳහන් වී තිබේ.

සිවිල් සමාජ සංවිධානයෙක් මෙසේ සඳහන් කරන ලදී: 'ස්ථානමාරුවක් ලැබිලා අළුත් නිලධාරියෙක් ආවාම රාජ්‍ය නොවන සංවිධාන කණ්ඩායම් විදිහට ගිහින් ඒ අයව හමු වෙලා තමන්ව හඳුන්වා දෙනවා. ස්ථානමාරු නිතරම සිදු නොවුනත් එහෙම සිදුවන වේලාවට අපේ ක්‍රියාවලිය ආයෙත් මුලසිට පටන් ගන්න වෙනවා. අපි කරන වැඩ පැහැදිලි කර දීලා ඒ නිලධාරියාගෙන් අපි අපේක්ෂා කරන දෙය පැහැදිලි කරනවා. අපි රජයේ නිලධාරියෙකුට පුහුණුව දීලා මෙහේ වැඩ කෙරෙන හැටි එයාට හුරුපුරුදු වීගෙන එනකොටම ඒ නිලධාරියා ස්ථානමාරු වුනාම අපිට ඒ ක්‍රියාවලිය ආයෙත් මුල ඉඳලා පටන් ගන්න වෙනවා.' මෙහිදී පුහුණුව යනුවෙන් අදහස් කළේ කුමක්දැයි පැහැදිලි කරන මෙන් අප ඉල්ලා සිටි විට ඔවුන් සඳහන් කළේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, ළමා අයිතිවාසිකම්, වාර්තාකරණය සහ යෝජනා ලිවීම වැනි සංකල්ප පිළිබඳව හැඳින්වීමක් ලබාදීම එම පුහුණුවලට ඇතුළත් බවයි. රජයේ නිලධාරීන් සිවිල් සමාජ සංවිධානවලින් පුහුණුව ලබාගැනීම සිත් අදනාසුළුය.

'කාන්තා සංවර්ධන නිලධාරී සහ අනෙකුත් නිලධාරීන් සංවර්ධන ව්‍යාපෘති ගැන අධීක්ෂණය කරලා අතිරේක දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තා කළ යුතුයි. මේ බොහොමයක් නිලධාරීන් ඒ සඳහා අපි මත යැපෙනවා. ඒ ව්‍යාපෘති ගැන නිශ්චිත තොරතුරු සහ ප්‍රගතිය සම්බන්ධයෙන් ඒ අය අපෙන් අහනවා (ඇතැම් ව්‍යාපෘති රාජ්‍ය නොවන සංවිධානවලින් අරමුදල් ලබන, රජයේ නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක්වන ව්‍යාපෘති වේ). අපට අමතලා ප්‍රගතිය ගැන

තොරතුරු ලබාගන්නවා. තමන්ගේ ඉහළ නිලධාරීන්ට වාර්තා කිරීමේදී ඒ අය සෑහෙන දුරකට අපි මත යැපෙනවා' යනුවෙන් සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ තවත් අයෙක් පැවසීය.

තවත් සිවිල් සමාජ සංවිධානයක් ඊට මෙසේ එකතු කරන ලදී: ' දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 'දිස්ත්‍රික් සංවර්ධන රැස්වීම්' (සම්බන්ධීකරණ රැස්වීම්) කියලා රැස්වීම් වර්ගයක් නිතර පවත්වනවා. ප්‍රදේශයේ සියළුම රජයේ නිලධාරීන් මේ රැස්වීමට කැඳෙවුවත් අපිට ආරාධනා කරන්නේ නැහැ. අපි මේ ගැන ඇහුවාම කියන්නේ රාජ්‍ය නොවන සංවිධානවලට ආරාධනා කරන්න කියලා චක්‍රලේඛයේ සඳහන් වෙලා නෑ කියලායි. අපිටත් මේ රැස්වීමට ආරාධනා කළොත් අපට සෑම දෙපාර්තමේන්තුවකින්ම සියළුම රජයේ නිලධාරීන් හමුවෙලා අපේ ගැටළු ඒ අය එක්ක සාකච්ඡා කරන්න පුළුවනි. ඒ අය අපිට ආරාධනා කරන්නෙ නැත්තේ රැස්වීම එයාලාගෙ න්‍යායපත්‍රයෙන් පිට නොයන බව සහතික කරගන්නයි.'

ඉන් පසුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ සිවිල් සමාජ සංවිධානවල අරමුණු සහ ක්‍රියාකාරකම් සඳහා සහය දක්වන්නේදැයි ප්‍රශ්නයක් විමසන ලදී. මෙහිදී විමසුවේ පළාත් අමාත්‍යාංශ සහ දේශපාලඥයින් සම්බන්ධයෙන් යැයි සම්මුඛසාකච්ඡාවට ලක්වූවෝ සිතූහ. ඒ අනුව එක් අයෙක් මෙසේ පිළිතුරු දුනි: 'මෙහේ අපිට මන්ත්‍රීවරු පස් දෙනෙක් ඉන්නවා. එයාලාගෙන් වැඩක් නැහැ. එයාලා මෙහේ එන්නෙ එයාලාට අවධානය වුවමනා වුනාමයි. එයාලා අපේ වැඩවලට සහය දෙන්නේ නැහැ. එයාලා එක්ක අපේ ගැටළු කථා කරනවට වඩා කොළඹ අමාත්‍යාංශෙන් (මධ්‍යම රජයේ) හමුවෙන්න වෙලාවක් ඉල්ලාගන්න එක ලේසියි. අපේ ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් උදවු කරන්නේ නැහැ.' සිවිල් සමාජ සංවිධාන සමගින් වැඩ කිරීමට වැඩි සූදානමක් ඇත්තේ කුමන මට්ටම්වල බලධාරීන් ද යන්න මෙයින් පැහැදිලි වේ.

පළාත් බලධාරීන් මධ්‍යම රජයේ බලධාරීන්ට වඩා සමීප බැවින් සහ ප්‍රාදේශීය කරුණු සමගින් වඩාත් සම්බන්ධ බැවින් ඔවුන් සමගින් වැඩ කිරීමට සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූවෝ කැමැත්ත පල කළහ. එහිදී බාධකය වී ඇත්තේ පළාත් බලධාරීන් හා දේශපාලඥයින් සිවිල් සමාජ සංවිධාන සමගින් සන්නිවේදනය නොකිරීම බව හඳුනාගත හැකිය. පළාත් බලධාරීන් සහ දේශපාලඥයින් සිවිල් සමාජ සමගින් සම්බන්ධ කිරීමට යන්ත්‍රණයක් තිබෙන්නේ නම් සිවිල් සමාජ සංවිධානවලට වඩාත් ඵලදායි ලෙස ප්‍රජාවන්හි වැඩ කළ හැකිය.

ඔවුන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවලට යොදවන සම්පත් සම්බන්ධයෙන් සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නන්ගෙන් විමසන ලදී. සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය යන දෙපාර්ශවයේම සම්පත් වෙන්කිරීම සම්බන්ධයෙන් මෙම ප්‍රශ්නයෙන් අවධානය යොමු විය. මෙය හඳුනාගැනීමේ අවශ්‍යතාවය පැන නැගුණේ සිවිල් සමාජ සංවිධාන සමගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් සම්බන්ධීකරණය කිරීම සහ ඒ මත යම් මට්ටමක යැපීමක් පවතින බවක් පෙනෙන්නට තිබීම සමගිනි.

'හැමවිටම ඒක වෙනම තමයි සිද්ධ වෙන්නේ. ඒ අය එයාලාගේ වියදම් ඉහළ නිලධාරීන්ට පෙන්වන්න ඕනි. ඒනිසා ඒ අය අපෙන් සම්පත් ඉල්ලන්නේ නැහැ,' යනුවෙන් සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූ එක් අයෙක් පැවසීය. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ අයට ප්‍රාදේශීය සභා ගැන කථා කරන්නට වුවමනා වූ බැවින් සාකච්ඡාව වෙනත් අතකට යොමුවිය. 'දේශපාලන පක්ෂවල බලපෑම වැඩි නිසා ඒ අය සම්පත් වෙන් කරගන්නේ එයාලාගේ යහපතට. අපි (එනම් එම සිවිල් සමාජ සංවිධානය, සහභගි වූ කණ්ඩායම නොවේ) අපේ වැටුප පක්ෂෙට දෙනවා. ප්‍රාදේශීය සභා වෙනත් ආකාරවලින් අපි මත යැපෙනවා. සමහර වේලාවට අයවැයක් හරි මූල්‍ය වාර්තාවක් හරි හදගන්න එයාලාට අපේ උදවු ඕනෙ වෙනවා.'

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් එක් සහභාගිවූවෙක් මෙසේ කීය: 'අපි තාක්ෂණ භාවිතයට හුරු වුනා. අපි සූම් රැස්වීම් තියන්න ගත්තා. අපි අතරේ සම්බන්ධීකරණය තවත් ශක්තිමත් වුනා. උදහරණ විදිහට, මට ගෙදරින් දුර වෙනත් කොට්ඨාසෙක වැඩ කරන්න තියෙනවා නම් (එහේ ඉන්න) අපේ කෙනෙක්ට මම කෝල් කරනවා. මහ රෝහලේ ස්ත්‍රීපුරුෂ සමාජ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්ව අංශයේත් මෙහෙම සිදුවෙනවා. ඒ අංශ 2004 දී පටන් ගත්තේ ඩොක්ටර් රනීසන් කියන මනෝවෛද්‍යතුමා. ඒක, ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩකරන සෞඛ්‍ය සේවකයින් අතරේ ඇතිකරගත් ජාලයක්. කාත්තන්කුඩි, මන්මුනෙයි සහ එරාවූර් කොට්ඨාසවල ඒක ක්‍රියාත්මකයි.' වැඩිදුර තොරතුරු සඳහා රජයෙන් ක්‍රියාත්මක වන මිතුරු පියස වැඩසටහනේ වෙබ් අඩවියට යොමුවන මෙන් ඔවුහු අපට පැවසූහ.

මුහුණදුන් අභියෝග සම්බන්ධයෙන් අන් අය මේ කරුණු එකතු කළහ: 'අපිට ප්‍රවාහන ගැටළු තිබුණා. ඉන්ධන අර්බුදය සහ පොදු ප්‍රවාහන සේවා අඩුවීම නිසා අපට විවිධ ස්ථානවලට යෑමට බැරි වුනා. අර්බුද කාලෙ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය ඇතුළත් කරලා සංකල්ප සටහන දින දෙකක් ඇතුළත වෙනස් කරලා දෙන්න කියලා දිස්ත්‍රික් ලේකම් කාර්යාලෙන් අපට කිව්වා. එය මිනිසුන් විසින් නිර්මාණය කළ ආපදවක් නිසා බොහෝ ආධාර ලබාදෙන ආයතන අපේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කළා.'

උද්ගත වූ අවස්ථාවට සරිලන අන්දමින් ව්‍යාපෘති හැඩ ගස්වාගැනීමට ඔවුන්ට නොහැකි වූ අන්දමත්, මුලින් සැලසුම් කළ ආකාරයටම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නට වූ අන්දමත් පිළිබඳව තවත් අයෙක් අදහස් පල කරන ලදී. 'ප්‍රතිලාභීන්ට වැසිකිලි ඉදිකිරීම සඳහා සංවේදීකරණ ව්‍යාපෘතියකට අපට මුදල් ලැබී තිබුණේ. ආහාර අර්බුදයට මුහුණදීමට යනුවෙන් සංකල්ප සටහන වෙනස් කරන්න කියලා අපෙන් දිස්ත්‍රික් ලේකම් ඉල්ලා සිටියත් බ්‍රිතාන්‍ය ආධාරලබාදෙන්නන් ඒක ප්‍රතික්ෂේප කළා. කන්න කෑම නැති මිනිස්සුන්ට වැසිකිලි හදලා දෙන්න අපට සිද්ධ වුනා.'

අවසාන වශයෙන් එක් සිවිල් සමාජ සංවිධානයක් මෙසේ සඳහන් කරන ලදී: 'අපිටත් උද්ධමනය නිසා ගැටළු ඇතිවුනා. අපට මුදලුයි ව්‍යාපෘති සැලසුමයි ලැබුණා. ඒත් ඒ ඉලක්කයට අපිට යන්න බැරි වුනා. මිලගණන් ඉහළ ගියා. අපේ අත් බැඳලා. වැටුප් වැඩි නොවුනාට බඩුමිල ඉහළ ගිහින්. එහෙම දාලා යන්න බැරි නිසා අපට වෙන රැකියාවලට යන්නත් විදිහක් නැහැ.'

## රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන දිස්ත්‍රික් සම්බන්ධීකාරක

රටේ සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකටම රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන දිස්ත්‍රික් සම්බන්ධීකාරකයෙකු බැගින් සාමාන්‍යයෙන් පත් කෙරේ. මෙම සම්බන්ධීකාරක ජාතික රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය දිස්ත්‍රික් මට්ට-මේ දී නියෝජනය කරයි. දිස්ත්‍රික්ක මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය කිරීම සහ රටේ සංවර්ධනයට ඔවුන්ගේ පූර්ණ සහය ලබාගැනීම මෙම සම්බන්ධීකාරකයින්ගේ කාර්යභාරය වේ. රාජ්‍ය නොවන සංවිධාන ගැටළු සම්බන්ධයෙන් තීරණ ගැනීමට ඔවුන් ඒවා මූලස්ථාන කාර්යාලය වෙත යොමු කළයුතු වේ.

රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් රජයේ සම්බන්ධීකරණය අවබෝධ කරගැනීම සඳහා අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගණනාවක් සමගින් සම්බන්ධ වූයෙමු. රාජ්‍ය නොවන සංවිධාන වැඩියෙන්ම සහ අඩුවෙන්ම ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්ක අපි මේ සඳහා තෝරාගත් අතර සිංහල කථා කරන සහ දෙමළ කථා කරන වශයෙන් නියැදි තෝරාග න්නා ලදී. ඒ අනුව මඩකලපුව, පුත්තලම, වනාතවිල්ලුව, පොලොන්නරුව සහ අකුරණ දිස්ත්‍රික් ලේකම් කාර්යාල අප සමගින් සම්බන්ධ වී පරිත්‍යාගශීලී ලෙස ඔවුන්ගේ වැඩකටයුතු පිළිබඳ තොරතුරු අප සමගින් බෙදාගත්හ.

මුලින්ම අපි මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධ කරගත්තෙමු. ආපදා කළමනාකරණ අංශයේ සංවර්ධන නිලධාරීන් අපේ ආරාධනාව පිළිගෙන ඔවුන්ගේ කාලය මිඩංගු කරමින් අපට තොරතුරු ලබාදෙන ලදී. තමන්ගේ රාජකාරිය වඩාත් හොඳින් ඉටුකිරීමට උදවු වන පරිදි කටයුතු සංවිධානය කර ගැනීම සඳහා ප්‍රදේශයේ රාජ්‍ය නොවන සංවිධාන සමගින් ඔවුන් නිරන්තරයෙන් සම්බන්ධ වන බව ඔවුහු පැවසූහ. ආපදා කළමනාකරණ අංශයේ සංවර්ධන නිලධාරීන් ආපදා සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීමේ සිට ප්‍රදේශයේ ආපදාවන්හිදී සහන සංවිධාන දක්වා ඔවුන්ගේ කාර්යභාරය කුමක්දැයි අපට පැහැදිලි කර දුන්හ. එසේම ආපදා කළමනාකරණය සම්බන්ධ ව්‍යා-පෘති ක්‍රියාත්මක කරන රාජ්‍ය නොවන සංවිධාන සමගින් ඔවුන් සම්බන්ධීකරණය කරන ආකාරය පිළිබඳව ද ඔවුහු පැහැදිලි කළහ. රාජ්‍ය නොවන සංවිධානවල අරමුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් ද මෙම නිලධරීහු සොයාබලති. දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන්ට ප්‍රමාණවත් මුදලක් නොලැබුණේ නම්, ඔවුන් ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය දීමේ දී රාජ්‍ය නොවන සංවිධාන සමගින් සම්බන්ධීකරණය කරමින් මහජනයාට අත්‍යාවශ්‍ය ව්‍යාපෘති හඳුනාගෙන ඒවා සඳහා මූල්‍ය ආධාර සොයනු ලැබේ. එම කටයුතු තමන්ගේ බලවරමට ඇතුළත් වන බව රාජ්‍ය නොවන සංවිධාන සහතික කරගනු ලැබේ.

රාජ්‍ය නොවන සංවිධාන සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතරේ සම්බන්ධීකරණය වාර්ෂිකව සැලසුම් කෙරෙන්නේ වසර ආරම්භයේ පැවැත්වෙන රැස්වීමක් හරහා ය. දිස්ත්‍රික් ලේකම් කාර්යාල රාජ්‍ය නොවන සංවිධානවලින් ක්‍රියා-ාත්මක සැලසුම් ඉල්ලා සිටින අතර, එකම දෙයක් දෙවරක් සිදුකිරීම සහ ව්‍යාකූලත්වය වලක්වාගනිමින් ඒ අනුව ඔවුන්ගේ සැලසුම් සකසනු ලැබේ. රාජ්‍ය නොවන සංවිධාන තම ක්‍රියාත්මක සැලසුම් වෙනස්කරන්නේ නම් සංවර්ධන ව්‍යාපෘති සහ අරමුදල් ඒ අනුව සංවිධානය කරගැනීම සඳහා ඔවුන් නොපමාව ඒබව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දැනුම්දිය යුතුය.

කෙසේනමුත් රාජ්‍ය නොවන සංවිධාන එතරම් ක්‍රියාත්මක නොවන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමි-න් රාජ්‍ය නොවන සංවිධාන සිදුකරන කාර්යයන් සම්බන්ධයෙන් ඉහළ නිලධාරීන්ට වාර්තා කිරීම සඳහා වෙනම සම්බන්ධීකාරක නිලධාරියකු පත්කිරීම අවශ්‍යබවක් නොපෙනේ. උදහරණ වශයෙන් පුත්තලම-වනාතවිල්ලුව දිස්ත්‍රික්

ලේකම් කාර්යාලය ගතහොත් සියළුම සංවර්ධන නිලධාරීහු එම ප්‍රදේශයේ රාජ්‍ය නොවන සංවිධාන සමඟින් සම්බන්ධීකරණය කරති. රාජ්‍ය නොවන සංවිධානයක් කාන්තාවන් සම්බන්ධයෙන් ව්‍යාපෘතියක් සමඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ආවොත් ඔවුන්ගේ කාන්තා සවිබලගැන්වීමේ අංශය සමඟින් එම සංවිධාන සම්බන්ධ කර දෙනු ලැබේ. අකුරණ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරීන් සඳහන් කළේ අවශ්‍යතාවයක් පැන නැගුණහොත් ඔවුන්ට දිස්ත්‍රික් ලේකම් සමඟින් සන්නිවේදනය කර සම්බන්ධීකාරකයකු පත් කරගත හැකි බවත් දැනට එම තනතුර පුරවා නැති බවත් ය.

එම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන බැවින් පොලොන්නරුව ප්‍රදේශයේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවල විස්තීර්ණ ලැයිස්තුවක් ග්‍රාමසේවකවරුන් විසින් පවත්වාගෙන යන බව පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සඳහන් කරන ලදී. එහිදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අධීක්ෂක කාර්යභාරයක් සිදුකරයි. ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් දත්ත ලබාගැනීමට සහ රාජ්‍ය නොවන සංවිධානවල ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය වන විට එම සංවිධාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟින් සම්බන්ධ වෙති. අවශ්‍ය වන වේලාවන්හි රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාපෘති සඳහා මිනිස් බලය ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් සපයයි. සංවර්ධන කටයුතු සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන්ම පැන නගින ගැටළු සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මාසික වාර්තා ඉදිරිපත් කරති.

ආර්ථික අර්බුදය අවස්ථාවේ කඩිනමින් අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල රාජ්‍ය නොවන සංවිධානවල සහය පැතූහ. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා අරමුදල් ලබාදුන්හ. ඒ අන්දමින් අර්බුදය සඳහා ප්‍රතිචාර දැක්වීම ඔවුන්ගේ කාර්යයන් අතරට ඇතුළත් නොවන ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන මිනිස් බලය සැපයූහ. මුදල් ලබා දීමට නොහැකි ඇතැම් සංවිධාන උපදේශනය සහ උපදේශක සේවා ස්වේච්ඡාවෙන් ලබාදීමට ඉදිරිපත් වූහ. අන්ත දුගීබවින් පීඩාවට පත් ස්ථාන සහ පුද්ගලයින් වෙත යමින් ඔවුන් උදවු ලබා දී තිබේ. උදහරණ වශයෙන් එවැනි රාජ්‍ය නොවන සංවිධානයක වැඩ කරන කාන්තාවන් පිරිසක් සඳහන් කළේ ඔවුන් ගෙයින් ගෙට ගොස් සහල් හා ධාන්‍ය එකතුකර එළිමහනේ ඒවායින් කැඳ සාදා කුසගින්නේ හා මන්දපෝෂණයෙන් පෙළුනු පුද්ගලයින්ට බෙදදුන් බවයි.

ජනතාව වෙත සේවා සැලසීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සතුටුදයක මට්ටමක සම්බන්ධීකරණයක් පවත්වාගන්නා බවයි. රාජ්‍ය නොවන සංවිධාන සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතරේ ඇති මේ අන්තර් රැඳියාව සම්බන්ධීකරණයේදී ප්‍රයෝජනවත් වේ. කෙසේනමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් රාජ්‍යන් නොවන සංවිධාන මත තදබල ලෙස යැපෙන බව අපගේ නිරීක්ෂණය විය.

# විශ්ලේෂණය

මෙම පර්යේෂණයේ පදනම වූයේ මූලික ප්‍රශ්න පහකි. ඒවා, සමීක්ෂණ ප්‍රශ්න සකස් කිරීමට සහ ගුණාත්මක පර්යේෂණයේදී විමසූ ප්‍රශ්න සඳහා බලපෑවේය. මෙම වාර්තාවේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ කොටස් හරහා මේ ප්‍රශ්න සවිස්තරාත්මකව ගවේෂණය කර ඇතත් මෙම කොටසින් එම ප්‍රශ්න සඳහා පිළිතුරු වශයෙන් සොයාගත් ප්‍රධාන කරුණු කෙටියෙන් ඉදිපත් කරනු ලැබේ.

1. ප්‍රචණ්ඩ සිදුවීම් ආමන්ත්‍රණයේ දී සිවිල් සමාජ සංවිධාන නිරූපණය කරන භූමිකාව කුමක්ද? ප්‍රාදේශීය මට්ටමින්? ජාතික මට්ටමින්? දැනට මෙම ගැටළු ඔවුන් ආමන්ත්‍රණය කරන්නේ කෙසේද?

මුලින් ම, ප්‍රාදේශීය පදනමින් ක්‍රියාත්මක වනවිට සහ ජාතික මට්ටමේ ව්‍යාපෘති හෝ ව්‍යාපාර ක්‍රියාත්මක කරනවිට සිවිල් සමාජ සංවිධාන කටයුතු කරන ආකාරයේ වෙනස්කම් තිබෙන බවක් පෙනෙන්නට තිබේ. ප්‍රාදේශීය මට්ටමේදී දක්වන ප්‍රතිචාර වඩාත් ඍජු ස්වභාවයක් ගන්නා අතර සිවිල් සමාජ සංවිධාන ප්‍රජාවන් සමග සමීපයෙන් වැඩ කරති. ජාතික මට්ටමේදී සිවිල් සමාජ සංවිධාන බොහෝදුරකට නිරත වන්නේ දැනුවත් කිරීමේ ව්‍යාපෘති හෝ ව්‍යාපාරවල බවක් පෙනෙන්නට තිබේ. ප්‍රාදේශීය මට්ටමින් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයක් ඇතිවන කල්හි දක්වන ප්‍රතිචාරය, අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සහිත ඉතිහාසය හේතුවෙන් අඩුම තරමින් ඒ සඳහා නිසි යන්ත්‍රණ ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්කවල හෝ හොඳ මට්ටමක පවතියි.

අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය එතරම් ම නිතර සිදු නොවන අනෙකුත් දිස්ත්‍රික්කවල ද මේ ක්‍රමය අනුගමනය කළ හැකිය. එසේ වුවත්, අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමට මනා ලෙස යන්ත්‍රණ ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්කවල පවා වඩාත් හොඳ සම්බන්ධීකරණයක් තිබීම වැදගත් වේ. ගුණාත්මක පර්යේෂණයේදී අපට දැනගන්නට ලැබුණු අන්දමට ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවන් තුළ පවා යම් ධුරාවලියක් තිබෙන බවක් පෙනේ. කේන්ද්‍රික කණ්ඩායම් සාකච්ඡාවලදී සිවිල් සමාජ සංවිධාන කාර්යමණ්ඩලය සඳහන් කළ අන්දමට කෝවිඩ්-19 වසංගත සමයේදී ආන්තීකරණය වූ ඇතැම් කණ්ඩායම්වලට (කාන්තාවන් සහ ගැහැණු ළමුන් උදාහරණයකි) ප්‍රමුඛතාවය දුන් අතර වැඩිහිටියන් වැනි ආන්තීකරණය වූ තවත් කණ්ඩායම් පසෙකට තල්ලු වී තිබේ.

ජාතික මට්ටමේ සිවිල් සමාජ සංවිධානවලින් මෙම සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූයේ සංවිධාන 20ක් පමණි. ප්‍රතිචාර දැක්වූ ඒ සංවිධාන අතරින් ඇතැම් ඒවාට ප්‍රාදේශීය කාර්යාල තිබේ. ප්‍රාදේශීය කාර්යාල ඇති සංවිධානවලට ප්‍රාදේශීය රජයේ කාර්යාල සමගින් සහ ප්‍රාදේශීය ප්‍රජාවන් සමගින් මනා සම්බන්ධතාවයක් පවතින අතර ඔවුන් ක්‍රියාත්මක වන්නේ ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන ක්‍රියාත්මක වන ආකාරයට බොහෝ සමාන අන්දමිනි.

යම් ප්‍රදේශයක කාර්යාලයක් පවත්වාගෙන නොයන, එම සංවිධානය සම්බන්ධ පුද්ගලයින් හරහා හදිසියේ ඇතිවන ප්‍රචණ්ඩ සිදුවීමක් හෝ ආපදාවක් පිළිබඳ දැනුවත් වී ආධාර ලබාදෙන හෝ පර්යේෂණ වාර්තා සකසන සංවිධාන තිබේ. ලැබෙන තොරතුරුවල විශ්වසනීයත්වය සම්බන්ධයෙන්, හෝ එම ක්‍රියාවලිය දීර්ඝ වීම වැනි ගැටළුවලට ඔවුන්ට මුහුණ දීමට සිදු වේ. රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රාදේශීය ජාල තිබේනම් මේ කණ්ඩායම්වලට උදවු පතා එම ජාල වෙත යොමුවිය හැක.

2. සිවිල් සමාජ සංවිධාන හදිසියේ හෝ අනපේක්ෂිතව ඇතිවන ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද? ඒ ප්‍රතිචාර සැලසුම් කළ යුත්තේ කෙසේද?

පාස්කු ඉරිදා ප්‍රහාර වැනි සිදුවීම් සිවිල් සමාජ සංවිධානවලට අනපේක්ෂිත සිදුවීම් වුවත් ඉන් අනතුරුව මුස්ලිම් ප්‍රජාවට එල්ල වූ ප්‍රතිප්‍රහාරය කඩිනමින් ම අපේක්ෂා කළ එකක් විය. නොදැන සිටියේ එය කුමන ආකාරයකින් මතු වේද, කුමන තරමකින් ඇතිවේද යන්නයි. ඇතැම් කණ්ඩායම් ජාතික මට්ටමින් දැනුවත්භාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරද්දී, උදාහරණ වශයෙන් හදිසි අවස්ථා රෙගුලාසි සහ නිකාබ් තහනම පිළිබඳ දැනුවත් කරද්දී, ඔවුහු හිජාබය සහ නිකාබය අතර වෙනස පැහැදිලි කෙරෙන සමාජ මාධ්‍ය පෝස්ටු මහජනයාගේ දැනුවත්වීම සඳහා පළ කරන ලදී. එසේ කරන ලද්දේ මුස්ලිම් කාන්තාවන්ට සිදුවන හිරිහැර පාලනය කිරීමටයි.

එසේම, ලෝකයේ අනෙක් රටවල එසේ කිරීම සුදුසු යැයි පිළිගෙන තිබියදී පවා භූමදානය සඳහා අවස්ථාව නොදී කෝවිඩ්-19 වින්දිතයින් අනිවාර්යයෙන් ආදාහනය කළ යුතු යැයි රජයෙන් ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ දී ද දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදුකරන ලදී. මෙය මුස්ලිම් ප්‍රජාවට එරෙහිව සිතාමතා ම සිදුකළ ද්වේෂසහගත ක්‍රියාවක් වශයෙන් සලකන ලදී. එහිදී ද, කෝවිඩ්-19 වින්දිතයින් භූමදානය කිරීම පිළිගත හැකි බව සඳහන් කරමින් වෛද්‍ය විශේෂඥයින් පලකළ අදහස් ප්‍රවර්ධනය කරන සමාජ මාධ්‍ය ව්‍යාපාර සිදුකරන ලදී.

අප කථා කළ ඇතැම් සිවිල් සමාජ සංවිධාන සඳහන් කළේ පාස්කු බෝම්බ ප්‍රහාරය සිදුවූ තැන් පටන් ඔවුන් කලාපීය හෝ ප්‍රාදේශීය මට්ටමින් ජනවාර්ගික ආතතියක් ඇතිවේදෝයි අවධානයෙන් සිටි බවයි. ඔවුන් වැඩ කරන ප්‍රදේශවල ජනතාව සමගින් ඔවුන්ට විශ්වාසවන්ත සම්බන්ධතාවයක් තිබුණු බැවින් ප්‍රචණ්ඩත්වය දක්වා පුපුරා යන්නට ඉඩ ඇති අවස්ථා හඳුනාගෙන ඒවා සමනය කිරීමට ඔවුන්ට හැකි වී තිබේ.

ප්‍රාදේශීය මට්ටමේ සිදුකරන කාර්යයන් සඳහා තවත් උදාහරණයක් නම්, කෝවිඩ්-19 ලොක්ඩවුන් තත්වය යටතේ දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දුන් අයට උපකාර කිරීම සඳහා ඔවුන්ට අරමුදල් නොලැබුණු විට, ප්‍රදේශයේ ම ධනවත් අය වෙත ගොස් දුගී තැනැත්තන්ට පිහිටවීම සඳහා ආධාර එකතුකරගැනීමට ඔවුන්ට හැකි වූ බව අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ ඇතැම් සිවිල් සමාජ සංවිධාන පැවසීමයි. එසේ කිරීමට හැකි වූයේ ආධාර ලබාදුන් ඒ තැනැත්තන්ට සිවිල් සමාජ සංවිධාන සාමාජිකයින් පිළිබඳ වූ විශ්වාසය සහ වසර ගණනක් තිස්සේ ප්‍රජාව සමගින් වැඩ කිරීමෙන් ඔවුන් ගොඩනගාගෙන තිබූ විශ්වසනීයත්වය හේතුවෙනි.

### 3. යම් තත්වයක් ප්‍රචණ්ඩ අතට හැරීමට බලපාන සාධක මොනවාද? සිදුවීම් සාමකාමීව සමනය කරගැනීමට හැකියාව ලැබෙන්නේ කුමන සාධක සමගින් ද?

දුස්තොරතුරු යනු පුද්ගලයින් නොමග යැවීම අරමුණු කරගෙන ව්‍යාජ පුවත් පැතිරවීම වන අතර, රාජ්‍යය හෝ වෙනත් දේශපාලන න්‍යායපත්‍ර විසින් සිදුකරන ප්‍රචාරණ ද ඊට ඇතුළත් ය. ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වය ඇවිලවීමට, විශේෂයෙන්ම ජනවාර්ගික හෝ ආගමික ගැටළු ඇතිකිරීමට දුස්තොරතුරු භාවිතා කර තිබේ. උදාහරණ වශයෙන් 2018 දී, මුස්ලිම් හෝටල් හිමියකු විසින් රාත්‍රී ආහාරයට වඳ පෙති එක් කළේය යැයි සිදු කළ ව්‍යාජ චෝදනාවක් මත සිංහල පුරුෂයින් කණ්ඩායමක් එම හෝටලට ගිණිබත් කරන ලදී. ආහාරවලට වඳ පෙති එක් කළේ යැයි හෝටල් හිමියා තමන්ට එල්ලවන තර්ජන මධ්‍යයේ පිළිගන්නා වීඩියෝ පටයක් සමාජ මාධ්‍යවලට මුදාහරින ලදී (සන්ඩේ ඔබ්සර්වර්, 2018). වැඩි වේලාවක් ගතවන්නට මත්තෙන් අම්පාර ප්‍රදේශයේ කෝලාහල ඇති වූ අතර තවත් මුස්ලිම් හෝටල් කිහිපයක්, පල්ලියක්, සහ බස් දුසිමකට වැඩි සංඛ්‍යාවක් ගිණිබත් කරන ලදී. මේ සිදුවීමෙන් පසුව රජය සහ පිළිගත් චරිත ගණනාවක් විසින් වඳ පෙති යැයි කිසිවක් නොමැති බව මහජනතාවට දැනුම් දෙමින් ප්‍රකාශ නිකුත් කරන ලදී. ආහාරවලට වඳ පෙති එකතු කර තිබුණේ යැයි කීම මුලින්ම රජයේ රස පරීක්ෂක විසින් ව්‍යාජ බව තහවුරු කළේය (ජයවර්ධන, 2018). ඉන්පසුව සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය අනිල් ජාසිංහ ප්‍රකාශයක් නිකුත් කරමින් වඳ පෙති යනු ප්‍රබන්ධයක් යැයි සඳහන් කළේය (ඩේලි මිරර්, 2018). එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සහ ලෝක බැංකුවේ ශ්‍රී ලංකා නියෝජිත ආචාර්ය රාසියා පෙන්ඩ්සේ සහ යූ එන් එෆ් පී ඒ නියෝජිත රිට්සු නකෙන් මහත්ම මහත්මීහු ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරමින් එයම සනාථ කළහ (යූ එන් එෆ් පී ඒ, 2018). ශ්‍රී ලාංකික වෛද්‍යවරුන් 200කට වැඩි පිරිසක් වඳ පෙති කියා යමක් නොමැති බව තහවුරු කළහ (ද සන්ඩේ ටයිම්ස්, 2018).

කෙසේනමුත්, පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු 2020 දී මුස්ලිම් තැනැත්තන්ට හිමි සුවිසන් රෙදි අළෙවිසැල් ජාලාවක් වන නෝලිමිට් ආයතනයේ අළෙවියට ඇති කාන්තා යට ඇඳුම්වල සිංහල කාන්තාවන් වඳවීම සඳහා දියරයක් ගල්වා ඇතැයි සමාජ මාධ්‍ය හරහා චෝදනා එල්ල වද්දී ඉහත කී සිදුවීමෙන් මහජනයාට කිසිවක් ඉගෙන ගෙන තිබූ බවක් පෙනෙන්නට නොතිබුණි. විශේෂඥයින් සිය ගණනක් විසින් මෙය ප්‍රබන්ධයක් බව පෙන්වා දුන්නත් මේ කටකථාව මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය ඇතිවන අවස්ථාවල පහසුවෙන්ම නැවතත් පණගසා මතුවන්නක් යැයි විස්තර කළ හැකිය.

2020 පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව ඇති වූ බොහෝ මුස්ලිම් විරෝධී සිදුවීම් දුස්තොරතුරුවල ද ප්‍රතිඵලයක් විය. පාස්කු ප්‍රහාරයෙන් පසුව තමන් ඉලක්ක බවට පත්වනු ඇතැයි මුස්ලිම් ප්‍රජාව අපේක්ෂා කළත් එම ප්‍රහාර කෙසේ කෙබඳු ස්වරූපවලින් මතුවේදැයි දැන සිටියේ හෝ කලින් අපේක්ෂා කළ හැකි වූයේ නැත. දුස්තොරතුරු සම්බන්ධයෙන් තවත් තදබල ලෙස ද්වේෂසහගත සිදුවීමක් වන්නේ මුස්ලිම් ජාතික නාරිවේද විශේෂඥයකු වූ වෛද්‍ය ෂාෆි ශිහාබ්දීන් සම්බන්ධයෙන් සිංහල පුවත්පතක පලවූ වාර්තාවයි. එහි සඳහන්ව තිබුණේ මෙම වෛද්‍යවරයා සිංහල

කාන්තාවන් බොහෝ සංඛ්‍යාවකගේ අවසරය නොගෙන ඔවුන්ගේ ගර්භාෂ නාල ගැටගැසීමට කටයුතු කර ඇති බවකි. මෙය, මුස්ලිම් ප්‍රජාවට එරෙහිව නැවතත් නැගී එමින් තිබූ කෝපය උත්සන්න කිරීමට හේතු විය (විජේදාස, 2022).

මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ තවත් වැරදි තොරතුරු සිදුවීමක් වසංගතය අතරතුර කෝවිඩ්-19 වෛරසයට ගොදුරු වූ මුස්ලිම්වරුන් භූමදාන කිරීම සම්බන්ධයෙන් විය. කෝවිඩ්-19 වින්දිතයින් භූමදාන කිරීම කළ හැකි බව බොහෝ විශේෂඥයින් සහ පිළිගත් ජාත්‍යන්තර සංවිධාන ප්‍රකාශ කර තිබියදීත්, දේහ භූමදාන කරනවාට වඩා ආදාහනය කිරීම රජය විසින් අවධාරනය කරන ලදී. (අල්-ඩාවුඩ් සහ ෆිනගන්, 2020) (කාර්මන් සහ ටීගල්, 2021).

දුස්තොරතුරු ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන ගැටලුවක් වන අතර නිසැකවම එය විසඳීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ගෙහාන් ගුණතිලක ප්‍රකාශ කරන පරිදි, විශේෂයෙන්ම රාජ්‍යය විසින් පතුරුවන දුස්තොරතුරුවලට එරෙහි වීම සංකීර්ණ වන අතර පුද්ගලික මාධ්‍ය ද ඇතැම් විට එයට හවුල් විය හැකිය. ඔහු තවදුරටත් මෙසේ ප්‍රකාශ කළේය: "සිවිල් සමාජය සහ ස්වාධීන පුවත්පත් කලාව සවිබල ගැන්වීම සහ මෙම අංශ අනිසි අරමුණු සහිත නියාමන න්‍යායපත්‍රවලින් ආරක්ෂා කිරීම තීරණාත්මක සාධකයකි. අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ දුස්තොරතුරුවලට ප්‍රතිරෝධය දැක්වීම, නියාමනයක් නොව ප්‍රතිරෝධ ව්‍යාපෘතියක් බවට පත්විය යුතුය" (2021).

මෙම ප්‍රශ්නයේ දෙවන කොටස වන සාමකාමී ලෙස යම් තත්වයක් සමනය කරගැනීමට උපකාරී වන සාධක පිළිබඳව අප ගුණාත්මක පර්යේෂණය හරහා සොයාගත් කරුණ නම් ප්‍රචණ්ඩත්වය අවුළුවාලන සාධක මෙන්ම එය සමනය කිරීමට හේතුවන සාධක ඒ ඒ සිදුවීම අනුව වෙනස් වන බවයි. අදාළ සිදුවීම, ප්‍රදේශය සහ ජන කොටස් අතර ප්‍රචණ්ඩත්වය හෝ ආතතිය සම්බන්ධයෙන් පවතින ඉතිහාසය ඇතුළු විවිධ සාධක ඊට බලපෑ හැකිය.

සිවිල් සමාජ සංවිධාන සාමාජිකයින්ට යම් සිදුවීමක් සමනය කරන්නට හැකි වූයේ නම් ඒ ඔවුන් එම ප්‍රදේශයේ කවුරුත් හොඳින් දන්නා හඳුනන විශ්වාසවන්ත අය වූ බැවිනි. මේ සාමාජිකයින් දීර්ඝ කාලයක් තිස්සේ එම ප්‍රදේශවල ක්‍රියාධරයින් වූ බැවින් සහ දශක කිහිපයක් එම ප්‍රදේශවලම වැඩ කර ඇති බැවින් ඔවුන්ට ප්‍රජාව සමගින් ශක්තිමත් සම්බන්ධයක් ඇත. එනිසා අදාළ පාර්ශව සමගින් කථා කර තත්වය උග්‍ර අතට හැරෙන්නට නොදී සමනය කරගැනීමට ඔවුන්ට හැකි වී තිබේ. මේ පුද්ගලයින් ප්‍රචණ්ඩත්වය ඇතිවන්නට ගිය අවස්ථා සමනය කරන්නට ප්‍රයෝජනවත් වී ඇති නමුත්, මෙවැනි කටයුතු සඳහා වඩාත් විශාල කණ්ඩායමක් යොදවන්නට හැකිනම් වඩාත් සුදුසුය. තනි පුද්ගලයකුට මෙවැනි සාකච්ඡා කළ හැක්කේ සීමිත පමණකට ය. එය තනි පුද්ගලයකුට දැරීම දුෂ්කර බරක් වේ. මේ සෑම සිදුවීමකදීම සම්බන්ධ වූ මේ පුද්ගලයින් ප්‍රශ්න සමනය කිරීමේ නිරත වී ඇත්තේ තමන්ට වැටුප් ලැබෙන සිවිල් සමාජ සංවිධාන රාජකාරිවලින් පරිබාහිරවයි.

## 4. සිවිල් සමාජ සංවිධාන අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී පවතින ප්‍රධාන බාධක මොනවාද?

ගුණාත්මක දත්තවලට අනුව දිවයින පුරා සිවිල් සමාජ සංවිධානවලට නිතරම හමුවන බාධකයක් වන්නේ සම්පත් හිඟකමයි.  එය, තාක්ෂණික සම්පත්වල සිට යම් විශේෂඥ දැනුමක් ඇති කාර්යමණ්ඩලය දක්වා පරාසයක විහිදෙන්නකි.

රාජ්‍ය සම්පත් සහ/ හෝ සහායක යන්ත්‍රණ නොමැතිවීම සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන දෙවන අභියෝගයයි. එනිසා, සිවිල් සමාජ සංවිධාන ප්‍රාදේශීය රජයේ ආයතන සමගින් හොඳින් වැඩ කරගෙන යන අතර, අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී සිවිල් සමාජ සංවිධානවලට වඩාත් හොඳ සහයක් ලබාදිය හැකිවන පරිදි ප්‍රාදේශීය රජයේ ආයතනවලට පහසුකම් ලබාදී තිබෙන්නේනම් වඩාත් සුදුසුය. සිවිල් සමාජ සංවිධාන බහුලව මුහුණ දෙන තවත් අභියෝගයක් නම් ඔවුන්ට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැති වීමයි. මෙනිසා ඔවුන්ට දැරිය නොහැකි වැඩ ප්‍රමාණයක් කිරීමට සිදු වේ, නැතහොත් ප්‍රචණ්ඩත්වයට ඔවුන්ට අවශ්‍ය ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට නොහැකි වේ.

මෙම පර්යේෂණය සිදුකළේ කෝවිඩ්-19 වසංගතය අවසාන වූ වහාම ය. එනිසා බොහෝ සිවිල් සමාජ සංවිධාන ඉන්ධන හිඟය සහ ඇඳිරිනීතිය තමන්ට බාධකයක් වූ බව සඳහන් කළහ. ඉන්ධන හිඟය සෑම අර්බුද අවස්ථාවකදී ම නිරන්තරයෙන් පවතින්නක් නොවන බැවින් අපට එය නොසලකා හැරිය හැක. හදිසි නීති රෙගුලාසි යටතේ පනවන ලද ඇඳිරි නීතිය යනු නිරන්තරයෙන් සිදුවන්නකි. 2014 දී අළුත්ගම කෝලාහලවලින් පසුව, 2018 දිගන කෝලාහල

වලින් පසුව, 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව, සහ 2021 දේශපාලන අර්බුදය අවස්ථාවේදී යනාදී විවිධ අවස-ථාවල ඇඳිරිනීතිය පනවන ලදී.

හදිසි නීති තත්වය සහ ඇඳිරි නීතිය පැනවීම නොතිබුණේ නම් සිවිල් සමාජ සංවිධානවලට පීඩාවට පත්ව සිටි පුද්ගලයින් වෙත ළඟාවීමට හැකිය. යම් තත්වයක් උග්‍ර අතට හැරීම වැලැක්වීම සඳහා ඉක්මනින් ගතහැකි ක්‍රිය-ාමාර්ගයක් වශයෙන් ඇඳිරි නීතිය අවශ්‍ය වන බව රාජ්‍ය මූලාශ්‍ර සඳහන් කර තිබේ. කෙසේනමුත් හමුදාව සහ/ හෝ පොලිසිය ද යම් කණ්ඩායමකට අත්විඳින්නට වූ ප්‍රචණ්ඩත්වයේ හවුල්කරුවන් වූ අවස්ථා වාර්තා වී තිබේ. 2018 දී දිගන ප්‍රදේශයේ එවැනි සිදුවීම් වාර්තා විය (එල් එස් ටී 2020)

5. ප්‍රචණ්ඩත්ව සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේදී සිවිල් සමාජ සංවිධාන නිරූපණය කරන භූමිකාවට සහය දිය හැකි ව්‍යුහගත ප්‍රතිසංස්කරණ මොනවාද?

මඩකලපුවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපදා කලමනාකරණ කණ්ඩායම සිවිල් සමාජ සංවිධාන සමඟින් එක්ව ස්-වභාවික ආපදාවන්හි සිට ජන කොටස් අතර ඇතිවන ප්‍රචණ්ඩත්වය දක්වා විවිධාකාර ප්‍රචණ්ඩත්වයන් සඳහා ප්‍රතිච-ාර දැක්වීමට කෙතරම් හොඳින් වැඩ කරන්නේදැයි සහ ව්‍යුහාත්මක යන්ත්‍රණ ඒ වනවිටත් ස්ථාපිත කර ඇති අන්දම අපි දුටුවෙමු. අවශ්‍ය වන්නේ මේ සම්බන්ධතාවය අනෙකුත් ප්‍රදේශවලත් ඇතිකිරීම යි. පර්යේෂණයෙන් හෙළිදරව් වූ අන්දමට පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි වෙනත් දිස්ත්‍රික්කවල රජයේ ආයතනවල රාජ්‍ය නොවන සංවිධාන ඒකකයක් ක්‍රියාත්මක නොවේ.

කඩිනමින් ලබාදියයුතු ප්‍රතිචාරවලට අමතරව, වසර ආරම්භයේ සිවිල් සමාජ සංවිධාන විසින් දිස්ත්‍රික් ලේකම් කාර්ය-ාලයට ඉදිරිපත් කළ යුතු වාර්තා ඉදිරිපත් කිරීමේදී සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අළුතින් නිලධාරීන් පැමිණි විට සිවිල් සමාජ සංවිධාන සිදුකරන වැඩ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කරන අවස්ථාවලදී ඒ සඳහා ඉලෙක්ට්‍රොනික් පද්ධතියක්/ වැඩසටහනක් භාවිතා කිරීමෙන් අනවශ්‍ය ප්‍රමාදයන් හා කඩදාසි භාවිතය වලක්වාගැනීමට හැකිවනු ඇත. ඔවුන්ගේ කටයුතු ඩිජිටල්කරණය කර ඇත්නම් ඔවුන් කරන කාර්යයන් වර්ග සම්බන්ධයෙන්, ව්‍යාපෘති, වැඩ කරන්නේ කුමන දිස්ත්‍රික්කවලට ද යනාදිය සම්බන්ධයෙන් පැහැදිලිව පෙන්විය හැකි මෘදුකාංග තිබේනම් අතීත සහ වර්තමාන තොරතුරු පහසුවෙන් පෙන්විය හැකි අතර, ලේඛන සකස් කිරීමට සිවිල් සමාජ සංවිධාන පැය ගණනා-වක් ගතකළ යුතු නොවේ.

# නිර්දේශ

මඩකලපුවේ සිවිල් සමාජ සංවිධාන, විශේෂයෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයත් සමගින් කෙතරම් හොඳින් කටයුතු කරන්නේද යන්න සලකා බලන කල, සිවිල් සමාජ සංවිධාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයත් සමගින් හොඳ සම්බන්ධයක් පවත්වාගැනීම එලදායී බව පැහැදිලි වේ. රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය හරහා එසේකිරීමට හැකිය. ජතික මට්ටමින් අපගේ පර්යේෂණයෙන් සොයාගත් කරුණු අනුව බොහෝ සිවිල් සමාජ සංවිධානවලට දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහයෝගයෙන් වැඩකළ හැකි ප්‍රයෝජනවත් පාර්ශවයක් වී තිබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමගින් වැඩකිරීමේදී ගැටළුවලට මුහුණ දී තිබුණේ සුළු පිරිසක් පමණි. සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම ආපදා සඳහා ප්‍රතිචාර දීමට ඒකකයක් ඇති අතර අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී සිවිල් සමාජ සංවිධානවලට මෙම ඒකක සමගින් සම්බන්ධ විය හැකිය.

- විශේෂයෙන් ජනාකීර්ණ ප්‍රදේශ සිතියම්ගත කිරීම වැනි, අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී, සිවිල් සමාජ සංවිධානවලට ප්‍රයෝජනවත් වන තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාල සතුව ඇත.
- ප්‍රාදේශීය මට්ටමින් ඇති දත්ත අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැනි ප්‍රාදේශීය රජයේ ආයතන සමඟ කටයුතු කිරීමේදී සිවිල් සංවිධානවලින් අති බහුතරයක් කිසිදු බරපතළ ප්‍රශ්නයකට මුහුණ දී නොමැත. කෙසේ වෙතත්, මෙය ඔවුන් වැඩකරන ක්ෂේත්‍රවලට අනුව වෙනස් විය හැකි බව මෙහිදී සඳහන් කිරීම වැදගත්ය. පර්යේෂණයෙන් සොයාගත් කරුණු සම කණ්ඩායම්වල අදහස් සඳහා යොමුකිරීමේදී, එල්ජීබීටී ගැටළු සම්බන්ධයෙන් විශේෂයෙන් ක්‍රියා කරන එක් රාජ්‍ය නොවන සංවිධානයක් ප්‍රකාශ කළේ තමන් පළාත් පාලන නිලධාරියෙකුගේ දැඩි විරෝධයකට මුහුණ දුන් බවයි. ඔවුන්ගේ කාර්යය මූලික වශයෙන් එල්ජීබීටී ප්‍රජාවට සම්බන්ධ බව සෘජුව නොපෙන්වා ඔවුන්ගේ වැඩ කටයුතු කරන බව ද ප්‍රකාශ කළහ.

ප්‍රදේශයේ සිවිල් සමාජ සංවිධාන අතර සම්බන්ධීකරණය. සිවිල් සමාජ සංවිධාන සඳහා ප්‍රාදේශීය ජාලයක් තිබුණහොත් එක් එක් සංවිධානය හුදෙකලාව ක්‍රියාත්මකවීම වලක්වාගත හැකිය.

- එකම කාර්යය සංවිධාන දෙකකින් සිදු නොවන බවත්, ආධාර සාධාරණ ලෙස බෙදා හැරෙන බවත් සහතික කරගැනීමටත් මෙය උපකාරි වනු ඇත
- යම් ප්‍රදේශයක ඇති සමාන ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කරන සිවිල් සමාජ සංවිධාන එක්ව වැඩ කිරීමෙන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබා ගත හැක.
- දැනුම හුවමාරු කිරීමට ද මෙයින් ඉඩ ලබා දිය හැකිය, උදාහරණයක් ලෙස ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන සහ බිම් මට්ටමේ සිවිල් සමාජ සංවිධාන අතර, සහ අනෙක් අතට දැනුම හුවමාරු කරගත හැකිය.
- බොහෝ සිවිල් සමාජ සංවිධාන කාර්ය මණ්ඩලය ප්‍රකාශ කළේ ඔවුන් තම නිල වැඩසටහන්/ව්‍යාපෘති-වලට පරිබාහිරව ස්වේච්ඡා සේවය ද කරන බවයි. මේවාට අවධානය යොමු නොකර සිටිය නොහැකි, හදිසියේ ඇතිවන සිදුවීම් හෝ තත්වයන් (උදා: ආපදා, වාර්ගික ප්‍රචණ්ඩත්වයේ ගිනි පුපුරු) ඇතුළත් ය. කලාපයක් තුළ සිවිල් සමාජ සංවිධාන අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් තිබේ නම්, මෙම ගැටළු විසඳීමේ බර විශාල සිවිල් සමාජ සංවිධාන ජාලය අතර බෙදා ගත හැකිය.
- ආපදාවකින් පසු පරිත්‍යාග එකතු කරන, කවුරුත් දන්නා ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන ජාලයකට විශ්වසනීයත්වයක් ඇත. එවැනි ජාලයක් පරිත්‍යාග හෝ ආධාර සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කරනු ඇත.
- ඇතිවිය හැකි ප්‍රචණ්ඩත්වය හඳුනා ගන්නේ කෙසේද යන්න පිළිබඳ පොදු අවබෝධයක් තිබීම. නිදසුනක් වශයෙන්, කෝලාහල වැනි, ප්‍රචණ්ඩත්වයට තුඩු දිය හැකි ජනවාර්ගික ආතතිය හඳුනා ගන්නේ කෙසේද සහ තත්වය සමනය කරන්නේ කෙසේද වැනි දෑ. මඩකලපුවේ සිවිල් සමාජ සංවිධානයක් සඳහන් කළ පරිදි, යම් යම් තත්වයන් හඳුනා ගැනීමට සහ සමනය කිරීමට ඔවුන්ට හැකි හැකි වී තිබේ.
- ආපදා/ප්‍රචණ්ඩත්වය සඳහා සූදානම්වීමට ප්‍රාදේශීය ජාලයන්ට ප්‍රචණ්ඩත්වය කලින් සිදු වූ ප්‍රදේශ (විශේෂයෙන් ප්‍රචණ්ඩත්වය සඳහා ප්‍රදේශයේ උණුසුම් ස්ථාන) අධ්‍යයනය කර ඇගයීමට ලක් කළ හැක. සෑම වසර දෙකකට වරක් ඇගයීමක් සිදු කරන ලෙස අපි නිර්දේශ කරමු. මෙයට හුදෙක් ඔවුන්ගේ අත්දැකීම් හෝ ක්ෂේත්‍රයේ වැඩ කිරීමේදී රැස් කරගත් දැනුම මත පදනම්ව සිවිල් සමාජ සංවිධාන විසින් ලබාදෙන ප්‍රතිපෝෂණ හෝ තොරතුරු ඇතුළත් කළ හැකිය.

- අවදානම්පාත්‍රතා ඇගයුම් සිදුකිරීම (ආන්තිකරණය වූ ප්‍රජාවන් කෙරෙහි පමණක් අවධානය කේන්ද්‍ර කිරීම වෙනුවට, වඩාත්ම අවදානමෙහි සිටින්නේ කවුදැයි හඳුනාගැනීමට අවධානය යොමු කිරීම - එය ආන්තිකරණය වූ පිරිස්වලට වඩා පුළුල් කණ්ඩායමක් වනු ඇත. එතුළ පන්ති අනුව ඇතිවන වෙනස්කම් මෙන්ම යම් යම් අවස්ථාවන්හිදී අවදානම් තත්වයකට මුහුණ දෙන පුද්ගලයින්/පවුල් කෙරෙහි ද ඔවුන් ආධාර ලබන හෝ නොලබන අන්දම කෙරෙහි ද මෙහිදී අවධානය යොමුවනු ඇත). අවදානම්පාත්‍රතාවය කෙරෙහි අවධානය යොමු කිරීමේදී අවදානම්පාත්‍රවීම සහ ආන්තිකරණයවීම යන දෙක අන්තර්ඡේදනය වන අන්දම පිළිබඳව ද සලකා බැලිය යුතුය. උදාහරණ වශයෙන්, 2018 දිගන කෝලාහලවලදී මුස්ලිම් පවුලකට අයත්, බෑග් සාදන කර්මාන්තශාලාවකට පහරදෙන ලදී. මින් වැඩියෙන්ම බලපෑමට ලක් වුයේ එම කර්මාන්තශාලාවේ වැඩ කළ සිංහල මවුවරුන් ය. එක් රැයකින් ඔවුන්ට තම ආදායම් මාර්ගය අහිමි වූ අතර තම පවුල් නඩත්තු කරගැනීමට නොහැකි විය (එල් එස් ටී, 2020). කෝලාහලවලින් පසුව රජයෙන් ලබාදුන් වන්දි හෝ ආධාර ඉල්ලාසිටීමට ඔවුන්ට ක්‍රමයක් තිබුණේ නැත. ආදායමක් උපයාගැනීමේ මාර්ගයක් සඳහා වූ දැඩි අවශ්‍යතාවය මත ඔවුන්ගේ ම ඉතුරුම් වැය කර එම කුඩා කර්මාන්ත ශාලාව යළි ඉදිකරන්නට ඔවුන්ට සිදුවිය.

ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට මුහුණ දී දිවි ගලවාගත් අය, ආන්තිකරණයට ලක් වූ කණ්ඩායම්, සහ තර්ජනයට ලක්ව සිටින ප්‍රජාවන් වැනි ප්‍රචණ්ඩත්වයෙන් වින්දිතයින් වූ කණ්ඩායම් සඳහා ප්‍රාදේශීය මට්ටමින් රැකවරණ ස්ථාන ඇතිකිරීම. වසංගත සහ ලොක්ඩවුන් තත්වයන් නිතර ඇතිවන සිදුවීම් නොවූවත් කෝවිඩ්-19 වසංගත කාලයේ සිදුකළ ලොක්ඩවුන් තත්වයන් තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය උග්‍ර වූ බවට බොහෝ වාර්තා ලැබී තිබුණි (යූ එන් එෆ් පී ඒ, 2020) (ප්‍රනාන්දු, 2021). ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හදිසි හෝ අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයක් වශයෙන් සැලකිය හැකි බැවින් වසංගතය නොමැති තත්වයක් තුළ ද එය මෙම පර්යේෂණයට අදාළ වේ.

සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය නියෝජිතයන් (පරිපාලන කොට්ඨාස, ප්‍රාදේශීය සහ පළාත් අධිකාරීන්) සමඟ ශක්තිමත් සබඳතාවක් පවත්වාගත යුතුය. දිවයින පුරා සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකටම රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයෙන් පත් කර ඇති නියෝජිතයින් හරහා මෙය සාක්ෂාත් කරගත හැකිය. දැනට සිවිල් සමාජ සංවිධාන සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර දුර්වල සම්බන්ධතා ඇති ඇතැම් දිස්ත්‍රික්කවල රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ නිලධාරීන් නොමැත. සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම රාජ්‍ය නොවන සංවිධාන නිලධාරියෙකු ස්ථානගත කිරීම සහ ඔවුන් සෑම ප්‍රදේශයකම සිවිල් සමාජ සංවිධාන සමඟ සක්‍රීයව කටයුතු කිරීම සහතික කිරීම සඳහා මෙම ව්‍යුහාත්මක ගැටළුව රාජ්‍යය හරහා නිවැරදි කිරීමට සිදුවනු ඇත.

### සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය අතර සම්බන්ධීකරණය

- රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියලුම රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රගති වාර්තා සහ වාර්ෂික සැලසුම්වල අත්‍යාවශ්‍ය දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.

    *2022.12.22 දින මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 8 චක්‍රලේඛයට අනුව, "ජාතික මට්ටමින් ලියාපදිංචි සියලුම ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන තම ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තා රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික සැලසුම්වල දිස්ත්‍රික් මට්ට-මේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය/අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය විසින් අදාළ දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරකවරුන් වෙත යොමු කරනු ඇත.*

- රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානවල සහ සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තා ලබා ගත හැකි අතර රාජ්‍ය නොවන සංවිධාන විසින් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යා හැකිය. මෙය ව්‍යාපෘති පිළිබඳව සොයාබැලීමට සහ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ සිවිල් සමාජ සංවිධාන අතර අරමුදල් වැඩිපුර සැපයීම, අඩුවෙන් අරමුදල් සැපයීම සහ සම්බන්ධීකරණය සහ සන්නිවේදනය සම්බන්ධ ගැටළු සොයා ගැනීමට උපකාරී වේ.

- ප්‍රතිපත්ති සම්පාදනයේ දී රජයට සහයවීමට සහ සංවර්ධනයේ දී අරමුදල් සහ බදු මුදල් ජනතාවට සේවය කිරීම සඳහා වඩාත් හොඳින් භාවිතා කිරීමට සහාය වීමට ද මෙය රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට උපකාරී වනු ඇත.
- දත්තමූලය මත පදනම්ව, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට එකම/ආශ්‍රිත ගැටළු සහ ව්‍යාපෘති සම්බන්ධයෙන් ක්‍රියා කරන ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සම්බන්ධ කළ හැක.
- තවද, සංවර්ධනය අවශ්‍ය වන, එහෙත් මෙම සංවිධාන තවමත් ළඟා වී නොමැති ප්‍රදේශ පිළිබඳව සිවිල් සමාජ සංවිධාන සහ රජය යන දෙපාර්ශවයටම උපදෙස් දීමට රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට හැකිය.

## දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ඇතිකරගැනීම

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 1999 පෙබරවාරි 26 දිනැති අංක ඝණ/99/01 චක්‍රලේඛයේ සඳහන් වන්නේ "එක් එක් දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය නොවන සංවිධාන සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කළ යුතු බවයි. මෙම කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

- දිස්ත්‍රික් ලේකම්/ දිසාපති- සභාපති
- දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලයේ ප්‍රධානියා- සාමාජික
- සමාජ සේවා භාර පළාත් ලේකම් - සාමාජික
- පළාත් ප්‍රධාන ලේකම්ගේ නියෝජිතයෙක්- මන්ත්‍රී
- ප්‍රධාන ලේකම් විසින් නම් කරන ලද සමාජ සේවා නිලධාරියෙක්- සාමාජික

- දිස්ත්‍රික් මට්ටමින් කමිටු ඇති බව සම්මුඛ පරීක්ෂණ, සමීක්ෂණ, දුරකථන ඇමතුම්වලදී සඳහන් වුවද ඉහත සඳහන් කමිටු නිලධාරීන් රැස්වීම්වලට සහභාගි නොවන බව පෙනේ. සමාජ සේවා සම්බන්ධ කටයුතුවලට පළාත් ලේකම්වරුන් මැදිහත් වීමක් ගැන අප අසා නැත. එබැවින්, මෙම පරතරය පියවා ගැනීමට සහ රාජ්‍ය මට්ටමේ පාර්ශවකරුවන්ගේ වඩා හොඳ මැදිහත්වීමක් සහතික කිරීම සඳහා, සිවිල් සමාජ සංවිධානවලට සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා අදාළ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අනිවාර්ය ක්‍රියාකාරී සහභාගීත්වය අපි නිර්දේශ කරමු.
- මධ්‍යම සහ පළාත් පාලන ආයතනවල මෙන්ම සිවිල් සංවිධානවල අවධානයට ලක් නොවන හෝ සංවර්ධනය අතින් අඩු ප්‍රදේශ කෙරෙහි පළාත් සභාවල අවධානය යොමු වන බව මෙමගින් සහතික කළ හැකිය. සංවර්ධනය අවශ්‍ය නිශ්චිත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා සිවිල් සංවිධානවලට යෝජනා ඉදිරිපත් කිරීමට පළාත් සභාවලට හැකිය.
- විශේෂයෙන්ම අනපේක්ෂිත ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පළාත් සභා මෙම කාරණයට සම්බන්ධ කර ගැනීම ප්‍රයෝජනවත් වේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා පළාත් සභාවලට පොලිස් බලතල ලබාදී ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ 1 ලැයිස්තුව (පළාත් සභා ලැයිස්තුව), 1 උපග්‍රන්ථය (නීතිය හා සාමය) මඟින් (අ) ජාතික ආරක්ෂාව, (ආ) ජාතික ආරක්ෂාව; සහ (ඇ) සිවිල් බලයට ආධාර පිණිස ශ්‍රී ලංකා රජයේ පාලනය යටතේ පවතින ඕනෑම සන්නද්ධ හමුදාවක් හෝ වෙනත් හමුදාවක් භාවිතා කිරීම හැර (ආ) ජාතික ආරක්ෂාව; සහ (ඇ) සිවිල් බලයට ආධාර පිණිස ශ්‍රී ලංකා රජයේ පාලනය යටතේ පවතින ඕනෑම සන්නද්ධ හමුදාවක් හෝ වෙනත් හමුදාවක් භාවිතා කිරීම පළාත් සභාවලට ලබා දෙයි.[2]

සිවිල් සමාජ සංවිධානවලට පළාත්සභා සමගින් වඩාත් හොඳ සම්බන්ධීකරණයක් ඇත්තේනම් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පහත ආකාරවලින් කටයුතු කිරීමට හැකිවනු ඇත:

- අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට එරෙහිව ක්‍රියා කරන සිවිල් සමාජ සංවිධානවලට පොලිස් බලතල සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයට බලපෑම් කළ හැකිය.
- සිවිල් සමාජ සංවිධාන සහ පොලිසිය අතර දැනුම හා තාක්ෂණික හුවමාරුව
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට පළාත් පාලන නියෝජිතයන් ද ඇතුළත් කළ යුතුය

[2]https://www.ft.lk/Opinion-and-Issues/police-powers-of-provincial-councils/14-168561

සංවර්ධන ව්‍යාපෘති සහ සමාජ සේවා සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සිවිල් සමාජ සංවිධාන සහ පළාත් බලධාරීන් මෙන්ම ප්‍රාදේශීය රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය අරමුදල් භාවිතය සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගවීම වැඩිකරයි.

රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරකයින් ප්‍රාදේශීය සභා සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමගින් සම්බන්ධතා පවත්වාගනිමින් ඒ ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවල තොරතුරු ඇතුළත් දත්තමූලයක් පවත්වාගත යුතු වේ. සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නියෝජිතයින් අතරේ සම්බන්ධීකරණය සඳහා වන ප්‍රධානතම මෙවලම වන්නේ මෙම රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරකයින් වේ.

### දුස්තොරතුරුවලට එරෙහිව ක්‍රියා කිරීම

- ඔවුන් වැඩකරන ප්‍රජාවන් සමගින් ඇති සම්බන්ධය මත, දුස්තොරතුරු පිළිබඳ සත්‍ය ප්‍රජාවට හෙළිකිරීමට සිවිල් සමාජ සංවිධාන ජාලයට සක්‍රියව ක්‍රියාත්මක විය හැක.
- එසේම ව්‍යාජ පුවත් මැඩලීමට ද ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සමගින් කටයුතු කිරීමට ඔවුන්ට හැකියාව තිබේ.

# ප්‍රතිපත්ති රාමුව

යෝජිත ප්‍රතිපත්ති රාමුව මූලිකාංග තුනක් සහිත ප්‍රවේශයක් පදනම් කරගෙන තිබේ.

- ආපදා සඳහා පෙරසූදානම
- ප්‍රතිචාර
- දීර්ඝ කාලීන/ පසුව්පරම

## ආපදා සඳහා පෙරසූදානම

ආපදා සඳහා පෙරසූදානමේ මූලික ලක්ෂණය වන්නේ ආපදාවකින් සිදුවන බලපෑම් අවම කිරීම හා වැළැක්වීම ආපදාවකින් සිදුවන හානිය අවම මට්ටමකින් පවත්වාගැනීමට උපකාර්වන බව අවබෝධ කර ගැනීමයි. පෙරසූදානම ශක්තිමත් කිරීමේදී අරමුණු දෙකක් ඇත: (අ) පුරෝකථනය කිරීමට, නිරීක්ෂණය කිරීමට සහ හානිය අවම කිරීමට හෝ වියහැකි තර්ජනවලට මුහුණ දීමට සූදානම් වීමේ හැකියාව වැඩි කිරීම සහ (ආ) හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීමට සහ අහිතකර ලෙස පීඩාවට පත් වූවන්ට සහාය වීමට ඇති සූදානම ශක්තිමත් කිරීම. (UN/IDSR සහ UN/OCHA, 2008).

ඇලෙක්සැන්ඩර් (2005) සඳහන් කරන අන්දමට ආපදා සඳහා පෙරසූදානමේ දී හදිසි අවස්ථා සඳහා සැලසුම් කිරීමේ අරමුණු පහත පරිදි වේ: (අ) මහජන ආරක්ෂාව පවත්වාගැනීම (ආ) හානි සීමා කිරීම (දේපල සහ යටිතල පහසුකම්) (ඇ) අවදානමට ලක්විය හැකි තැනැත්තන් (ජනයා සහ සමාජ ආයතන) ආරක්ෂා කිරීම (ඈ) දිවි සුරකින සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම (ටයුබි, 2020).

## නීති රාමුව

නීතියෙන්:

(අ) මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කර කුමන කොන්දේසි යටතේ කවර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ හැකිදැයි සඳහන් කරයි

(ආ) කුමන ආකාරයේ ප්‍රචණ්ඩත්වයක් සිදුවේද යන්න මත, ආපදාවක සමස්ත වගකීම ඇත්තේ කාටද යන්න ශක්තිමත්ව තහවුරු කරයි

(ඇ) ව්‍යාකූලත්වය, එකම කාර්යය දෙපාර්ශවයකින් ඉටුවීම සහ/හෝ අවදානම්පාත්‍ර ඇතැම් කණ්ඩායම් නොසලකා හැරීම වැළැක්වීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශ, ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ සූදානම සහ ප්‍රතිචාර දැක්වීමේ කාර්යභාරය පැහැදිලිව දක්වයි.

(ඈ) විමධ්‍යගත යාන්ත්‍රණයන් පැහැදිලිව ස්ථාපිත කිරීම සහ ප්‍රජා සහභාගීත්වය දිරිමත් කිරීම - කළ හැකි අවස්ථාවලදී.

(ඉ) ආපදා සඳහා පෙර සූදානමින් සිටීමේ හැකියාව ගොඩනැගීම සඳහා ඇතිකළ සමස්ත ජාතික අයවැයක් ඇතුළුව සූදානම් වීම සඳහා අවශ්‍ය අරමුදල් සහ අනෙකුත් සම්පත් ප්‍රභවය හඳුනා ගැනීම සහ බරපතල ආපදාවක් හමුවේ අතිරේක හදිසි ආපදා අරමුදල් වෙන් කළ හැකි ආකාරය ගෙනහැර දක්වයි.

(ඊ) පෙරසූදානම සඳහා හැකියාව ඇතිකිරීමට වගකියන සහ පද්ධතිය තුළ වගවීම සඳහා ඉලක්ක නියම කළයුතු ආයතනවලට ඔවුන්ගේ වැඩ පිළිබඳ වාර්තා කිරීමට අවශ්‍ය වන අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයක් ඇති කරයි

## කලාපීය ජාල සඳහා රාමුව

කලාපීය ජාල සඳහා පහත දැක්වෙන වගුව (ටයුබි, 2020) මාර්ගෝපදේශයෙක් ලෙස යොදගත හැකිය.

ආපද සඳහා පෙර සූදනම: ප්‍රවේශ සහ රාමු, 1 වගුව.
ජාතික ආපද පෙරසූදනම් ධාරිතාවය වර්ධනය සඳහා රාමුව

| අංග | ආමන්ත්‍රණය කරන ගැටළු |
|---|---|
| 1. සංයුතිය | ප්‍රාදේශීය, උප කලාපීය සහ ජාතික මට්ටමින් ආපදා සූදානම සඳහා වගකිව යුතු ආයතන (රාජ්‍ය නොවන ආයතන ඇතුළුව) මොනවාද? එය ඔවුන්ගේ වරම, වැඩ සැලසුම් සහ කාර්ය මණ්ඩල රැකියා විස්තරවල පැහැදිලිව පිළිබිඹු වේද? |
| 2. භූමිකා වගකීම් | පෙරසූදානම්වීමේ ධාරිතාව ගොඩනැගීම සඳහා අත්‍යවශ්‍ය යැයි සැලකෙන විවිධ කාර්යයන් සහ ප්‍රතිඵල සඳහා වගකිව යුතු ආයතන මොනවාද? විවිධ අංග එකමුතුව සහ සම්බන්ධීකරනය ලෙස ක්‍රියාත්මක වන පරිදි එකිනෙකට සම්බන්ධ වීමට බලාපොරොත්තු වන්නේ කෙසේද? |
| 3. අන්තර් ආයතන ප්‍රොටෝකෝල සම්බන්ධයෙන් ගිවිසුම් | පෙරසූදානම සඳහා වගකීම් සහිත විවිධ ආයතන අතර ඒකාකාර ලෙස සම්බන්ධීකරණය සහ සන්නිවේදනය සඳහා පහසුකම් සැලසීමට විධිවිධාන ක්‍රියාත්මකද? මේවා ලිඛිතව ඇතිද සහ ඒවා අදාළ සියලුම සංවිධාන විසින් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය යන දෙඅංශයෙන්ම එකඟ වී තිබේද? |
| 4. බාහිර සහය සම්බන්ධයෙන් ප්‍රොටෝකෝල | රාජ්‍ය නොවන සංවිධාන ආධාර, පුද්ගලික පරිත්‍යාග සහ ජාත්‍යන්තර හෝ කලාපීය ආධාර ඉල්ලීම සහ ලබා ගැනීම සඳහා නීති රීති සහ ක්‍රියා පටිපාටි, අවශ්‍ය නම්, ඒවා කලින් එකඟ වී අනුමත කර තිබේද? |
| 5. සිවිල්-හමුද සම්බන්ධතා | ආපදා තත්ත්වයකදී හමුදා වත්කම් යෙදවිය හැක්කේ කුමන කොන්දේසි යටතේද යන්න පද්ධතිය සඳහන් කරන්නේද? |
| 6. ධාරිතාවය ශක්තිමත් කිරීම | පෙරසූදානම සහ ප්‍රතිචාර ධාරිතාව ගොඩනැගීම සහ පවත්වාගෙන යාම සඳහා කුමන විධිවිධාන ක්‍රියාත්මක කර තිබේද, මෙමඟින් ධාරිතා ගොඩනැගීම සෑම මට්ටමකින්ම ආවරණය කරයිද? |

*මූලාශ්‍රය: Compiled from UN/ISDR & UN/OCHA (2008)*

## මූලාශ්‍රය

### වහාම දක්වන ප්‍රතිචාර

- ක්ෂණික ප්‍රතිචාරය ආපදා සූදානමේ දළ සටහන අනුගමනය කළ යුතු නමුත් අනපේක්ෂිත හෝ අනපේක්ෂිත තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා නම්‍යශීලී විය යුතුය.
- එක් එක් ප්‍රචණ්ඩත්ව සිදුවීමට අනුව අවදානමට ලක්විය හැකි කණ්ඩායම් තක්සේරු කළ යුතුය.

### සිදුවීමෙන් පසුව දක්වන ප්‍රතිචාරය

- විපතට පත් ජනතාව සඳහා මූල්‍ය වන්දි බෙදා හැරීම සාධාරණව සහ කඩිනමින් නිකුත් කළ යුතුය. නීතිය හා සමාජ භාරය දිගන සම්බන්ධයෙන් පලකළ වාර්තාවට (2020) අනුව, බොහෝ විපතට පත් පුද්ගලයින් මුදල් වන්දි ලබා ගැනීමේදී දිගුකාලීන ප්‍රමාදයන් අත්විඳ ඇති අතර කෝලාහල අතරතුර ගිනි තැබූ පසු නිවාස නැවත ගොඩනඟා ගැනීමට නොහැකි වී තිබුණි. විපතට පත් වූවන් වෙත වන්දි මුදල් බොහෝ විට තැපැල් සේවය හරහා තැපැල් කරනු ලැබේ. කෙසේ වෙතත් ඇඳිරි නීතිය, වැඩ වර්ජන සහ දීර්ඝ රජයේ නිවාඩු දින හේතුවෙන් තැපැල් සේවය අඩාල වී තිබුණි. එබැවින් මෙවැනි දේ බෙදා හැරීම සඳහා නව පද්ධති අවශ්‍ය වේ.
- බලපෑමට ලක් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම අත්‍යාවශ්‍ය වේ. එසේ කරන්නේ ඔවුන්ට රජයෙන් දුන් වන්දිය ඔවුන්ට ලැබී ඇති බව සහතික කරගැනීම, ඔවුන් මානසිකව සහ ශාරීරිකව නිරෝගී බව සහතික කරගැනීම සහ ජාතිවාදය හෝ ආගමික එකඟ නොවීම් නිසා ප්‍රචණ්ඩත්වයට පෙලඹී ඇත්නම් වන්දි ලබාදිය හැකි ආකාරය තක්සේරු කිරීම සඳහා ය.

### දීර්ඝ කාලීන/ පසුවිපරම

ආපද සම්බන්ධයෙන් හෝ ආගම/ජාතිය හෝ දේශපාලන හේතු මත සිදුකෙරෙන කෝලාහල වැනි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධානවලට දීර්ඝ කාලීන පසුවිපරම් සිදුකළ හැකිය. එවැනි සිවිල් සමාජ සංවිධානවල බලවරමට මෙය ඇතුළත් කිරීම ඵලදායී වනු ඇත. ප්‍රජාවන් ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන ආකාරය සහ ප්‍රචණ්ඩත්වය පුපුරා යාමෙන් යළි නැගීසිටීමට ඔවුන්ට හැකි වන්නේද යන්න පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා පර්යේෂණ කටයුතුවල නියැලී සිටින සිවිල් සමාජ සංවිධාන වඩාත් සුදුසු වේ. එවැනි පර්යේෂණ වාර්තා මඟින් යම් ප්‍රජාවක් සඳහා තවත් කළ යුතු දේ පිළිබඳව අදහසක් ලබාගත හැකි අතර රාජ්‍ය සහ සිවිල් සංවිධානවලට සහාය වීමට හැකි බව සහතික කළ හැකිය. එම වාර්තා ආපදා සඳහා පෙරසූදානම් රාමුව හැඩගස්වාගැනීමට, ප්‍රජාවන්ගේ සහ පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරකම් හැඩගස්වාගැනීමට ද භාවිතා කළ හැකිය

*(උදා: නීති සම්පාදනයේ වෙනස්කම්, හදිසි රෙගුලාසිවල වෙනස්කම්, ඡම්රැඕ හි වෙනස්කම්, අමාත්‍යාංශවල වෙනස්කම්, 13 වන සංශෝධනය ක්‍රියාත්මක කළ හැකි අවස්ථා ආදිය).*

# නිගමනය

පර්යේෂණය සිදුකරනු ලැබුවේ දීපව්‍යාප්ත මට්ටමින් වූ බැවින් එක් එක් දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සංවිධාන එදි-නෙදා තම ක්‍රියාකාරකම් ඉටුකරන අන්දම පිළිබඳව තොරතුරු එකතු කිරීමටත් අනපේක්ෂිත ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී ඔවුන් මුහුණ දෙන අභියෝග කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින් තොරතුරු රැස් කිරීමටත් අපට හැකි විය. වැඩියෙන්ම සිවිල් සමාජ සංවිධාන ප්‍රමාණයක් සම්බන්ධ වී සිටින බවක් පෙනෙන්නට තිබූ මඩකලපුව දිස්ත්‍රික්කය සහ අඩුම සම්බන්ධතාවයක් තිබුණු පොලොන්නරුව කෙරෙහි අපි විශේෂයෙන් අවධානය යොමු කළෙමු. මෙයින් පිළිබිඹු වන්නේ සිවිල් සමාජ සංවිධානවලට දිවයින මුළුල්ලේම එකම ආකාරයෙන් ක්‍රියාත්මකවීමට නොහැකි බව සහ එසේ ක්‍රියාත්මක නොවන බවයි. විවිධ හේතු මත එක් එක් දිස්ත්‍රික්කවලට ම විශේෂිත අභියෝග තිබේ.

කෙසේ වෙතත්, මෙම පර්යේෂණය සඳහා අපට තිබූ කාලය සීමිත වූ බැවින්, එක් එක් දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සං-විධාන මුහුණ දෙන අභියෝග විස්තරාත්මකව ගවේෂණය කිරීමට අපට නොහැකි විය. මෙය නිසැකවම තවදුරටත් ගවේෂණය කිරීමට සිත්ගන්නා අංශයක් වේ. අපට එක්රැස් කිරීමට හැකි වූ ස්වල්ප තොරතුරුවලින් සිවිල් සමාජ සංවිධාන සම්බන්ධ වන්නේ කෙසේද යන්න තීරණය වන්නේ සෑම දිස්ත්‍රික්කයකටම ඇති තමන්ගේම දේශපාලන සම්ප්‍රදායන් අනුව බව පැහැදිලි විය. නමුත් මෙයද ඉතිහාසය පුරා ඒ ඒ දිස්ත්‍රික්කවල සිදු වූ සිදුවීම්වලින් හැඩග ැසී ඇත. නිදසුනක් වශයෙන්, මඩකලපුවේ සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීත්වය 1960 ගණන්වල ආරම්භ කරන ලද මහවැලි සංවර්ධන වැඩසටහන දක්වා දිව යයි. සිවිල් යුද්ධය සහ 2004 සුනාමිය ද මඩකලපුව දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීත්වය වැඩි කිරීමට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. මේ ප්‍රධාන සිදුවීම් සිවිල් සමාජ සංවිධාන මෙම ප්‍රදේශයට ඇතුළු වීමට සහ වර්ධනය වීමට හේතු වූ නමුත්, තරුණ ක්‍රිස්තියානි සංගමය වැනි ආගම පදනම් වූ සංවිධාන සහ සූරිය මල් ව්‍යාපාරය වැනි දේශපාලන සිවිල් සමාජ සංවිධාන පිහිටුවන ලද්දේ යටත්විජිත කාලය තුළ බව ද සඳහන් කළ යුතුය. එබැවින් සිවිල් සමාජ සංවිධාන සමඟ ශ්‍රී ලංකාවටම ඉතා දිගු ඉතිහාසයක් ඇත.

ඇතැම් ප්‍රදේශවල සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීත්වය ඉතාමත් අඩුවීමට ද මේ හේතුවම බලපා තිබේ. ගුණාත්මක පර්යේෂණයේදී අප සම්මුඛ සාකච්ඡාවට ලක් කළ ඇතැම් සිවිල් සමාජ සංවිධාන සඳහන් කළේ විදේශ මුදල් යෙ-ාදමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බැවින් අතීතයේදී එම ප්‍රජාවන් රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි එදිරි වූ බවයි (ඩෙවොටා, 2005). මේ වනවිට මෙම අදහස මඩකලපුවේ වෙනස් වී ඇතත් දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල මෙය තවමත් ඇත. එය ද සිවිල් සමාජ සංවිධාන විවිධ ප්‍රදේශවල ක්‍රියාත්මක වන අන්දම කෙරෙහි බලපෑමක් ඇති කරයි. මේ සියල්ල සැලකිල්ලට ගත් කල, මෙම පර්යේෂණය තවත් ඉදිරි පර්යේෂණ කටයුතු ආරම්භ කිරීම සඳහා පදනමක් සලසාලයි.

# ග්‍රන්ථ නාමාවලිය


- ADB, 2013. Civil Society Briefs: Sri Lanka, Manila: Asian Development Bank.
- ADB, 2022. Working Together for Development Results: Lessons from ADB and Civil Society Organization Engagement in South Asia. Philippines: Asian Development Bank.
- Al-Dawoody, A. & Finegan, O., 2020. COVID-19 and Islamic burial laws: safeguarding dignity of the dead. [Online]
- Available at: https://blogs.icrc.org/law-and-policy/2020/04/30/covid-19-islamic-burial-laws/
- [Accessed 23 05 2023].
- Alexander, D., 2015. Disaster and emergency planning for preparedness, response and recovery, Oxford: Oxford research encyclopedia of natural hazard science.
- Carmen, A.-C. & Tegal, M., 2021. The Case of Forced Cremations in Sri Lanka. [Online]
- Available at: https://www.fairobserver.com/region/central_south_asia/carmen-aguilera-carnerero-megara-tegal-sri-lanka-cremation-sri-lankan-muslims-islamophobia-world-news-74230/
- [Accessed 23 05 2023].
- Daily Mirror, 2018. No infertility tablets in western medicine: Health DG. Colombo: The Daily Mirror.
- Department of Census and Statistics, 2033. Department of Census and Statistics. [Online]
- Available at: http://www.statistics.gov.lk/
- Devotta, N., 2005. Civil Society and Non-Governmental Organisations in Sri Lanka: Peacemakers or Parasites?. Civil Wars, 7(2), pp. 171-182.
- Fernando, R., 2021. Violence against women: COVID-19 breakout sees surge in domestic violence both here and globally, Sri Lanka: The Sunday Times.
- Fernando, U., 2003. NGOs in Sri Lanka: Past and Present Trends. Sri Lanka: Wasala Publications.
- Goonatilake, S., 2006. Recolonisation: Foreign Funded NGOs in Sri Lanka. New Delhi: Sage Publications.
- Gunatilleke, G., 2021. Reframing the Debate: The State & Disinformation in Sri Lanka. [Online]
- Available at: https://blogs.lse.ac.uk/southasia/2021/12/06/reframing-the-debate-the-state-disinformation-in-sri-lanka/
- [Accessed 23 05 2023].
- Gupta, K., 2022. Sri Lanka aims for food security after ill-fated fertilizer ban. [Online]
- Available at: https://asia.nikkei.com/Spotlight/Sri-Lanka-crisis/Sri-Lanka-aims-for-food-security-after-ill-fated-fertilizer-ban
- [Accessed 22 March 2023].
- Jayasinghe, R., 2007. Civil society organisations in Sri Lanka: Their strengths and weaknesses. Modern Sri Lanka Studies, II(2).

- Jayasinghe, U. & Ghoshal, D., 2022. Fertiliser ban decimates Sri Lankan crops as government popularity ebbs. [Online]
- Available at: https://www.reuters.com/markets/commodities/fertiliser-ban-decimates-sri-lankan-crops-government-popularity-ebbs-2022-03-03/
- [Accessed 22 March 2023].
- Jayawardana, S., 2018. Manhunt intensifies for Ampara suspects after pill turns to flour. Colombo: The Sunday Times.
- MENAFN, 2018. Infertility pills don't exist, says World Health Organization. MENA: MENAFN.
- Mendis, B. D., 2021. Prof .Vandana Shiva hails Lanka's decision to ban chemical fertilizer. [Online]
- Available at: https://dailynews.lk/2021/06/09/local/251203/prof-vandana-shiva-hails-lanka%E2%80%99s-decision-ban-chemical-fertilizer
- [Accessed 22 March 2023].
- OECD, 2009. Findings, Recommendations and Good Practice. Ukraine: OCED Publishing.
- Orjuela, C., 2005. Dilemmas of Civil Society Aid: Donors, NGOs and the Quest for Peace in Sri Lanka. Peace and Democracy in South Asia , 1(1), pp. 1-12.
- Orjuela, C., 2008. The Identity Politics of Peacebuilding: Civil Society in War-torn Sri Lanka. 1 ed. India: Sage Publications India.
- Parkin, B. & Ratnaweera, M., 2022. Sri Lanka farmers count the cost of government fertiliser ban. [Online]
- Available at: https://www.ft.com/content/27a4fa03-74d7-409a-89e6-0f0391786c3e
- [Accessed 22 March 2013].
- Rasheed, Z. & Kuruwita, R., 2022. Sri Lanka faces 'man-made' food crisis as farmers stop planting. [Online]
- Available at: https://www.aljazeera.com/news/2022/5/18/a-food-crisis-looms-in-sri-lanka-as-farmers-give-up-on-planting
- [Accessed 22 March 2023].
- Sunday Observer, 2018. Tension in Ampara after fake 'sterilization pills' controversy. [Online]
- Available at: https://www.sundayobserver.lk/2018/03/04/news/tension-ampara-after-fake-%E2%80%98sterilization-pills%E2%80%99-controversy
- [Accessed 23 05 2023].
- The Sunday Times, 2018. More than 200 Lankan doctors say there's no 'wanda pethi'. [Online]
- Available at: https://www.sundaytimes.lk/180311/news/more-than-200-lankan-doctors-say-theres-no-wanda-pethi-285547.html
- [Accessed 23 05 2023].
- Tyubee, B., 2020. Disaster Preparedness: Approaches and Frameworks. Nigeria, Benue State University Makurdi.
- UN/IDSR & UN/OCHA, 2008. Disaster preparedness for effective response guidance and indicators package for implementing priority five of the Hyogo framework, Geneva, Switzerland: United Nations secretariat of the International Strategy for Disaster Reduction (UNISDR) and the United Nations Office for Coordination of Humanitarian Affairs (UNIOCHA).

- UNFPA, 2018. UNFPA & WHO: Joint Media Statement. [Online]
- Available at: https://srilanka.unfpa.org/en/news/unfpa-who-joint-media-statement
- [Accessed 23 05 2023].
- UNFPA, 2020. Bringing the shadow pandemic to light. [Online]
- Available at: https://srilanka.unfpa.org/en/news/bringing-shadow-pandemic-light
- [Accessed 10 05 2023].
- UN, n.d. United Nations. [Online]
- Available at: https://www.un.org/en/civil-society/page/about-us#:~:text=A%20civil%20society%20organization%20(CSO,local%2C%20national%20or%20international%20level.
- [Accessed 16 March 2023].
- USAID, 2021. Sri Lanka Civil Society: Sector Formative Evaluation, s.l.: USAID.
- Verite, 2022. 2021 Civil Society Organization Sustainability Index, Colombo: Verite.
- Wickramasinghe, N., 2001. Civil Society in Sri Lanka: New Circles of Power. 1 ed. New Delhi: Sage Publications.
- Wijedasa, N., 2022. 'God and prayers of predominantly Sinhalese patients protected me'. [Online]
- Available at: https://www.sundaytimes.lk/220123/news/god-and-prayers-of-predominantly-sinhalese-patients-protected-me-469799.html
- [Accessed 23 05 2023].
- Young, N., 2022. Sri Lanka's fertiliser ban and why New Zealand can phase out synthetic nitrogen fertiliser. [Online]
- Available at: https://www.greenpeace.org/aotearoa/story/on-sri-lankas-fertiliser-ban/#:~:text=The%20botched%20Sri%20Lankan%20fertiliser,all%20synthetic%20fertilisers%20and%20pesticides.
- [Accessed 22 March 2023].

# ඇමුණුම I: සමීක්ෂණ ප්‍රශ්නාවලිය

## අනපේක්ෂිත/හදිසි ප්‍රචණ්ඩත්වයට අදාළ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන මුහුණ දෙන අභියෝග

1 කොටස

I. ඔබේ සංවිධානය ස්ථාපිත කළේ කවදා ද?
II. ඔබේ සමාගමට ප්‍රධාන කාර්යාලයක් හෝ වෙනත් භෞතික ස්ථානයක් තිබේ නම්, එම කාර්යාලය පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයේ ද?
(එවැනි කාර්යාලයක් නොමැති නම් (N/A) යනුවෙන් ප්‍රතිචාර දක්වන්න. )

2 කොටස

සමීක්ෂණ ප්‍රශ්න

ප්‍රශ්නවලට ඔබේ පිළිතුරු නිර්නාමිකව බෙදා ගන්නා බව කරුණාවෙන් සලකන්න.

ඔබ සපයන ප්‍රතිචාර ඔබේ සමාගමේ නමින් හෝ ඔබේ සමාගම පහසුවෙන් හඳුනාගත හැකි වෙනත් කිසිම ආකාරයකින් සම්බන්ධ නොවේ.

3.1- (ඔබේ ප්‍රධාන ස්ථානය හැර) ඔබ මින් පෙර සහ දැනට ව්‍යාපෘති/වැඩසටහන්/ක්ෂේත්‍ර කටයුතු සිදු කරමින් සිටින දිස්ත්‍රික්ක තෝරන්න.
අදාළ සියල්ල සලකුණු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ |
| නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය |
| කිලිනොච්චිය | මන්නාරම | වවුනියාව | මුලතිව් | මඩකලපුව |
| අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුරය |
| පොළොන්නරුව | බදුල්ල | මොනරාගල | රත්නපුර | කෑගල්ල |
| ඉහත සියල්ල ම | | | | |

4. 2-ඔබේ කාර්යයන් හි ප්‍රධාන ක්ෂේත්‍ර මොනවා ද?
අදාළ සියල්ල සලකුණු කරන්න.

කාන්තාවන් සහ ගැහැණු දරුවන්
දරිද්‍රතාවය
ආර්ථික සංවර්ධනය
පරිසරය (ස්වාභාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද විපත්)
තෙවන ලිංගිකත්වය
ශාරීරික ආබාධ
කුලය
ආගමික/වාර්ගික සුළු ජාතීන්ගේ ගැටළු
ළමා / තරුණ
අනිකුත්

5.3-ඔබේ සංවිධානය කුමන ආකාරයේ ක්‍රියාකාරකම් සිදු කරන්නේ ද?
අදාළ සියල්ල සලකුණු කරන්න.

සහන (උදා: අරමුදල්, ආහාර, ඇඳුම් පැළඳුම් ආදිය)
පර්යේෂණ/වාර්තා
ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති
තිරසාර ව්‍යාපෘති
කෘෂිකාර්මික ව්‍යාපෘති
අධ්‍යාපනය
දැනුවත් කිරීමේ ව්‍යාපෘති
අනිකුත්

6.4- ඔබට මෙම ව්‍යාපෘති සඳහා අරමුදල් ලැබී තිබේ ද නැතහොත් ඒවා අරමුදල් රහිත/ස්වේච්ඡාවෙන් සිදු කරන කාර්යයන් ද ?
අදාළ සියල්ල සලකුණු කරන්න.

සියලුම ව්‍යාපෘති සඳහා 100% අරමුදල් සපයයි
සියලුම වැඩසටහන් ස්වේච්ඡාවෙන් සිදු කෙරේ
සමහර ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන අතර අනෙක් ඒවා ස්වේච්ඡා පදනම මත සිදු කෙරේ
අනිකුත්

7.5- ඔබේ සමාගම පසුගිය වසර 2 තුළ ව්‍යාපෘති කීයක් සම්පූර්ණ කර හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත්වී තිබේද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

ව්‍යාපෘති 1-5ක්
ව්‍යාපෘති 6-10ක්
ව්‍යාපෘති 11-15ක්
ව්‍යාපෘති 16-20ක්
ව්‍යාපෘති 21ක් හෝ වැඩි ගණනක්

8. 6- මෙම ව්‍යාපෘතිවලින් කොපමන ප්‍රමාණයක කාලය මාස හයට වඩා අඩු ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

25% හෝ ඊට අඩු
26% සිට 50% දක්වා
51% සිට 70% දක්වා
76% හෝ ඊට වැඩි

9. 7- මෙම ව්‍යාපෘතිවලින් කොපමන ප්‍රමාණයක කාලය මාසයක සිට මාස හයක් දක්වා වන්නේ ද ?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

25% හෝ ඊට අඩු
26% සිට 50% දක්වා
51% සිට 70% දක්වා
76% හෝ ඊට වැඩි

10.8- මෙම ව්‍යාපෘතිවලින් කොපමන ප්‍රමාණයක කාලය මාස හයක සිට වසරක් දක්වා වන්නේ ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

25% හෝ ඊට අඩු
26% සිට 50% දක්වා
51% සිට 70% දක්වා
76% හෝ ඊට වැඩි

11.9- මෙම ව්‍යාපෘතිවලින් කොපමන ප්‍රමාණයක කාලය වසරකට වඩා වැඩි වන්නේ ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

25% හෝ ඊට අඩු
26% සිට 50% දක්වා
51% සිට 70% දක්වා
76% හෝ ඊට වැඩි

12.10-මෙම ව්‍යාපෘති/වැඩසටහන් සිදු කිරීමේ දී ඔබ මුහුණ දුන් අභියෝග මොනවා ද?
අදාළ සියල්ල සලකුණු කරන්න.

ප්‍රජා / මහජන විරෝධය
ප්‍රජා /මහජන උදාසීනත්වය
රජයෙන් සහයෝගයක් නොලැබීම
රාජ්‍ය නිලධාරිවාදය
රජයේ පීඩාකාරී මැදිහත්වීම
නුසුදුසු පාරිසරික තත්ත්වයන්
කාර්ය මණ්ඩල හිඟය
සීමිත සම්පත්
සීමිත හැකියා / කුසලතා / දැනුම
රජයේ සම්පත් සහ/හෝ ආධාර යාන්ත්‍රණයක හිඟකම
අනිකුත්

13.11-ඔබ ඒවා ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරන වන විට රජය (අමාත්‍යාංශ මට්ටමින්) සහයෝගය ලබා දුන්නේ ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

කිසි දිනක සහයෝගය දී නොමැත
1
2
3
4
5
සෑම විටම සහයෝගය දී ඇත

14. 12- ඔබ ඒවා ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරන වන විට රජය (පළාත් පාලන ආයතන මට්ටමින්) සහයෝගය ලබා දුන්නේ ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

කිසි දිනක සහයෝගය දී නොමැත
1
2
3
4
5
සෑම විටම සහයෝගය දී ඇත

15. 13 - ඔබ ඒවා ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරන විට, ඔබ සමග වැඩ කරන මහජනතාව හෝ ප්‍රජා කණ්ඩායම් සාමාන්‍යයෙන් ඒවා පිළිගෙන ඇති බව ඔබ පවසන්නේ ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න.

කිසි දිනක සහයෝගය දී නොමැත
1
2
3
4
5
සෑම විටම සහයෝගය දී ඇත

16. 14- ඔබ කාන්තාවන් සහ ගැහැණු දරුවන් පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නම්, ඔවුන් වෙනුවෙන් ම විශේෂයෙන් නිර්මාණය කර ඇති ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී අත් විඳින අභියෝග මොනවා ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න

A- ඉලක්ක කණ්ඩායමෙන් විරෝධතා
B-සමාජයෙන් විරෝධතා
C-පිරිමින්ගෙන් විරෝධතා
D-රජයෙන් විරෝධතා
E-කාන්තාවන් හා ගැහැණු දරුවන් පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා නොකරයි

17.15-ඔබේ සංවිධානය කවදා හෝ

A-මුහුණ දුන් අභියෝග හේතුවෙන් ව්‍යාපෘතියක් අත්හැර දැමී ය (උදා: මැඩ පැවැත්වීමට නොහැකි )
B- ව්‍යාපෘතියක් නවතා දමා ඇත
C- අභියෝගවලට අනුගත වෙමින් (ආරම්භ කිරීමෙන් පසු හෝ අතරමගදී ) ව්‍යාපෘතියක් වෙනස් කර ඇත
D- අභියෝග නොතකා සෑම ව්‍යාපෘතියක් ම මුල දී සැලසුම් කළ පරිදි අවසන් කර ඇත
E-අනිකුත්

18. 16- අනපේක්ෂිත හෝ හදිසි ප්‍රචණ්ඩත්වයට අදාළ ගැටළු සම්බන්ධයෙන් ඔබ ක්‍රියා කරන්නේ ද? ¤උදා: පාස්කු බෝම්බ ප්‍රහාරය, ස්වභාවික විපත්, කෝලාහල, අපයෝජනය, මිනීමැරුම් ආදිය%
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න

A- ඔව්
B-නැත

19.17- ඔබ ඉහත ප්‍රශ්නයට "ඔව්" යනුවෙන් පිළිතුරු දුන්නේ නම්, කරුණාකර පසුගිය වසර 5 තුළින් උදාහරණ කිහිපයක් ලැයිස්තු ගත කළ හැකි ද? කරුණාකර 1, 2, 3 ලෙස කරුණු වශයෙන් සඳහන් කරන්න

20.18- ව්‍යාපෘතිය/වැඩසටහන සැලසුම් කිරීමේ දී මෙම කණ්ඩායම් ප්‍රධාන ඉලක්කයක් නොවූවත්, අන-පේක්ෂිත හෝ හදිසි ප්‍රචණ්ඩත්වයට අදාළ ව්‍යාපෘති/වැඩසටහන් කාන්තාවන්ට හෝ ගැහැණු දරුවන්ට සහාය දීමට /ආධාර කිරීමට මැදිහත් වී තිබේ ද?
එක් ඕවලයක් පමණක් සලකුණු කරන්න

A- සැමවිටම
B- සමහර විට
C-කිසි දිනක නැත

21.19-ව්‍යාපෘති/වැඩසටහන් සැලසුම් කිරීමේ දී ඔබ සෑම විටම සලකා බලනු ලබන්නේ හෝ ප්‍රමුඛත්වය දෙන්නේ පහත සඳහන් දේවල්වලින් කුමකට ද?

A- කාන්තාවන්ගේ සහ ගැහැණු දරුවන්ගේ අවශ්‍යතා
B-තෙවන ලිංගිකත්ව පුද්ගල අවශ්‍යතා
C-වැඩිහිටි අවශ්‍යතා
D-ආබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතා
E- පහත් කුලවල ප්‍රජාවන්ගේ අවශ්‍යතා
F- ආගමික සහ/හෝ වාර්ගික සුළු ජාතීන්ගේ අවශ්‍යතා
G-අනිකුත්

22.19.1 මෙම සමීක්ෂණයේ දීර්ඝ කිරීමක් ලෙස වඩාත් සවිස්තරාත්මක සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඔබව සම්බන්ධ කර ගත හැකි ද? කැමති නම් කරුණාකර ඔබගේ නම සඳහන් කරන්න (මෙය කිසිවෙකු සමඟ බෙදා නොගන්නා අතර සපයන ඕනෑම තොරතුරක් නිර්නාමිකව සපයනු ලබයි ).

22.19.2 කරුණාකර ඔබේ සංවිධානයේ නම සඳහන් කරන්න (අවසාන වාර්තාවේ නම් ප්‍රකාශයට පත් නොකෙරේ)

24. 19.3 ඔබ සම්මුඛ පරීක්ෂණයක් සඳහා සම්බන්ධ වීමට කැමති නම් කරුණාකර දුරකථන අංකයක් සපයන්න

25. 19.4 කරුණාකර ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුලත් කරන්න



නීතිය හා සමාජ භාරය,
03, කිංසි ටෙරස්, කොළඹ 08
දුරකතන : 94 11 2684845 | 94 11 2691228 | 94 11 2684853
ෆැක්ස් : 94 11 2686843
ඊමේල් : info@lstlanka.org
වෙබ් : https://www.lstlanka.org

ISBN 978-624-5545-21-6